# محرمات استهان بها كثير من الناس

# මිනිසුනේ! මේවායින් ඉවත් වන්න

# මිනිසුනේ! මේවායින් ඉවත් වන්න

මුහම්මද් සාලිහ් අල් මුනජ්ජිද්

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විතවූ අල්ලාහ්ගේ නාමයෙන්

## පෙරවදන

පැසසුම් සියල්ල සර්ව ඥාන අල්ලාහ්ට අයත් වේ. ඔහු ප්රශංසා කර ඔහුගෙන් ම සහය පතා සිටිමු.අප පාප ක්රියාවන් හට ඔහුගෙන්ම පව් සමා අයදිමු. පව් සහ නින්දිත ක්රියාවන් හට ලක් නොවී සිටීමට ද ඔහුගෙන් ම සහාය පතමු. කරුණාබර අල්ලාහ් පෙන්වන යහමග කවරෙකුට ලැබෙන්නේ ද, හෙතෙම නොමග යැවීමට කිසිවෙකුට කල නො හැකිය. එමෙන් ම අල්ලාහ්ගේ යහමග කවරෙකුට නො ලැබෙන්නේ ද ඒ තැනැත්තා යහමග කිරීමට කිසිවකුට කළ නොහැක. තවද වැඳීමට සුදුසු එකම

සත්‍ය දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවත්, මුහම්මද් නබි (සල්) තුමා අල්ලාහ්ගේ කීකරු අන්වැසියා සහ අවසාන වක්තෘවරයා බවත් මම සාක්ෂි දරමි.

මේ සියල්ලට පසු:

අල්ලාහු සුබ්හානහු වතආලා කිසිවිටෙක උදාසීන කර ඉවත් කළ නොයුතු සමහර යුතුකම්ද,

කටයුතු කිරීමේදී සීමාව ඉක්මවා නොයායුතු සමහර සීමාවන්ද, කිසිසේත් සමීප නොවිය යුතු සමහර හරාම්ද මිනිසාට කිසිදු සැකයෙන් තොරව විස්තර කර පැහැදිලි කර දී ඇත.

කිසි විටෙක කිසිවෙකුට ඒවා අත්තනෝමතිකව නොකර සිටීමට හෝ හිතමතේ පැහැර හැරීමට හෝ නොහැකිය. නබි තුමාණෝ (එතුමා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදා වේවා!) මෙසේ පැවසූහ.

ما أحلَّ الله في كتابه فهو حلال، وما حرَّم فهو حرام، وما سكت عنه فهو عافية فاقبلوا من الله العافية، فإن الله لم يكن نسيًّا

මුහම්මද් නබි (සල්) තුමා 'අල්ලාහ් තම දහමේ කුමක් හලාල් යැයි දැනුම් දී ඇත්ද, ඒවා හලාල් වේ. කුමක් හරාම් යැයි පවසා දී ඇත්ද, ඒවා හරාම් වේ. කුමක් විස්තර නොකර නිශ්ශබ්දව සිටීද, ඒවා සමාව ලද ඒවා වේ. එහෙයින් ඒවා පිළිගන්න. නමුදු විස්තර නොකර නිශ්ශබ්දව පසු වන දේ, සර්වඥාන අල්ලාහ් ඒවා අමතක වීමකින් අන් හැරියා යැයි නොසිතන්න"

යනුවෙන් දේශනා කර මතු සඳහන් අල්කුර් ආන් වැකිය ද පාරායන කර පෙන්වූහ.

وما كان ربك نسيا

'ඔබ හිමි කිසිවක් අමතක නොකරන්නේය' (අල්කුර්ආන් 19 : 64) (මූලාශ්‍රය : හාකිම්) එසේම අල්කුර්ආනය තුලින් සහ අල්ලාහ්ගේ අනුදැනුම සහ ආඥාව මත මුහම්මද් නබි (සල්) තුමාගේ දෙසුම් තුලින් තහනම් කළ

දේ අල්ලාහ් විසින් සීමා කළ ඒවාය. ඒ ගැන මතු සඳහන් අල්කුර්ආන් වැකිය මෙසේ විස්තර කරයි :

وَمَن يَتَعَدَّ حُدُودَ اللَّهِ فَقَدْ ظَلَمَ نَفْسَهُ

යමෙක් අල්ලාහ්ගෙ සීමාව ඉක්මවන්නේ ද ඔහු තමන්ටම වරද කරගත්තේය.

(අල් කුර්ආන් 65 :1) لا توجد ترجمة සුවිශුද්ධයාණෝ පවසා ඇත.

(وَمَن يَعْصِ اللهَ وَرَسُولَهُ وَيَتَعَدَّ حُدُودَهُ يُدْخِلْهُ نَارًا خَالِدًا فِيهَا وَلَهُ عَذَابٌ مُّهِينٌ

'යමෙකු (මේ දැහී) අල්ලාහ්ට සහ ඔහුගේ රසූල්වරයාට අකීකරුැ වී (අල්ලාහ් වන) ඔහුගේ (නිරණය කළ) සීමා වන් ඉක්ම වන්නේ නම් ඔහු (සදාකල්හී) එහි වනු පිණිස නිරයේ ගින්නෙහි ඇතුල් කරනු ලබනු ඇත. තවද නින්දනීය වද වේදනාවද ඔහුට එහි වේ'. සූරත් අන්නිසා : 14 තවද එවැනි දරදඬු අඬුවමෙන් වළකිනු වස් මුහම්මද් තුමාගේ අනුශාසනාව පරිදි අල්ලාහ් විසින්

තහනම් කරන ලද දේ වෙතින් ඉවත්වී කටයුතු කිරීම අපගේ පරම යුතුකමකි. මතු සඳහන් මුහම්මද් තුමාගේ මුදු වදනද එය මැනවින් ඔප්පු කරයි. 'ඔබට ඉවත් වන්න යි අණ කළ දෙයින් ඉවත් වන්න. තවද, හැකි අයුරින් මබට අණ කළ දේ පමණක් කරන්න. (මූලාශය : මුස්ලිම්) නම සිතට වහල් වී අන්තනෝමතිකව කටයුතු කරන අයද, ඊමාන්හී මනා දැනුමක් නැති අයද, ඉස්ලාම් දහමේ හලාල් සහ හරාම් ගැන ස්ථිරසාර දැනුමක් නැති අයද, ඉස්ලාම් දහම විධායකව තහනම් කළ දේ ගැන අඛණ්ඩව සවන් දෙන කල, මේවා සියල්ල හරාම් කළ ඒවාද? නොකළ යුතු යැයි අල්ලාහ් දෙවිඳු විසින් අපට තහනම් කළ ඒවාද? මෙසේ සියලු දේ තහනම් කර අපගේ ජීවිතය සම්පූර්ණයෙන්ම කළකිරීමකට පත්කර අපගේ සිත් අපහසු තත්ත්වයකට පත් කරනවා නොවේද? ඔබලා මෙසේ හරාම් යැයි

පවසන දේ හැරෙන්න අන් කිසිවක් දෙවිඳුගෙන් ලබා ගත්තේ නැත්ද? යනුවෙන් චිත්ත දෝෂ්යයන් පසුතැවිලි වෙති. නමුදු ඉස්ලාම් දහම පහසු, සරල, පුළුල් අර්ථාන්විත පරමාධිපත්ය නීති මාලාවකින් හෙබී දහමකි. එහෙයින් දයාන්විත අල්ලාහ් දෙවිඳු මිනිසා කරන අකුසල් ක්රියාවන්යා හට පව්සමා දීමට කරුණාබරව සූදානම්ව සිටී මෙසේ චිත්ත දෝෂයෙන් කලකිරීමෙකින් පසුවන ඔවුන්ට අප මෙසේ කීමට බලා පොරොත්තු වෙමු. අති උත්තම අල්ලාහ් දෙව්දු තමා ප්රිය වන දේ නීතිමය කර අනුමත කරයි. ඒ ගැන ප්රශ්ණ කිරීමට කිසිවෙකුට කිසිදු අයිතියක් නැත.

فهو يُحِلُّ ما يشاء ويُحرِّم ما يشاء سبحانه،

එහෙයින් ඔහු ප්රිය වන දේ අනුමත කිරීමටද, මහුගේ මනාපය පරිදි තහනම් කිරීමටද මහුට සම්පූරණ අයිතියක් ඇත. සියලු දේ ගැන අනූන දැනුමක් සරවඥාන දෙව්දු අල්ලාහ් සතුව වේ. එහෙයින් ඔහු

අපට ආඥා කරන දේ ඒ විලසින්ම පිළිගැනීම වන්දනාමානයේ නීතිරීති වලට ඇතුලත් වූ කොන්දේසියකි. තවද ඔහු අණ පන වන ඒ පමාධිපත්‍ය නීතිරීතීන් ඔහුගේ තුමුල ඥානයට, දැනුමට, සහේතුකත්වයට අධාල ඒවාය. හුදෙක් නිරර්ථකව හෝ විහිළුවට හෝ ඔහු ඒ අණපනත් සකස් කර නැත. ඒ ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි:

(وَتَمَّتْ كَلِمَتُ رَبِّكَ صِدْقًا وَعَدْلاً لاَّ مُبَدِّلِ لِكَلِمَاتِهِ وَهُوَ السَّمِيعُ الْعَلِيمُ)

'තවද (නබි තුමනි) මබගේ දෙවිඳුගේ වදන් සත්‍ය යෙන්ද (ක්‍රියාවෙන්) යුක්තියෙන්ද පරිසමාප්තය. ඔහුගේ වදන් වෙනස් කරන්නෙක්ද නැත. ඔහු සියල්ල අසන්නේය. සියල්ල මනාව දන්නේය'. (අල්කුර්ආන් 6 : 115) තවද ඥානවන්ත අල්ලාහ්, හලාල් සහ හරාම් සීමා වන් සක්සුදක් සේ පැහැදිළි කර දී ඇත. ඒ ගැන කුර්ආනය මෙසේ විස්තර කරයි:

(وَيُحِلُّ لَهُمُ الطَّيِّبَاتِ وَيُحَرِّمُ عَلَيْهِمُ الْخَبَآئِثَ)

'හොඳ (පිරිසිදු දේ) මවුන්ට අනුමත කෙරේ. නරක (අපිරිසිදු) දෑය මවුන්ට (බුදීමට) තහනම් කෙරේ'. (7 : 157) මේ මැයෙන් බලන කල බොහෝ සෙයින් අනුමත වූ හොඳ දේ හලාල් ලෙසද, නරක අහිතකර දේ හරාම් ලෙසද සැළකිල්ලට ගත යුතුව ඇත. තවද යමක් අනුමත දෙයක් ලෙසද, තහනම් කළ දෙයක් ලෙසද කිරීම අල්ලාහ්ගේ අයිතිවාසිකමකි. යමෙක් ඒ අනුමැතිය තමාට හෝ අන් කෙනෙකුට හෝ ඇති බව පවසන්නේ නම් මහු ඉස්ලාම් දහමෙන් පිටවුනු කාෆිවරයෙකු ලෙස ගණන් ගැනේ. ඒ ගැන අල්ලාහ් අල්කුර්ආනයේ ප්රශ්ණ කර අනතුරු අඟවමින් මෙසේ විස්තර කරයි :

(أَمْ لَهُمْ شُرَكَاء شَرَعُوا لَهُم مِّنَ الدِّينِ مَا لَمْ يَأْذَن بِهِ اللَّهُ)

නොවන්නට අල්ලාහ් අනුමත නොකළ දෑය දහමයැයි අනුමත දෙන්නාවූ සමාන (දෙවි) යන් ඔවුන්ට සිටිනවාද? (අල්කුර්ආන් 42 : 21) තවද, අල්කුර්ආනය

මුහම්මද් තුමාගේ සුන්නා සහ සංකල්පය නිර්යාජව අධ්‍යයනය කර ඇත්තේ කවරෙක්ද, හලාල් සහ හරාම ගැන එඩිතරව කතා කිරීමට සුදුසු කම් ලබන්නේ ඔවුන් පමණී. ඒවා ගැන නොදැනුමෙන් මුග්ධව කතා කරන්නන්හට අල්ලාහ් තදින් අවවාද කර ඒ ගැන කුර ආනය මෙසේ විස්තර කරයි:

(وَلاَ تَقُولُواْ لِمَا تَصِفُ أَلْسِنَتُكُمُ الْكَذِبَ هَذَا حَلاَلٌ وَهَذَا حَرَامٌ لِّتَفْتَرُواْ عَلَى اللهِ الْكَذِبَ

'ඔබගේ දිව (සමහර සතුන් ගැන) බොරු ගොතනු සේ මෙය අනුමතය, මෙය තහනම් යැයි අල්ලාහ් මත බොරු ගොතා කීමෙන් වළකිනු'. (අල්කුර්ආන් 16 : 116) එහෙයින් මිනිසාට අනුමත කළ සහ හනම් කළ දේ ගැන අල්කුර්ආනය සහ නබි තුමාගේ සුන්නා සංකල්පය මනාව පැහැදිළි කර දී ඇත. ඒ කරුණ ගැන පරිශුද්ධ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

قُلْ تَعَالَوْاْ أَتْلُ مَا حَرَّمَ رَبُّكُمْ عَلَيْكُمْ أَلاَّ تُشْرِكُواْ بِهِ شَيْئًا وَبِالْوَالِدَيْنِ إِحْسَانًا وَلاَ تَقْتُلُواْ أَوْلاَدَكُم مِّنْ إمْلاَقٍ .. الآية

‘(නබි තුමනි, ඔබ ඔවුන් සමග) ‘පැමිණෙන්න. ඔබ කෙරෙහි ඔබ දෙවියා තහනම් කළ දේ (අනුමත කළ දේ කුමක්දැයි) මම කියා පාමියි' කියව. (ඒවායෙන් සමහරක්) ඔබලා (සර්වබලාධාරී දෙවියා වන) ඔහුට කිසිසේත් ආදේශ නොකරන්න. තවද, (ඔබගේ) දෙමාපියන්ට (කාරුණිකව) උවටැන් කරන්න. තවද දිළිඳුකම නිසා මබගේ ළදරුවන් ඝාතනය නොකරන්න (යනුවෙන් කියනු මැනව). සූරත් අල් අන්ආම් : 151 එසේම අල්ලාහ් දෙවිඳුගේ ආඥාව මත මුහම්මද් නබි (සල්) තුමාගේ සුන්නා සංකල්පය තුලින් ද ඉස්ලාම් දහම තහනම් කළ බොහෝ දේ ගැන පැහැදිළි කර ඇත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පවසා සිටියහ.

إن الله حرَّم بيع الخمر، والميتة، والخنزير، والأصنام

අල්ලාහ්, (ඔබට) මත්ද්‍රව්‍ය, මලකුණු, සුබර මාංශ සහ පිළිමයන් තහනම් කර

ඇත. (මූලාශ්‍රය : අබුදාවුද්) වරෙක මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූහ

إن الله إذا حرَّم شيئًا حرَّم ثمنه

තවද 'අල්ලාහ් යමක් ( නුසුදුසු යැයි ) තහනම් කළා නම් ඒ මගින් (වෙළදාම් කර) ලැබෙන මුදල්ද තහනම් කරන්නේය'. (මූලාශ්‍රය: ධාරකුත්නි) අල්ලාහ් දෙවිඳු ශුද්ධවූ අල්කුර්ආන් හි තවත් සමහර ස්ථානයන් හි තහනම් කරන ලද සමහර දේ පමණක් විස්තරාත්කව පවසා ඇත. ඉස්ලාම් දහම තහනම් කළ සමහර ආහාරයන් ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි :

حُرِّمَتْ عَلَيْكُمُ الْمَيْتَةُ وَالدَّمُ وَلَحْمُ الْخِنْزِيرِ وَمَا أُهِلَّ لِغَيْرِ اللهِ بِهِ وَالْمُنْخَنِقَةُ وَالْمَوْقُوذَةُ وَالْمُتَرَدِّيَةُ وَالنَّطِيحَةُ .. الآية

'(විශ්වාස වන්තයිනි. ඉබේ මැරුනු) මළකුණ ද, ලෙය ද, සූකර මාංශ ද, අල්ලාහ් හැර (කිසිදු සාධකයක් නැති දෙවියන් යැයි අමතන පිළිම වැනි) දෑ (නාමය) ආමන්ත්‍රණය කර සමර්පණය කර (මැරූ ) ඒවාද, බොටුව මිරිකා මරණ ලද

දැයද, ගසා මරණ ලද දැය ද, (ඉහළකින් පහළට) වැටී මළ දැය ද, අවයව වලින් (ඇන කොටා ගෙන) මළ දැයද, (සිංහ, වළස්සු සහ කොටි වැනි) වන සතුන් සපා කා (මළ)ඒවා ද ඔබට තහනම් කර ඇත. (අනුභවයට අනුමත දැහී) මබ කුමක් (එය සජීවීව දැක නිත්‍යානුකූලව අල්ලාහ්ගේ නාමය කියා) කැපුව දේ ඒ හැර, (අන් දේ ඔබට කා හැකිය). නමුදු අන් (දහම්වල ) වන්දනා මානයන් පිණිස (පිළිම සහ පිළිරූ වැනි) දෑ තබා ඇති ස්ථානයන්හී (කැප කර) කැපූ ඒවාද, ඊතල වලින් (විද) නිමිති සෙවීම ද (මබට තහනම් කරන ලදී)'. (අල් මාඉදා: 3) එසේම අල්ලාහ්, පිරිමියෙකු විවාහ වීමට නුසුදුසු තහනම් අය ගැන විස්තර කළ අල්කුර්ආනය තුලින් මෙසේ විස්තර කරයි

حُرِّمَتْ عَلَيْكُمْ أُمَّهَاتُكُمْ وَبَنَاتُكُمْ وَأَخَوَاتُكُمْ وَعَمَّاتُكُمْ وَخَالاَتُكُمْ وَبَنَاتُ الأَخِ وَبَنَاتُ الأُخْتِ وَأُمَّهَاتُكُمُ اللاَّتِي أَرْضَعْنَكُمْ وَأَخَوَاتُكُم مِّنَ الرَّضَاعَةِ .. الآيَة

'ඔබගේ මව්වරුන්ද, ඔබගේ දියණියන් ද, ඔබගේ පියාගේ සහෝදරියන්ද, ඔබගේ

මවගේ සහෝදරියන්ද, ඔබගේ සහෝදරයාගේ දුවරුන්ද, සහෝදරියගේ දුවරුන්ද, ඔබට (ළදරු වියේ) කිරි පෙවූ (කිරි) මව්වරුන්ද, (ඔබගේ මව හැර අන් කාන්තාවක් ඔබට ) කිරි පෙවීමෙන් වූ (ඒ කාන්තාවගේ දුවරුන් වන ඔබගේ) සහෝදරියන්ද, ඔබගේ බිරින්දෑවරුන්ගේ මව්වරුන්ද ඔබ (විවාහ වීමට) තහනම් (අය) වේ'. (අල්කුර්ආන් 4: 23) එසේම ඔබගේ ජීවන මග වන වෘත්තීන්හි, එහි තහනම් දේ ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි:

وأحل الله البيع وحرم الربا .. الآية

'තවද, අල්ලාහ් වෙළඳාම අනුමත කර පොලි ( කිරීම) (හරාම් යැයි) තහනම් කර ඇත'. (අල්කුර්ආන් 2 : 275) තවද අල්ලාහ් තම කීකරු අතවැසියන් කෙරෙහි තබා ඇති අප්‍රමාණ දයාලු බව නිසා යහපත් අප්‍රමාණ දෑ හලාල් යැයි අනුමත කර ඇත. එහෙයින් ඒවා ගැන අල්ලාහ් දෙව්දූ සවිස්තරව පවසා නැත. නමුදු හරාම් වූ

දේ වෙනුවෙන් එක්තරා සීමාවක් තිබෙණ හෙයින් මිනිසා ඒවා මනාව දැනගෙන අවබෝධ කරගෙන කටයුතු කළ යුතුව ඇත. ඒ ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි:

وَقَدْ فَصَّلَ لَكُم مَّا حَرَّمَ عَلَيْكُمْ إِلاَّ مَا اضْطُرِرْتُمْ إِلَيْهِ

නුඹලා බෙහෙවින් ම අසරණ වූ තත්ත්වයක මිස නුඹලාට (අනුභව කිරීමට) තහනම් කළ දෑ ගැන ඔහු අල්ලාහ් නියතවශයෙන් ම නුඹලාට පැහැදිලි කර දී තිබේ (අල්කුර්ආන් 6 : 119) නමුදු හලාල් නම් අනුමත දේ හී මිනිසාට අහිතකර නොවූ හොඳ පිරිසිදු දේ සියල්ල විස්තරයෙන් තොරව පොදුවේ අනුමත කර ඇත. ඒ ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි: මිනිසුනේ, පොළොවෙහි ඔබට (අනුභවයට) අනුමත කරන ලද පිරිසිදු (හොඳ) දැයින් අනුභව කරව. (අල්කුර් ආන් 2 : 168) තවද, හරාම් යැයි වැළැක්වූ දේ හැරෙ අන් සියලු දේ අනුමත කර තිබීම අල්ලාහ් දෙවිඳුගේ දයාලුවන්ත

කම සහ ඔහු තම අත්වැසියන් කෙරෙහි වූ විශාල සාදාරණත්වය සහ කාරුණිකත්වය මැනවින් විදහා දක්වයි. එහෙයින් ඔහුට ඉදුරාම කීකරු වී, ආඥාවන් පිළිගෙන, ඔහුට තුති පූර්වව කටයුතු කිරීම අපගේ පරම යුතුකමකි. තවද, හුදෙක් ඊමාන්හී ස්ථිරසාර නොවූ බෙලහීන, ආගම පවසන පරමාධිපත්ය ෂරීආ නීති ගැන මනා දැනු මක් නැති බොහෝ දනන්,ආගම මනා අන්දමින් පැහැදිළි කර ඇති හරාම් සම්බන්ධ නීතිරීති ගැන දැන ගත් කළ, ඒවාට බියවී සිත් තැවුලට පත්වෙති.

එහෙයින් මොවුන් ඉස්ලාම් දහම ලිහිල් සරල එකක් බවට පිළිගැනීමට, දහමේ අනුමත කළ දේ පමණක් කියා පැම ඇසීමට කැමැති වනවාද?

නොවන්නට හොඳ දේ පමණක් කියා පැමේදී ඉස්ලාම් තමන්ට පහසු සාදාරණ ජීවිතයක් සකස් කර දී ඇතැයි තෘප්තිමත් වීමට බලාපොරොත්තු වෙනවාද?

නොවන්නට ඔටුවන්, හරකුන්, එළුවන්, හාවුන්, මුවන්, කුකුළන්, පරවියන්, තාරාවන්, පාත්තයන් සහ පැස්බරුන් වැන්නන්ගේ මාංශ, මැරුණු පළගැටියන් සහ මත්සයන්ගේ මාංශ අනුභවයට අනුමැති යැයි කීම ගැන ප්‍රිය වෙනවාද?

එළවළු, එලා වර්ග, පළතුරු වර්ග, ධාන්‍ය සහ ඇට වර්ග, අනුභව කළ හැකි අනෙකුත් පළතුරු වර්ග,

ජලය, කිරි, මී පැණි, එළවළු තෙල් වර්ග, විනාකිරි වැනි දියරයන්,

ලූනු, තුනපහ සහ ව්‍යාංජන රසවත් කිරීමට යොදන ක්ෂණික තුණපහ මිශ්‍රණයන් වැනි කෑමට අනුමත සුදුසු ඒවා බව ඇසීමට පමණක් කැමැති වෙනවාද?

ලී, යකඩ, වැලි, ගල්, ප්ලාස්ටික්, කන්නාඩි, රබර්, සතුන් පිට නැග ගමන් කිරීම, වාහනවල, දුම්රියෙන්,

නැවෙන් සහ ගුවන්යානයෙන් ගමන් කිරීම අනුමත වේ යනුවෙන් කීම ඇසීමට බලාපොරොත්තු වෙනවාද?

තවද වායු සමීකරණ, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර, වියළන යන්ත්‍ර, ඇඹරුම් යන්ත්‍ර, පිටි වැනි දේ අනන යන්ත්‍ර, කුඩා කැබැලි වලට කපන. ලියන යන්ත්‍ර, යුෂ මිරිකන යන්ත්‍ර, වෛද්‍ය සහ කාර්මික උපකරණ, පරිගණක යන්ත්‍රයන්, මාලිමා උපකරණ, ගොඩනැගිලි උපකරණ, ඛනිජ ද්‍රව්‍ය සහ ඛනිජ දියර, පිරිපහදු කර පෙරන ලද ද්‍රව්‍ය, පැනි රස ගන්වන ද්‍රව්‍ය, මුද්‍රණ යන්ත්‍රයන්

කපු ඇඳුම්, සීතල ඇඳුම්, පට සේල, සත්ව මයිල් වලින් නිමවුනු ඇඳුම්, හම්, නයිලෝන්, පොලියෙස්ටර්,

විවාහ වීම, මිලයට ගැනීම සහ අලෙවිය, පැවරීම, කුලියට දීම, වඩු වැඩ, පෙදෙරේරු සහ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම වැනි වෘතීන් සහ එළු බැටළු පාලනය වැනි

අනෙකුත් සියලු දේ අනුමත යැයි කීම ඇසීමට සිතාව ප්රිය වෙනවාද?

මෙසේ අනුමත දේ ගැන පමණක් සඳහන් කරන්නේ නම් එයට සීමාවක් නොවනු ඇත.

ඔවුන් කරුණාබර දෙවිඳුන් විසින් අනුමත කරන ලද මෙවන් දේ ගැන මදක් සිතා නොබලන්නේ මන්ද?

ඉස්ලාම් දහම ලිහිල් පහසු සාදාරණ දහමක් වුවද ඔවුන් ඉස්ලාම් දහම වටහා ගෙන ඇත්තේ වැරදි ලෙසිනි.

මන්දයත් ඉස්ලාම් දහමේ ලිහිල පවතින්නේ මිනිසාගේ විවෘත සිතට හැඟෙන අන්දමින් සහ ඔවුන් වටහා ගෙන ඇති ලෙසින් නොව.ඉස්ලාම් දහම කුමක් නම් පරමාධිපත්ය නීතියට ඇතුල් කර ඇත්දෝ එය තුලින් ආගමේ ලිහිල වටහා ගත යුතුව ඇත.

ඉස්ලාම් දහම ලිහිල් පහසු දහමක් ලෙස පවසමින්, තහනම් කළ දේ කිරීමත්,

ලෙඩ රෝග වූ අවස්ථාවන්හී සහ ගමනේ යෙදී සිටින අවස්ථාවන්හී උපවාස ශීලයෙන් වැළකී සිටීමත්, බැරෑරුම් අවස්ථාවන්හී දහමේ වන්දනාමාන පිණිස ලිහිල් කර ඇති නැමදුම යාකර සහ කෙටි කර කිරීමත්, වුළු දෝවනය කරන විට මේස් මත නැවරීමත්, වූළු කිරීමට ජලය ප්‍රයෝජනය කිරීමට නොහැකි වූ විට හෝ පානීය ජලයේ උවමනාවට යෙන් පසින් තයම්මුම් කිරීමත්, ලෙඩ දාරානිපාත වර්ෂා වැනි අවස්ථාවන්හී සහ නැමදුම පිළිවෙළින් එක්කර කිරීමත්, විවාහ වන්නට සූදානම් වන්නා විවාහ වන්නට කතාබස් වූ කාන්තාව බැලීමත්, දිවරුම කඩ කළ නිසා ප්‍රාය වචිත්තයට වහලෙකු නිදහස් කිරීම, දුගීන්ට ආහාර සැපයීම සහ ඇඳුම් සැපයීමෙහිදී නම් සිත් සේ තෝරා ගෙන කටයුතු කිරීමත්, උවදුරු සහ බලකිරීමේ අවස්ථාවන් හිදී අනුභව කිරීමට අනුමත නොවූ මල සතුන්ගේ කුණපය වැනි දේ අනුභව කිරීම

වැනි අනෙකුත් බොහෝ අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම අතර ඇත්තේ අසීමිත පරතරයකි. පෙර සඳහන් කළ මෙැනි අනුමත දේ මෙන්ම, අනුමත නොකළ දේ, නොකළ යුතු දේ වැනි ඉස්ලාම් දහමේ අණ කිරීම තුල වැදගත් කරුණු රාශියක් අන්තර ගතව ඇති බව මුස්ලිම්වරයෙකු යෙහෙන් වටහා ගත යුතුය. සර්වඥාන අල්ලාහ් තම අතවැසියන් තම කටයුත්තන් හී කෙසේ කටයුතු කරනවාද යන්න පරීක්ෂණයට භාජනය කිරීම එයින් එකකි. එසේම අතවැසියන්ගෙන් ස්වර්ග වැසියන් කවරෙක්ද නිරයේ වැසියන් කවරෙක්ද යනුවෙන් බෙදා වෙන් කරයි. මන්දයත් නිරයේ වැසියා සැම මොහොතකම නිරයට ඇතුල් වන දේ කෙරෙහි සිත්සේ කටයුතු කරයි. නමුදු ස්වර්ග වැසියා සැම මොහොතකම ස්වර්ග වෙත යැම කෙරෙහි ප්‍රිය වී ජීවන මගේ තමාට ඇති

වන සියලු බාධකයන්හී ඉවසිලිවන්තව කටයුතු කරයි.

මිනිසුන් අතර මෙවන් ස්ථිර පරීක්ෂණයක් නොවන්නට දුදනන් සහ සුදනන් වෙන් කර වටහා ගැනීම අපහසු වනු ඇත.

සත්‍ය විශ්වාසවන්තයන් නිතර, තමන්ට ඇතිවන දුක්කරදරයන් අල්ලාහ් වෙනුවෙන් සහ මරණින් මතු ජීවිතයේදී ලැබිය හැකි සුවිපාක බලපොරොත්තුවෙන් ඉවසාගෙන ඒවා දමනය කර ගනු ඇත. එහෙයින් ඔවුන් තමන් මුහුණ පාන විවිධ දුෂ්කරයන් පවා ලිහිල් ලෙස පිළිගනිති.

නමුදු කුහකයන් තමන්ට අත්වන දුෂ්කරයන් දුකක්, කරදරයක් ලෙස සිතා කටයුතු කරන බැවින් ඔවුන්ට ඒවා දමනය කිරීමට හෝ ඉවසුමෙන් ඒවා පිළිගැනීමට හෝ නොහැකිව සිත් තැවුලට පත් වෙති.

තවද යමෙකු හරාම් වූ දෙයින් ඉවත් වී කටයුතු කරන කළ අල්ලාහ් ඔහුට එයට වඩා අගනා දේ පිළිගැන්වීමට සූදානම් වී සිටියි යන්න වටහා ගන්නේ නම් හෙතෙම සම්පූර්ණ සිත් සතුටක් ද ඊමාන්හී තාප්තියක් ද ලබන්නේය.

මෙම කුඩා අත් පොතේ වත්මන් මුස්ලිම් සමාජය තුල ාදාරණ යැයි අනුමත යැයි හැඟීමකින් බහුලව ව්යාප්ත වී ඇති සමහර දුදන ක්රියාවන් ගැන අල්කුර්ආනයේ සහ මුහම්මද් නබි (සල්) තුමාගේ සුන්නා සංකල්පයේ සාධක තුලින් පැහැදිලි කර දී ඇත්තෙමි. لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة

لا توجد ترجمة

තවද අල්ලාහ්ගේ යහමග සහ භාග්යය ලබා, ඉස්ලාම් දහම තහනම් කළ දෙයින් ඉවත් වී අල්ලාහ්ගේ ආඥාවන්ට මුළුමනින්ම කීකරු වී කටයුතු කිරීමේ අවස්ථාව මට ද අනෙකුත් ඉස්ලාමීය සහෝදරයින් හටද ලැබී, සර්වබල

අල්ලාහ්ගේ දයාවද කරුණාවද අපට ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

අල්ලාහ්ට ආදේශ කිරීම: ෂිරක් නම් අල්ලාහ්ට ආදේශ කිරීම තහනම අතින් ඉස්ලාම් දහමේ තහනම් කළ විශාලතම තහනමකි. මුහම්මද් නබි (සල්) තුමාගේ විස්තර කිරීමක් අබූ බක්ර තුමා මෙසේ සදහන් කරයි: නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහුඅලෛයිහි වසල්ලම්) මෙසේ පැවසූහ.

ألا أنبئكم بأكبر الكبائر (ثلاثًا) قالوا: قلنا: بلى يا رسول الله، قال: الإشراك بالله

නබි තුමා තම කළණ මිතුරන් අමනා විශාල පව ගැන මා ඔබට පවසන්නද?' යි තුන් වරක් නොකඩවා විමසන්නට වූහ. එයට කලණ මිතුරන් 'එසේය. නබි තුමනි, අපට පවසන්න ' යි උත්තර දුන් කළ 'අල්ලාහ්ට ආදේශ කිරීම' යනුවෙන් නබි තුමා පිළිවදන් දුන්හ. (මූලාශ්‍රය: බුහාරි සහ මුස්ලිම්).

ආදේශ කිරීම හැර අනවැසියෙකුගේ අන් සියලු පව් කරුණාබර අල්ලාහ් සමාවන්නේය. ඒ විශාල පව වන ආදේශ කිරීම තව්බා නම් පශ්චාත්තාප වී පව සමා අයැදීමෙන් මිස අල්ලාහ් පව සමා නොදෙන්නේය.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

إن الله لا يغفر أن يشرك به ويغفر ما دون ذلك لمن يشاء

සැබැවින්ම අල්ලාහ් ඔහුට ආදේශ කිරීම කිසිවිටෙක සමා නොකරන්නේය. එය හැර (අන් පව) ඔහු සිතූ අයට සමා කරන්නේය'. (සූරා අන්නිසා: 48)

මෙසේ ආදේශ කරන්නා ඉස්ලාමීය රාමුව තුළින් සම්පූර්නයෙන්ම පිට වූ කෙනෙකු ලෙස වන්නේය. එසේම මහු ආදේශ කළ අයෙකු විලසින් මරණයට පත්වීමෙන් පසු සදාකල්හීම නිරයේ පසු වන්නේය.

තවද වත්මනයේ මෙවැනි විවිධාකාර ආදේශ කිරීම්, බොහෝ මුස්ලිම් රටවල

බහුලව සිදුවෙයි. ඒවායෙන් සමහරක් ගැන අපි සංක්ෂිප්තව සළකා බලමු.

කබර (මිනිවල) වන්දනාමාන වත්මන් සමාජයේ බොහෝ දෙනෙකු, කවදාදෝ ජීවිත්යට පත් වූ සැදැහැවතුන් සහ උත්තමයන් තම උවමනා වන් ඉෂ්ටකර දෙනු ඇතැයි විශ්වාසකර පිළිගනිමින්, ඔවුන් මගින් උදව් පතා ප්රාර්ථනා කිරීමට හැකි යැයි විශ්වාස කරති.

ඔවුන්ගේ ඒ සිතුවිල්ල මුග්ධ එකක් බව අල්කුර් ආනය මෙසේ විස්තර කරයි :

وقضى ربك ألا تعبدوا إلا إياه

"අල්ලාහ් හැර වෙනත් දෙයක් නැමදීමෙන් වැලකෙන ලෙස ද දෙමව්පියන්ට ඉතා යහපත් අයුරින් සලකන ලෙස ද ඔබගේ පරමාධිපති අණ කොට ඇත." සූරත් අල්ඉස්රා -23 තවද, කවදාදෝ ජීවිතක්ෂයට පත්වූ වක්තෘවරුන් සහ ශ්රද්ධාවන්තයන් වැන්නන්ගෙන් පිටිවහල පතා තම දුක් ගැහැට සහ අනෙකුත් කරදර ඉවත් කර

ගැණීම පිණිස ප්රාර්ථනා කළ හැකි යැයි ඔවුන් විශ්වාස කරති. ඒ කරුණ අළලා අල්කුර ආනය මෙසේ විස්තර කරයි :

أمن يجيب المضطر إذا دعاه ويكشف السوء .. أإله مع الله

'දුඃඛිතයෙකු අමතන කල්හී (ඔහුට) පිළිවදන් දී ඔහුගේ ඒ දුකපහකර, ඔබ මිහිපිට උරුමක්කාරයන් ලෙස පත් කළේ කවරෙක්ද? (මෙවන් සත්ය දෙවිදු) අල්ලාහ් සමග (වන්දනයට සුදුසු තවත් දෙවියෙක් වේද? (27 : 62) තවත් සමහරු වාඩිවන කළද, නැගිටින කළද, ලිස්සී හෝ යමෙක හැප්පී හෝ වැටෙන කළද, දුක්කරදරයට පත්වන කළද අනෙකුත් අවස්ථාවලද, යා මුහම්මද්, යා අලී, යා හුසෙයින්, යා බදවි යා ජයිලානි, යා ෂාදුලි, යා රිෆායී, යා අයිදුරුස්, යා සෙයිනබ් යා ඉබ්නු අල්වාන් වැනි පෙර ජීවත්වී අපවත්වී ගිය අයගේ නම් ආමන්ත්රණය කරමින් විවිධ ලෙස පිහිට පතා අමනු දැකිය හැකිය. ඒවා සියල්ල ඉස්ලාම් දහම අනුමත කළ ඇමතුම් නොවන බව තරයේ

සිතේ තබා ගත යුතුය. ඒ කරුණ අළලා අල්කුර් ආනය මෙසේ විස්තර කරයි :

إِنَّ الَّذِينَ تَدْعُونَ مِن دُونِ اللهِ عِبَادٌ أَمْثَالُكُمْ فَادْعُوهُمْ فَلْيَسْتَجِيبُواْ لَكُمْ إِن كُنتُمْ صَادِقِينَ

'සැබැවින්ම, ඔබලා අල්ලාහ් හැර (දෙවිඳුන් යැයි) අමතන අය ඔබලා වැනි (අල්ලාහ්ගේ) වහල්ලුන්ය. (7 : 194) තවත් සමහරු, සමහර සැදැහැවතුන්ගේ සොහොන් වෙත ගොස් ඒවා වටා ප්‍රදක්ෂිණා කරමින්, ඒවායේ මුල් සහ කොන් අතගා ඉඹිමින්, අනුග්‍රහයක් ඇතැයි සිතා එහි වැලි සහ දුවිලි ගෙන මුහුණේ දේහයේ තවරා ගනිමින් ඒවා ඉදිරිපිට ගරුසරුව සිට ශාෂ්ඨාංග කරමින්, රෝග නිවාරණ, දරු සම්පත ලැබීම සහ තම උවමනාවන් ඉටු වීම වැනි දේ ගැන උද පතනු අප දැක ඇත්තෙමු. තම උවමනාවන් සිතේ මතක් කර ගෙන ඒවා සපල වනු වස් ' මෙහි වැඩ වසන අසවල් අසවල් සමිඳුනේ, සාත්තු වරයානි. අව්ලියා තෙම යනුවෙන් බැති සිතින් ප්‍රාර්ථනා කරති. ඒවා සියල්ල අල්ලාහ්ට

ආදේශ තබන නුසුදුසු ඇමතීම් වේ. ඒ ගැන අල්කුර ආනය මෙසේ විස්තර කරයි:

وَمَنْ أَضَلُّ مِمَّن يَدْعُو مِن دُونِ اللَّهِ مَن لَّا يَسْتَجِيبُ لَهُ إِلَى يَوْمِ الْقِيَامَةِ وَهُمْ عَن دُعَائِهِمْ غَافِلُونَ

'තවද අල්ලාහ් හැර, පරමාන්ත දිනය දක්වා (අමැතුවද) තමාට පිළිවදන් නොදෙන (අල්ලාහ් හැර අන්) දැය අමතන්නන්ට වඩා (තවත්) නොමග ගියවුන් වේද? (අමතන්නන්) තමන් අමතන බව පවා ඔවුන්ට වටහාගත නොහැකිය'. (අල්කුර්ආන් 46: 05) නියත වශයෙන්ම නබිවරයාණන් (එතුමා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදාවේවා) එතුමාණන් මෙසේ පැවසූහ

من مات وهو يدعو من دون الله ندا دخل النار

මෙවන් අල්ලාහ්ට ආදේශ කිරීම ගැන මුහම්මද් තුමා වරෙක අනතුරු අඟවමින් දෙසූහ: 'අල්ලාහ්ට ආදේශ කරමින් මරණයට පත්වන්නේ තවරෙක්ද, ඔහු නිරයට ඇතුල් වන්නේය'

(මූලාශ්‍රය : බුහාරි සහ මුස්ලිම්). තවත් සමහරු බැති සිතින් ඒවා වෙත ගොස් හිස බූගැම සහ ඒවා අසල තම නම් ලියා තැබීම වැනි ඉස්ලාම් දහම කිසි විටෙක අනුමත නොකළ බොහෝ දේ කරති. لا توجد الترجمة තවත් සමහරු, ලොව සියල්ල ක්‍රියා කරවන්නේ එවන් දේවගැත්තන් වන වලිවරුන් සහ සම්දුන් විසින් යයි පිළිගනිමින් එවැනි නොමනා ක්‍රියාවන් ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

وَإِن يَمْسَسْكَ اللهُ بِضُرٍّ فَلاَ كَاشِفَ لَهُ إِلاَّ هُوَ وَإِن يُرِدْكَ بِخَيْرٍ فَلاَ رَآدَّ لِفَضْلِهِ

'අල්ලාහ් ඔබ විපතක හසු කරන්නේ නම් එය ඉවත් කරන්නට ඔහු හැර (අන් කිසි) කෙනෙකු නැත තවද ඔහු ඔබට යහක් සිතුවෙ නම් ඔහුගේ (ඒ) ප්‍රසාධය වළක්වන්නටද (මහු හැර අන්) කෙනෙකු නැත. (අල්කුර්ආන් 10 : 107)

අල්ලාහ් හැර අන් ඒවාට භාරවීම වත්මනයේ තවත් සමහරු, ඉටිපන්දම්, තෙල් සහ පහන් වැනි බොහෝ දේ බාර වී

ඒවා එවන් දෙවගැත් තන්ගේ, සමිඳුන්ගේ සොහොන් අභියසට ගෙන ගොස් එහි පසුවන්නන් හට ඉටුකිරීම දැකිය හැකිය.

මෙය ද අල්ලාහ්ට කරන ආදේශ කිරීමකි. අල්ලාහ් හැර අන් ඒවාට මාංශ දාන දීමඑසේම අල්ලාහ් හැර දෙවගැත්තන් සහ සමිඳුන් වැනි අන් අය වෙනුවෙන් හරකුන් සහ එළුවන් වැනි සතුන් කපා මාංශ දාන දීමද අල්ලාහ්ට ආදේශ කිරීමක් වෙ. එසේ අල්ලාහ් හැර අන් අය වෙනුවෙන් මාංශ දානය දීම කිසිවිටෙක අල්ලාහ් අනුමත නොකරයි. ඒ කරුණ අළලා අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

فصلِّ لربك وانحر

' එහෙයින් මබගේ හිමි (ට පමණක්) නැමදුම් කරව. (සතුන් කපා) නහ්ර් (නම් මාංශදාන) ද දෙව. (108 : 2) එසේ අල්ලාහ් හැර අන් අය වෙනුවෙන් මාංශ දානය දීම ගැන මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූහ:

'අල්ලාහ් හැර අනුන්ට කපා මාංශ දාන දෙන්නන්ට අල්ලාහ්ගේ ශාපය අත්වේවා' (මූලාශ්‍රය : මුස්ලිම්). අල්ලාහ් හැර අන් අය උදෙසා මාංශ දානය දීමද, එසේ දෙන බව බාර වීම, සතුන් කැපිමද, අල්ලාහ් හැර දෙවියන් යැයි පවසමින් අන් ඒවායේ නම් ආමන්ත්‍රණය කර කැපීම වැනි මෙවන් ක්‍රියාවන් සියල්ල මහා ආදේශ කිරීමට අයත් වන අතර එසේ කැපූ සතුන්ගේ මාංශ අනුභව කිරීමට ද තහනම්ය. එසේම තවත් සමහරු, ජින්වරුන්ගේ නොමනා දුෂ්ඨ ක්‍රියාකාරකම්වලට බියවී අළුත් නිවෙස් තනන කළද, අළුත් ළිං හාරන කළද ඒ ඒ ස්ථානවල සතුන් කපා මාංශ දානය සම්මාදම් වෙති. මෙයද විශාල පවක් වන ආදේශ කිරීමට ඇතුලත්ය. no හරාම් හලාල් ලෙසද, හලාල් හරාම් ලෙසද වෙනස් කිරීම අල්ලාහ් විසින් හලාල් කළ දේ හරාම් කිරීමද, හරාම් කළ දේ හලාල්

කිරීමද, සාමාණ්‍යය මිනිසෙකුට එසේ කිරීමට හැකියැයි පිළිගෙන විශ්වාස කිරීමද, එසේ නොවන්නට පැරණි නීතිරීති වලට අදාලව තීන්දු කිරීමද, එසේ තීන්දු දීමට හැකිබව පිළිගැනීම වැනි සියලු දේ අල්ලාහ්ට ආදේශ කිරීමට අයත් පාප කර්මයන් වේ. ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

اتَّخَذُواْ أَحْبَارَهُمْ وَرُهْبَانَهُمْ أَرْبَابًا مِّن دُونِ اللّهِ

(එසේම) ඔවුන්, අල්ලාහ් හැර ඔවුන්ගේ යතිවරුන්ද, මුනිවරුන්ද ඔවුන්ගේ දෙවිඳුන් කර ගත්හ. (අත් තව්බා: 31) තවද වරෙක මුහම්මද් තුමා අල්කුර්ආනයේ මෙම කොටස පාරායනය කරනු ඇසූ අදී බින් හාතිම් තුමා 'අල්ලාහ්ගේ වක්තෘ තුමණි, ඔවුන් ඔවුන්ගේ ඒ අය වන්දනාමාන කළේ නැහැ නොවෙද? යි විමසූ කල 'සැබෑය. නමුදු ඔවුන් අල්ලාහ් අනුමත කළ දේ තහනම් කළහ. අල්ලාහ් තහනම් කළ දේ අනුමත කළහ. මොවුන් ද ඔවුන්ගේ ඒ වදන් අනුව

ක්රියා කරති. මෙසේ කිරීම ඔවුන් වන්දනාමාන කිරීම හා සමාන වෙ' යි උත්තර දුන්හ ' : (මුලාශ්රය බයිහකි). තවද අල්ලාහ් ඒ ආදේශ කරන ජනයන් ගැන පවසද්දී අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි : " ඔවුන් අල්ලාහ් සහ රසූල් වරයා තහනම් කළ දැයින් ඉවත් නොවීද, මේ සත්ය සන්මාර්ගය සත්ය දහමක් ලෙස නොඅදහා ද සිටිති'. (සූරත් අත්තව්බා 29) තවද ඒ ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි :

قُلْ أَرَأَيْتُم مَّا أَنزَلَ اللّهُ لَكُم مِّن رِّزْقٍ فَجَعَلْتُم مِّنْهُ حَرَامًا وَحَلاَلاً قُلْ آللّهُ أَذِنَ لَكُمْ أَمْ عَلَى اللّهِ تَفْتَرُونَ

(නබි තුමනි) පවසනු මැනව, (අනුභව කිරීමට සුදුසු ආහාර වශයෙන් අල්ලාහ් ඔබලාට පහළ කළ දැය ගැන බලා දිටීද? එයින් සමහරක් තහනම් ඒවා ලෙසද, සමහරක් අනුමත කළ ඒවා ලෙසද, ඔබලා කර ගත්හ. (මෙසේ සිතුමතේට තීරණය කිරීමට) අල්ලාහ් ඔබලාට අනුබල දුන්නාද? නැතහොත් ඔබලා

අල්ලාහ් කෙරෙහි බොරු ගොතනවාද? යි විමසනු මැනව'. (අල්කුර්ආන් 10 : 59)

## හූනියම් සහ ශාස්ත්‍ර හෝ නිමිති කීම

ඉස්ලාම් දහම කිසිවිටෙක හූනියම අනුමත නොකරයි. හූනියම් කරන්නා කාෆිවරයෙකු බවට පත්වන අතර, හූනියම සියලු කුසල් කර්මයන් විනාශ කරන විශාල පව හතෙන් එකක් වන්නේය. හූනියම මිනිසාට සෙතක් ගෙන දෙන්නේ නැත. ඒ ගැන අල්කුර ආනය මෙසේ විස්තර කරයි

فيتعلمون ما يضرهم ولا ينفعهم

නමුදු මවුන්ට අනර්ථ දායී වුව ද, වැඩදායී නුවුව ද දේ ඔවුන් ඉගෙන ගනිති'. 5'.තවද ඒ ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි : (අල්කුර්ආන් 2 : 102) එමෙන්ම එතුමා

ولا يفلح الساحر حيث أتى

හූනියම්කරු කොහි ගියද ජය නොලබන්නෝය'. (අල්කුර්ආන් 20 : 69) හූනියම් කිරීමෙහි නිරත වන්නා කාෆිර්

වේ. ඒ ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි:

وما كفر سليمان ولكن الشياطين كفروا يعلمون الناس السحر وما أنزل على الملكين ببابل هاروت وماروت وما يعلمان من أحد حتى يقولا إنما نحن فتنة فلا تكفر

'සුලෙයිමාන් (හූනියම් කර කිසිවිටෙක අල්ලාහ්ව) විශ්වාස නොකරන්නෙක් නොවීය. එහෙත් ප්‍රතික්ෂේප කරන්නේ ෂෙයිතාන්වරුන්ය. ඔවුන් හූනියම් ශාස්ත්‍රය, බාබිලෝන් (නගරයෙ) හී හාරූත් සහ මාරූත් නම් මලක් (යැයි පැවසෙන) දෙන්නෙකුට පහළ කළ දැය (යැයි පවසා දුදන ලෙස ක්‍රියාකිරීමට) මිනිසුන්ට උගන්වමින් පසු වූහ. තවද, ඒ දෙන්නා අප (බලවත්) පරීක්ෂණයක වෙමු. එහෙයින් (මෙය හදාරා) මබලා ප්‍රතික්ෂේප කරන්නන් (කාෆිරවරුන්) බවට පත් නොවව යනුවෙන් අනතුරු නොඅඟවන තුරු මවුන් (හූනියම ) කිසිවෙකුට නොඉගැන්වති (අල්කුර්ආන් 2 : 102) තවද හූනියම් කරන්නා කාෆිරවරයෙකු වන අතර ඉස්ලාමීය

නීතිය අනුව ඔහුට දඬුවම ඔහු සාන්තය කර දැමීම වේ.යමෙකු හූනියම් මගින් උපයන ධනයද හරාම් වෙ. අද සමහරු තම සතුරාට දඬුවම් දීම පිණිස සහ තමාට කළ හූනියම ඉවත් කර ගැනීම පිණිස වැනි බොහෝ කටයුතු සඳහා හූනියම්කරු වෙත ඇදෙනු සාදාරණව දකින්නට හැකි දර්ශනයකි. මෙවන් ක්රියාවන් ඉස්ලාම් දහම කිසිවිටෙක අනුමත නොකරයි. එහෙයින් යම් යම් ප්රතිකාර සඳහා එසේ හූනියම් කරුවෙත යෑමෙන් වැළකී ඉස්ලාම් පවසන දික්ර් වැනි ප්රාථනාවන් මගින් ඒවාට නිසි පිළියම් ලබාගැනීම අති වැදගත්ය. තවද, ශාස්ත්රකරුවන්, නිමිති කියන්නන් වැනි අය ගුප්ත දැ ගැන තමා දන්නා බව පවසන්නේ නම් ඔහු කාෆිර් වරයෙකු වේ. මන්දයත් ගුප්ත දැහී දැනුම අල්ලාහ් හැර අන් කිසිවෙකුට නැති හෙයිනි.

මෙසේ ශාස්ත්‍රකරුවන් වැනි අය අතේ, පිඟන්වල, වීදුරු කැබැලි වල හෝ මුහුණ බලන කණ්ණාඩිවල හෝ පොළොවෙ ඉරි ඇඳ හෝ අනෙකුත් ක්‍රමවලින් හෝ කටයුතු කරමින් මහජනයන් රවටා ගෙන ජීවත්වෙයි.

එසේ යන ජ්‍යෝතිශ්‍යයන්ගේ කියමන්හී එක් ඇත්තක් වූ විට ඉතිරි අනූනවයම මුසාවාද වේ. එසේම ආගම ගැන මනා දැනුමක් නැති තවත් සමහර මන්ද බුද්ධිකයන් තම අනාගතය ගැන, නැති වුනු දෙයක් සොයා ගැනීම පිණිස, විවාහය ගැන දැනගැනීම පිණිස සහ රැකියා කටයුතු ගැන දැන ගැනීම පිණිස වැනි විවිධ කරුණු උදෙසා ජ්‍යෝතිශ්‍යයන් සහ ශාස්ත්‍රකරුවන් වෙත ඇදීයති. මෙසේ ජ්‍යෝතිශ්‍යයන් වෙත ගොස් ඔවුන්ගේ කියමන් පිළිගන්නා ඉස්ලාමීය දෘෂ්ටියෙන් කාෆිර් වරයෙකු වේ. ජ්‍යෝතිශ්‍යයන් වෙත

යන්නා ගැන මුහම්මද් නබි (සල්) තුමා අන තුරු අඟවා මෙසේ දෙසූහ

من أتى كاهنا أو عرافا فصدقه بما يقول فقد كفر بما أُنزل على محمد

යමෙකු ජෝතිශ්‍යයන් වෙත ගොස් ඔවුන් කියන දේ පිළිගත්තේ නම් හෙතෙම අල්ලාහ් විසින් මුහම්මද් පහළ කළ අල්කුර්ආනය ප්‍රතික්ෂේප කළ අයෙකු වේ' (මූලාශ්‍රය : අහ්මද්). නමුදු ජ්යෝතිශ්‍යයන් කියන දේ ස්ථිරසාරව නොපිළිගෙන ඔහු ගුප්ත දෑ ගැන කියන දේ සත්‍ය විය හැකි දැයි දැන ගැනීම පිණිස ඔවුන් වෙත යන්නේ නම් ඔහුගේ දින හත්ලිහක නැමදුමන් අනුමත නොවන්නේය. මෙම කරුණ ගැන මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූහ: ජ්යෝතිශ්‍යයන් වෙත යන්නා ගැන මුහම්මද් නබි (සල්) තුමා අන තුරු අඟවා මෙසේ දෙසූහ

من أتى عرافا فسأله عن شئ لم تقبل له صلاة أربعين ليلة

'යමෙකු ජ්යෝතිශ්‍යයන් වෙත යමක් අසා දැන ගැනීමට යන්නේ නම් ඔහුගේ

දින හතළිහක නැමදුමන් නොපිළිගනු ඇත. (මූලාශ්රය : මුස්ලිම්) no ග්රහයන් සහ නවස්ත්රයන් මිනිසාගේ ජීවිතයේ බලපෑම් කරයි යනුවෙන් විශ්වාස කිරීම. ග්රහයන් සහ නටශස්ත්රයන් එහි ගමන් මිනිස් ජීවිතයේ වෙනස්කම් සහ සුභ අසුභ ගැන තීරණය විය හැකිය යනුයෙන් බොහෝ මුස්ලිම්වරු විශ්වාස කරති. එය ඉස්ලාම් දහමට හාත්පසින්ම විරුද්ධ අදහසකි. මුහම්මද් නබි (සල්) තුමාගේ කලණ මිතුරෙකු වන සෛද් බින් කාලිද් අල් ජුහනි තුමා මෙසේ විස්තර කරයි:

صلى لنا رسول الله صلى الله عليه وسلم صلاة الصبح بالحديبية على أثر سماء كانت من الليلة، فلما انصرف أقبل على الناس، فقال: هل تدرون ماذا قال ربكم؟ قالوا: الله ورسوله أعلم، قال: " أصبح من عبادي مؤمن بي وكافر، فأما من قال مطرنا بفضل الله ورحمته فذلك مؤمن بي وكافر بالكوكب، وأما من قال بنوء كذا وكذا فذلك كافر بي ومؤمن بالكوكب

'මක්කාව අසල මුහම්මද් නබි (සල්) තුමා සහභාගි වූ හුදෛබියා සම්මුතිය සිදු වූ දිනවල මහ වැස්සක් හට ගත් දිනයේ, සුබ්මහ් දේව නැමදුම හසුරුවා අවසන් කළ මුහම්මද් තුමා මිනිසුන් වෙත හැරී

'ඔබගේ දෙවියා කුමක් පවසනවා දැයි මබලා දන්නවාද? යි විමසූ කල එතුමාගේ කළණ මිතුරන් 'අල්ලාහ් සහ අල්ලාහ්ගේ වක්තෘවරයා පමණක් දනී' යැයි පවසන්නට වූහ. එයට මුහම්මද් තුමා ' අද දින අළුයම මිනිසුන් අල්ලාහ් විශ්වාස කළ අය ලෙසින් ද, ඔහු ප්‍රතික්ෂේප කළ අය ලෙසින්ද නැගිටවේවේය යනුවෙන් පවසා 'අල්ලාහ්ගේ අනුග්‍රහයෙන් වැස්ස ලැබුණා යයි පවසන්නේ කවරෙක්ද, ඔවුන් මා විශ්වාස කර ග්‍රහයන් අමතක කර ඇත. ග්‍රහයන්ගේ බලපෑමෙන් වැස්ස ලැබුණා යැයි පවසන්නේ කවරෙක්ද ඔවුන් ග්‍රහයන් විශ්වාස කර මා ප්‍රතික්ෂේප කර ඇතැ යි අල්ලාහ් පවසයි යනුවෙන් පැවසූහ'. (මුලාශ්‍රය : බුහාරි). නවද තම ග්‍රහ ඵලාපල දැනගැනීම පිණිස පුවත්පත් සහ සඟරාවන්හී පළවන ග්‍රහ ඵලාපල කියවා ඒවා සත්‍ය විය හැකි යැයි පිළිගැනීමද ආදේශ කිරීමකි. නමුදු සිත්

සතුටක් ලබා ගැනීම පිණිස ඒවා කියවන්නේ නම් හෙතෙම පව කාරයෙකු වන්නේය. මන්දයත් වරක් නම් ආදේශ කිරීම වෙත ඇද ගෙන යන යමක් මගින් සිත් ශාන්තිය ලැබීමට ඉස්ලාම් තරයේ අනුමත නොකරන අතර, ඒමගින් ෂයිතාන් මිනිසා ආදේශ කිරීම වෙත යොමු කරන නිසාය. no යන්තර සහ සුර වැන්නෙහි නිවාරණ ඇතැයි පිළිගැනීම සමහරු ශාස්ත්‍රකරුවන්ගේ සහ ජ්යෝතිෂ්යයන්ගේ කීම් අසා ඔවුන්ගේ වචන සත්ය යයි පිළිගෙන හෝ අනුවණ ඇදහිලි සහ අදහස් පිළිගනිමින් තම බෙල්ලෙහි, අතෙහි, ඉනෙහි, කණෙහි, සහ තම ළමයින්ගේ දේහයෙහි ඇස් වහ කටවහ සහ අනෙකුත් දුෂ්කර වලින් ආරක්ෂා කර ගැනීම පිණිස සුර හෝ යන්ත්‍ර හෝ මතුරන ලද අන් දෙයක් හෝ එල්ලා ගනිති. නිවසෙහි, වාහනයෙහි තවද අපලයට යනුවෙන් විශේෂ වෛවරණ ගල් සවි කළ හෝ නොකළ මුදු

වැනි දේද පැළඳ ගනිති. මෙසේ කිරීම අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසය අහිමි වන අතර, අල්ලාහ් අනුමත නොකළ දේ මගින් නිවාරණය පැතීමද වන්නේය. තවද සමහරුන් එසේ ක්‍රියාකිරීම ජින් ෂයිතාන්වරුන් ගෙන් ආරක්ෂා පැතීමට බව ද කියති කෙසේ වුවද, මෙවන් යන්ත්‍ර සහ සුර වැනි දේ සකස් කරන්නන් පරිශුද්ධ කුරර්ආනය සමග අනෙකුත් පිරවූ වචන ද එක්කර ඔසප් රුධිරය සහ සතුන්ගේ වැනි අපිරිසිදු දේවලින් මිශ්‍ර දියර වලින් ලියති. ඒවා පැළඳ ගැනීම සහ අන් ඒවාහී හෝ ස්ථානයන්හී හෝ එල්ලා තැබීම ඉස්ලාම් තරයේ හෙළා දකී. එය සාධක වන වස් මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ:

من علق تميمة فقد أشرك

'සුර සහ යන්ත්‍රයන් පළඳින්නේ කවරෙක්ද, හෙතෙම ආදේශ කළ අයෙකු වේ. (අහ්මද්) 5tلا توجد ترجمة لا توجد ترجمة

## වන්දනාමානයන් අනුන්ට පෙනෙන්න නිච්චාවට කිරීම

කුසල් කර්මයන් සියල්ල මුහම්මද් නබි (සල්) තුමාගේ මග පෙන්වීම මත පිරිසිදු චේථනාවෙන් අල්ලාහ් වෙනුවෙන් පමණක් කළ යුතු අතර මිනිසාට පෙන්වීමට නොවේ. මිනිසාගේ ප්රශංසාව උදෙසා මිනිසා ප්රශංසා කළ යුතුය යන අධිෂ්ඨානයකින් යමක් කුසල් කර්මයන් කරන්නේ නම් ඒ ක්රියාව කුඩා අදේශ කිරීමකට පත්වන අතර ඒවාට කිසිදු පිණක් නොලැබෙන්නේය. لا توجد ترجمة ඒ ගැන අනතුරු අඟවමින් අල්කුර ආයේ මෙසේ විස්තර කරයි :

إن المنافقين يخادعون الله وهو خادعهم وإذا قاموا إلى الصلاة قاموا كسالى يراءون الناس ولا يذكرون الله إلا قليلا

ඇත්තෙන්ම කුහකයන් අල්ලාහ් රවටන්නට අදහස් කරති. ' එහෙත් (අල්ලාහ්) ඔහු, ඔවුන් රැවටවුවෙය. තවද ඔවුන් සලාත් කිරීමට (පිවිස) නැගිට සිටින කල, කුසීත කමෙන් (තමන් සලාත්

කරන්නන් යනුවෙන්) මිනිසුන්ට පෙන්වීම පිණිස (නැගිට) සිටින්නෝය. තවද ඔවුහු ඉතා අල්ප වශයෙන් මිස අල්ලාහ් ගැන මතක් නොකරන්නෝය'. (අල්කුර්ආන් 4 : 142) එසේම අනුන් තමන් ගැන ප්‍රශංසා මුඛව කතා කළ යුතුය යන රිසියෙන් යමෙකු කුසල් කර්මයන් කරන්නේ නම් හෙතෙම ආදේශ කළ කෙනෙකු වන්නේය. දහමෙහි ඔහුට ඇත්තේ දැඩි අවවාදයක් බව මුහම්මද් තුමාගේ මතු සඳහන් දෙසුමෙන් වටහා ගත හැකිය මුහම්මද් නබි තුමා දෙසූ බව ඉබ්නු අබ්බාස් තුමා මෙසේ පවසයි:

من سمَّع سمَّعَ الله به، ومن راءَى راءَى الله به

'තම වන්දනාමානයන් අනුන් ඇසිය යුතු යැයි අධිෂ්ඨානයෙන් කරන්නේ කවරෙක්ද, අල්ලාහ් ඔහුගේ වන්දනාමා නයන් අනුන්ට ඇසෙන්නට සළස් වන්නේය. එසේම අනුන් බැලිය යුතුයැයි බලාපොරොත්තුවෙන් කරන්නේ කවරෙක්ද අල්ලාහ් ඒවා අනුන්ට

බලන්නට හැකි වන අයරු සළුස්වන්නේය' (මූලාශ්‍රය : මුස්ලිම්) එසේම තමන් කරන වන්දනාමානයන් අල්ලාහ්ට සහ අනුන් වෙනුවෙන් කරන්නේ නම් ඒවාද විනාශ වන්නේය ඒ ගැන අල්ලාහ් පවසන බව මුහම්මද් නබිතුමා මෙසේ දෙසූහ

أنا أغنى الشركاء عن الشرك، من عمل عملا أشرك فيه معي غيري تركته وشركه

ආදේශකයන්ගේආදේශයන්ගෙන් මම ස්වාධීන වෙමි. කවරෙකු මා සමග මා හැර වෙනත් කෙනෙකු හවුල් කරමින් ක්‍රියාවක් සිදු කළේ ද සැබැවින්ම මම ඔහු හා ඔහුගේ ආදේශය ද අතහැර දැමුවෙමි. (මූලාශ්‍රය : මුස්ලිම්) යමෙකු වන්දනාමානයට එක්වී මුනිවචාවක් ඔහු තුල ඇති වී හෙතෙම එය පිළිකුල් කරන්නේ නම් ඔහුගේ වන්දනාමානයන් පිළිගනු ලබනු ඇත. නොවන්නට හෙතෙම මුනිවචාවට ප්‍රිය වන්නේ නම් ඔහුගේ වන්දනා මනයන් මුලුමනින්ම ප්‍රතික්ෂේප වී නිෂ්ඵල වනු ඇත.

## නිමිති බැලීම අද බොහෝ දෙනෙකු ම කටයුත්තක් වෙනුවෙන්ම නිමිත බලා කටයුතු කිරීමේ පුරුද්දකට පත්ව ඇත. ඇත්තෙන්ම එය ඉස්ලාම් අනුමත නොකළ දෙයකි.

දුර්නිමිති බැලීම ගැන අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

فإذا جاءتهم الحسنة قالوا لنا هذه وإن تصبهم سيئة يطيروا بموسى ومن معه

' ඔවුනට ( යම්) හොඳක් පහළ වූවා නම් මෙය අපට යැයි කීවෝය. ඔවුනට නරකක් වූ කල්හී එය මූසාගේද, ඔහු හා පසුවන්නන් විසින් ඇති වූ දුර්නිමිත්තක් යැයි ආරෝපනය කරති'. (අල්කුරආන් 7: 131) එදා විසූ ජනයන් යම් කටයුත්තක් ආරම්භ කිරීමට සැරසෙන කළ නිමිති සොයනු වස් පක්ෂියෙකු පියාඹා ැමට සළස්වා එය දකුණු දිසාවට පියාඹා යන්නේ නම් ඒ කටයුත්ත කරති.

නොවන්නට එය වම් පැත්ත පියාඹා යන්නේ නම් දුර්මිත්තක් යැයි පවසා ඒ කටයුත්ත අත් හැර දැමීම සම්ප්‍රදායක් ලෙසට පත් කර ගෙන සිටියහ. මේ ගැන මුහම්මද් තුමා මෙසේ අවවාද කළහ.

الطيرة شرك

' නිමිති බැලීම (අල්ලාහ්ට) ආදේශ කිරීමකි'. (මූලාශ්‍රය : අහ්මද්). لا توجد ترجمة

එසේම සෆර් මාසය වැනි මාසයේ මංගල කටයුතු වැනි දේ කිරීමෙන් වැළකී සිටීම, මාසයේ අවසාන බදාදා දිනයේ සමහර කටයුතු කිරීමෙන් වැළකී සිටීම, මූසල, භයානක යැයි 13 වන අංක කෙරෙහි විශේෂ සැළකිල්ලක් දැක්වීම, අන්ධයන්, අබ්බගාතයන් ඉදිරියට පැමිණියා නම් යන්නට ගිය ඒ ගමන අත් හැර දැමීම, එදින තම රැකියාවට යෑමෙන් පවා වැළැක්කීම වැනි සියලු දේ ඉස්ලාම් දහම තහනම් කළ ආදේශ කිරීමට ඇතුලත් වේ. මුහම්මද් තුමා දෙසූ බව ඉම්රාන් බින් හුසෙයින් මෙසේ පවසයි:

ليس منا من تطير ولا تطير له ولا تكهن ولا تكهن له (وأظنه قال: ) أو سحر أو سحر له

'පෙර නිමිති කියන්නාද එය අසන්නාද, ශාස්ත්‍ර කියන්නා සහ එය අසන්නාද, නොවන්නට හූනියම් කරන්නාද, කරවන්නාද අප සමාජයේ කෙනෙකු නොවන්නේය. (මූලාශ්‍රය : තබරානි) යමෙකු එසේ පෙර නිමිති අසන්නේ නම් ඔහු පව සමා අයැදිය යුතු ආකාරය මුහම්මද් තුමා මනාව පැහැදිලි කර දී ඇත. ඒ කරුණ සම්බන්ධයෙන් කරුණ අබ්දුල්ලාහ් බින් අම්රු තුමා මෙසේ විස්තර කරයි:

من ردَّته الطيرة من حاجة فقد أشرك، قالوا: يا رسول الله! ما كفارةُ ذلك؟ قال: أن يقول أحدهم: اللهم لا خير إلا خيرك، ولا طير إلا طيرك،ولا إله غيرك

'මුහම්මද් නබි (සල්) තුමා වරෙක් ' නිමිති තම කටයුත්තන් කිරීමට නොහැකිව බාධා බව සළකන්නේද, හෙතෙම ආදේශ කළ අයෙකු වන්නේය' යි දෙසු කළ සහාබාවරුන් ' එයට පිළියම කුමක්ද?'යි විමසූහ. එවිට මුහම්මද් නබි (සල්) තුමා '

එසේ පෙර නිමිති විශ්වාස කළ කෙනෙකු 'අල්ලාහුම් ලා කයිර ඉල්ලා කයිරුක. වලා තයිර ඉල්ලා තයිරුක. වලා ඉලාහ කයිරුක' (තේරුම : දෙවියනි,ඔබගේ පින් හැර අන් පිනක් නැත. ඔබ යමක් සළස්වනවා මිස නිමිත්තක් කියා නැත වැදීමට සුදුසු දෙවියා ඔබ හැර අන් කෙනෙකු නැත) යනුවෙන් පැවසිය යුතු බව කියා දුන්හ. (මුලාශ්රය : අහ්මද්) එසේම පෙර නිමිති සහ සුභ නැකත් බැලීම කෙනෙකුගේ මනස හා සම්බන්ධ වූ ක්රියාවක් බව පැවසේ. මිනිස් සිත් තුල එහි ආශාව අඩු වැඩි වෙමින් පවතින්නේය.

එයට එකම පිළියම් සියල්ල අල්ලාහ් කෙරෙහි පවරා සියල්ලට ඔහු වෙතින් ආරක්ෂා පැතීම වේ.

මුහම්මද් නබි (සල්) තුමාගේ කලණ මිතුරෙකු වන අබ්දුල්ලාහ් බින් මස් උදේ තුමා මෙසේ පවසයි: 'නිමිති බැලීමේ උවමනාව අප සිත් තුල ඇති වුව හොත්

එය අල්ලාහ් වෙත පැවරීමෙන් අල්ලාහ් ඒ අදහස අප වෙතින් ඉවත් කරන්නේය'. (මූලාශ්‍රය : අබූදාවූද් )

## අල්ලාහ් හැර අන් දේ මත දිවරීම

අති පාරිශුද්ධ අල්ලාහ් තම මනාපය පරිදි තම මැවීම් මත දිව්රන්නේය.ඔහුට තම මැවීම් මත දිවරීමට ඔහුට අයිතියක් ඇත. නමුදු මිනිසා අල්ලාහ් කෙරෙහි මිස අන් ඒවා මත දිව්රීමට නොහැකි බව ඉස්ලාම් තරයේ පෙන්වා දෙයි. අල්ලාහ් මත පමණක් දිවරිය යුතු බව ඉස්ලාම් තරයේ කියා සිටියද,අද බොහෝ දෙනෙකු අල්ලාහ් හැර අන් ඒවා පෙරටු කර ඒවා මත දිවරති. මෙය අනිවාරයයෙන්ම වැළකී සිටිය යුතු කරුණක් බව අප වටහා ගත යුතුය. මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූ බව අබ්දුල්ලාහ් බ්න් අම්රු නමා පවසයි. 'දැනගන්න.

ألا إن الله ينهَاكم أن تحلِفُوا بآبائكم، من كان حالفًا فليحلف بالله أو ليصمت

ඔබලා ඔබලාගේ පියවරුන් මත දිවරීම අල්ලාහ් තහනම් කර ඇත. ඔබගෙන් යමෙකු දිවරන්නේ නම් අල්ලාහ් මත පමණක් දිවරද්දෙන්. එසේ නොවන්නට නිහඬ වෙද්දෙන්' (මූලාශ්‍රය : බුහාරි). තවත් වාර්තාවක මුහම්මද් නබි (සල්) තුමා දෙසූ බව ඉබ්නු උමර් තුමා මෙසේ පවසයි:

من حلف بغير الله فقد أشرك

'අල්ලාහ් හැර අන් ඒවා මත දිවරන්නේ කවරෙක්ද හෙතෙතෙඅාදේශ කළ කෙනෙකු වන්නේය'. (මූලාශ්‍රය : අහ්මද්) තවද මුහම්මද් තුමා මෙසේ දෙසූහ:

من حلف بالأمانة فليس مِنَّا

' අමානා මත දිවරන්නේ කවරෙක්ද ඔහු අප සමාජයේ කෙනෙකු නොවන්නේය'. (මූලාශ්‍රය : අබූදාවුද්) එසේම කඃබා දේවස්ථානය මත, අමානා හෙවත් බිය බැති අන්දමින් විශ්වාස වන්තව සුරකීමට තබා ඇති දේ මත, යමක යහපත මත, කෙනෙකුට කළ උදව්ව සිහි කර, බරකත්

හෙවත් අනුග්රහය මත, ජීවිතයක් මත, අව්ලියාවරුන් වන ්ගැත්තන් සිහිකර සහ දෙමාපියන්ගේ සහ ළමයින්ගේ හිස මත දිවරීම වැනි දිවරීම් සියල්ල ඉස්ලාම් දහම තරයේ හෙළා දකී. යමෙකු නොදැනුවත්ව හෝ එසේ කරන්නේ නම් එයට බිය බැතියෙන් 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යනුවෙන් පවසා පිළියම් කර ගත යුතු යැයි මුහම්මද් නබි තුමා පෙන්වා දී ඇත. තවද මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ: 'තවද දිවරා එහි ලාත්, උස්සා, වැනි මිසදිටු පිළිමයන් අතුලත් කරගන්නේ කවරෙක්ද හෙතෙම එයින් හැරී ' ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් කියපු දෙන්' (මූලාශ්රය : බුහාරි). لا توجد ترجمة එසේම ෂිරක් වෙත ඇදගෙන යා හැකි තහනම් කළ නවන් කරුණු කීපයක් කිරීමෙන් අප ඉවත් විය යුතුය. උදාහරණයන් වශයෙන්, අල්ලාහ් සහ ඔබ මගින් ආරක්ෂා පතමි අල්ලාහ් සමග තවත් කෙනෙකු යා කර දිවරීම, අල්ලාහ්

සහ ඔබ නොවන්නට මෙය මෙසේ සිදුවන්නට නොහැකිය වැනි ලෙස පැවසීම, لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة කාලයට ශාප කිරීම, لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة තම ළමයින්ට අබ්දුල් මසිහ්, අබ්දුල් නබි, අබ්දුල් රසුල් අබ්දුල් හුසෙයින්, සහ අබ්දුල් මනාෆ් වැනි නම් තැබීම වැනි සියලු දේවලින් මුස්ලිම්වරු තරයේ ඉවත්විය යුතුය. සමහර අය දිවරීම පිණිස භාවිතා කරන තවහීදයට ඉදුරාම පටහැනි වදන් වන ඉස්ලාමීය සමසමාජ ආර්ථික ක්රමය, ඉස්ලාමීය ප්රජාතන්ත්රවාදය ක්රමය, මිනිස් සමාජ යේ අදහස දෙවියන්ගේ අදහස, දහම දෙවිඳුට අයත්ය පොළොව හැම දෙනාටම අයත්ය, විප්ලවයේ නාමයෙන් සහ අරාබීත්වයේ නාමයෙන් සහ අප වංශයේ නාමයෙන් වැනි මෙවන් වචන සියල්ල ඉස්ලාම් දහමට පටහැනි ඒවා බව තරයේ මතක තබා ගත යුතුය. තවද මුස්ලිම්වරයෙක් රජුන්ගෙන් රජා, විනිශ්චය කාර යාගේ

විනිශ්චය කාරයා යනුවෙන් හෝ එවැනි අර්ථයන් නියෝජනය වන නම් තැබීම සහ එවන් අර්ථය ගෙන දෙන වෙනත් වචන හෝ භාවිතා කළ නොහැකිය. මන්ද යත් මෙවන් වචන සියල්ලටම එකම උරුමක්කාරයා සරවබල අල්ලාහ් දෙවිදු වේ. තවද කිසිදු මුස්ලිම්වරයෙකු නායක තුමනි, අපගේ නායකයානනි, යනුවෙන් කාෆිර් කෙනෙකුට හෝ කුහකයාට හෝ ඇමතිය නොහැකිය. لا توجد ترجمة අවසන් වූ යමක් කෙරෙහි එය එසේ වූවා නම් හොදයි හෝ මෙසේ වූවා නම් හොඳයි යනුවෙන් හෝ දුක සහ කෝපය පෙන්විය හැකි වදන් ද පාවිච්චි කිරීමෙන් වැළකී සිටිය යුතුය. لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة

# කුහකයන් සහ පාපතරයන් සමග වාඩි වීම සහ ඔවුන් ප්‍රිය වීම

අද මුස්ලිම් සමාජයේ ඊමාන්හී ස්ථිරව පසු නොවන බොහෝ දෙනෙකු කුහකයන් සහ දුදනන් සමග විශේෂයෙන්ම ඉස්ලාම් දහම ගැන නින්දිත අන්දමින් විවේචනය කරන්නන් සමගද ඉතා සුහදව වැජඹෙනු දැකිය හැක. මෙසේ එක්ව හැසිරීමෙන් වැළකී සිටිය යුතු අතර, එය කෙනෙකුගේ ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහිද ඌනත්වයක් ඇති කිරීමට හැකිය. ඒ ගැන අනතුරු අඟවමින් අල්කුර්ආනය මෙසේ විස්තර කරයි

وإذا رأيت الذين يخوضون في آياتنا فأعرض عنهم حتى يخوضوا في حديث غيره وإما ينسينك الشيطان فلا تقعد بعد الذكرى مع القوم الظالمين

'(නබි තුමනි) අපගේ වදන් ගැන (නිරර්ථකව විහිළු කරමින්) විතරකයෙහි ගිලී සිටින අය ඔබ දිටී නම්, ඔවුන් එය

නොවන (වෙන) විෂයන්හි ගිලෙන තෙක් ඔවුන්ගෙන් මග හැරී සිටිව. එහෙත් ෂයිතාන් (මේ ආඥාවෙන්) මබ අමතක (වීමට) කළ හොත්, (එය) සිහිපත් වුනායින් පසු, වරද කරන ඒ සමූහයා සමග අසුන් නොගනිව් '. (අල්කුර්ආන් 6 : 68) එහෙයින් නොමුස්ලිම්වරුන් වන ඔවුන් ඉස්ලාම් දහම සහ එහි සත්‍ය කෙරෙහි අමතන්නද, නොවන්නට ඔවුන් ඒ කරන දුදන ක්‍රියාවන්ගෙන් ඔවුන් වළකන්නට වීනා ඔවුන් සමග අසුන් ගැනීම මුස්ලිම්වරයෙකුට කිසිදු අයිතියක් හෝ අවසරයක් හෝ නැත. ඒ කුහකයන්, දුදනන් තම කිටටු ඥාතීන් වුව ද ඔවුන්ගෙන් ඉවත්ව සිටිය යුතු බව ඉස්ලාම් තරයේ අවවාද කරයි. لا توجد ترجمة ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

فإن ترضوا عنهم فإن الله لا يرضى عن القوم الفاسقين

' ඔබ මවුන් කෙරෙහි (තෘප්තිමත් වී) සොම්නස් වනු පිණිස ඔවුන් ඔබට

දිව්රන්නෝය. නමුදු ඔබ ඔවුන් කෙරෙහි සොම්නස් වුවත්, අල්ලාහ් ඒ පාපීතර සමාජයන් කෙරෙහි (තෘප්තිමත්වී) සොම්නස් නොවන්නේය'. (9 : 96 )

## උවමනාවෙන්ම සලාතයේ සන්සුන අත් හැරීම

සොරකමෙහි ඉතා සාපරාධ සොරකම සලාත්හී සොර කම් කිරීම වේ යනුවෙන් මුහම්මද් නබි තුමා අනතුරු ඇඟ වූහ.

أسوأ الناس سرقة الذي يسرق من صلاته، قالوا: يا رسول الله! وكيف يسرق من صلاته؟ قال: لا يتم ركوعها ولا سجودها

මන්දයත් මුහම්මද් තුමා 'සොරකම් කරන්නා ගෙන් ඉතා අධමයා සලාත්හී සොරකම් කරන්නා වේ ' යනුවෙන් වෙ යැයි දෙසූ කළ එතුමාගේ කලණ මිතුරන් ' නබි තුමනි, සලාත්හි සොරකම් කරන්නේ කෙසේද?' යි විමසූහ. එවිට එතුමා 'ඔවුන් තම රුකූඋ සහ සුජුදයන් නිසි ලෙස (සම්පුරණව) සන්සුන්ව ඉටුනොකරන්නේය' යි පැවසූහ. (මූලාශ්රය : අහ්මද්). සලාත්හි නිරත වන

බොහෝ දෙනෙකු මදක් ප්‍රමාද වී නිසංසලේ, සාවදානව කළ යුතු ස්ථානයන්හී එසේ ප්‍රමාද නොවීද, රුකූල සහ සුජූද්හී ප්‍රමාණවත්ව පිට කොන්ද නොනමාද, රුකූඋ සිට නැගිට කෙළින් සිට එහි මදක් ප්‍රමාද නොවීද, සුජූද් දෙක අතර වාඩි වූ කල මතක් ප්‍රමාද නොවීද ඉතා වෙගයෙන් සලාත් නිම කරති. لا توجد ترجمة

لا توجد ترجمة

එසේ උවමනා ස්ථානයන්හි නිසි ලෙස ප්‍රමාද නොවී කරන සලාත් බොහෝ සෙයින් අනුමත නොවනු ඇත.

ඒ ගැන අවවාද කරනු විලසින් මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූහ:

لا تُجزئ صلاة الرجل حتى يقيم ظهره في الركوع والسجود

'සලාත් කරන්නා නම රුකූහී සහ සුජූද්හ තම පිට කොන්ද නිසි ලෙස තබන තුරු ඔහුගේ සලානය අනුමත නොකරනු ලබනු ඇත. (මූලාශ්‍රය : අබූදාවූද්)

මෙසේ කෙනෙකු අඩු ලුහුඬු අන්දමින් හදිසියෙන් කරන සලාත් අල්ලාහ් විසින් අනුමත නොවන අතර, ඔහු අවවාදයට ලක් වනු ඇත. ඒ සලාත්මයන් ඔහුට කිසිදු පිහිටක්ද නොවන්නේය.

මුහම්මද් නබි (සල්) තුමාගේ කලණ මිතුරෙකු වන අබී අබ්දුල්ලාහ් අල් අෂ්අරී තුමා මෙසේ විස්තර කරයි: 'මුහම්මද් නබි (සල්) තුමා තම කළණ මිතුරන්ට සලානය හසුරුවා අවසන් කර ඔවුන් ගෙන් සමහරුන් සමග පිළිසඳරෙහි යෙදී සිටින කළ ප්රමාද වී පැමිණි තවත් කෙනෙකු එහි පසෙක සලාත් කරමින් සිටියේය. ඔහු තම සලාත්හි රුකූඋ කර වහා සුජූද් කර කඩිනමින් නැගිටින දුටු මුහම්මද් නබි (සල්) තුමා ඔහු දෙස බලා මෙසේ දෙසූහ:

أترَون هذا؟ من مات على هذا مات على غير ملة محمد، ينقر صلاته كما ينقر الغراب الدم، إنما مثل الذي يركع وينقر في سجوده كالجائع لا يأكل إلا التمرة والتمرتين فماذا تغنيان عنه

**ඔහු සලාත් කළ අයුරු ඔබලා දකිනවාද? මෙසේ සලාත් කර ජීවිතක්ෂයට**

පත්වන්නේ කවරෙක්ද, හෙතෙම මුහම්මද්ගේ ආගමෙන් තොර මැරෙන්නේය. ඔහු තම සලාතය කපුටෙකු ලේ කොටා කන අයුරු හදිසියෙන් කරන්නේය. තම සලාතයේ රුකූඋ කර ඉක්මණින් සුජූද් කිරීමට නැගිටින්නාගේ උදාහරණය කුසගින්නෙන් පසුවන්නා රට ඉදි ගෙඩියක් දෙකක් කෑම හා සමාන වන්නේය එසේ කෑම ඔහුගේ කුසගින්න නොසන්සිඳු වන්නේය. (මූලාශ්‍රය :ඉබ්නු හුදෙමා) සෙයිද් බින් වහබ් තුමා පවසයි තවත් වරෙක් මෙසේ රුකූඋ සහ සුජූද් නිසි ලෙස සාවධානව නොකර සලාත් කිරීම ඉක්මණින් අවසන් කළ කෙනෙකු දුටු හුදෙෆා (රළි) තුමා 'ඔබ මේ හා ජීවිතක්ෂයට පත්වූවා නම් නොමුස්ලිමෙකු ලෙස ජීවිතක්ෂයට පත්වන්නේය' යි අවවාද කළ බව (මූලාශ්‍රය : බුහාරි). 'එහෙයින් සලාත් හදිසියෙන් තොරව සාවධානව කළ යුතු

බව පැහැදුනු කෙනෙකු, හදිසියෙන් කළ ඒ අවසන් සලාතය නැවත කළ යුතු අතර, පෙර කළ ඒවා වෙනුවෙන් අල්ලාහ් වෙතින් පව සමාදන් ඉල්ලිය යුතුය. නමුදු ඒවා නැවත කිරීමට උවමනා නැත තම සලාත් නිසිලෙස ඉටු නොකළ කෙනෙකු දුටු මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූහ:

ارجع فصَلِّ فإنك لم تُصلِّ

'ඔබ සලාත් කළේ නැහැ. නැවත සලාතය හරියාකාරව කරනු'. එහෙයින්එහෙයින් සලාත් කරන අවස්ථාවන්හී සලාතයේ සාවධානව කළ යුතු ස්ථාවන වල මුහම්මද් නබි (සල්) තුමාගේ අනුශාසනය අනුව හරියාකාරව සන්සුන්ව කර සලාතයේ නියම ප්‍රතිවිපාකය ලබාගත යුතුය.

## සලාතයේ අධික ලෙස චලනය වීම සහ නොමනා දේ කිරීම

සලාත්හි නිරත වන බොහෝ දෙනෙකු සලාත්හි නොසැළකිල්ලෙන් පසුවෙති. ඔවුන් සලාත් කිරීමට නැගිට ගත් කළ කුසීත කමින්ද, එහිමෙහි සෙළවෙමින්ද, තවත් නොමනා අන්දමින් තවත් සමහර දේද කරති.

لا توجد ترجمة

وقوموا لله قانتين

'(සලාත් කරන විට) අල්ලාහ්ට බැතිමත්ව ( යටහත් පහත්ව) නැගී සිටීව්' (අල් කුර්ආන් 2:238)

එසේම සලාත් හී බිය බැති අයුරෙන් කටයුතු කරන්නන් ගැන සදහන් කරමින් අල්කුර් ආනය මෙසේ විස්තර කරයි.

قد أفلح المؤمنون، الذين هم في صلاتهم خاشعون

විශ්වාස වන්තයන් ජයග්රහකයන්ය. ඔවුන් තම සලාත්හි යටහත් පහත්ව (බැතිමත්ව නිරතව) සිටිති'.

(23 : 1-2) වරෙක කෙනෙකු මුහම්මද් නබි තුමා අභියසට පැමිණ එතුමාගෙන් 'මා සුජුද් කරන ස්ථානයේ පොළොව සම තලා කළ හැකිද? යි විමසූ කළ

لا تمسح وأنت تصلي، فإن كنت لا بد فاعلًا فواحدة تسوية الحصى

'ඔබ සලාත්හි නිරතව සිටින කළ එසේ (නලළ තබන ස්ථානයේ පොළොව) සම නොකරනු. අනිවාරයයෙන්ම එසේ කළ යුතු නම් එහි කුඩා ගල් ගැට සමවනු පිණිස වරක් කරනු ' යි මුහම්මද් නබි (සල්) තුමා දෙසූහ. (මූලාශ්රය : අබූදාවූද්) සලාත්හී නුවුවමනා අන්දමින් අධික ලෙස එහිමෙහි චලනය වන්නන්ගේ, පැද්දෙන්නන්ගේ සලාතය අනුමත නොකරන බව බොහෝ ඉස්ලාමීය විද්වතුන්ගේ ඒකමතික නිගමණකි. එහෙයින් සලාත්හී නිසි ලෙස අවදානය යොමු නොකර අල්ලාහ් ඉදිරිපිට තම අත් ඔරලෝසුව බැලීමද, තම ඇඳුම සකස් කිරීමද, නාස් පුඩුවල ඇඟිලි දමා එය හැරීම සහ නිසි ස්ථානයෙන් ඉවත් කර

එහිමෙහි බැල්ම කැරකැවීම් වැනි සලාතයට අනුමත නොවූ ක්‍රියාවන්හී යෙදෙන්නන්ගේ සලාත් කුමණ තත්වයක ප වන්නේ ද යි මදක් සිතා බැලිය යුතු අතර, ෂයිතාන් තම සලාතය නිෂ්ඵල කිරීමෙන් අවධානමෙන් සිටිය යුතුය.

## සලාතයේ ඉමාම් පෙර මඃමූම් පෙරටු වීම

මිනිසා ස්වභාවයෙන්ම ඉක්මන් ලෙස කටයුතු කරන කෙනෙකි. ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

وكان الإنسان عجولًا

" සැබැවින්ම මිනිසා (කඩි මුඩියේ කටයුතු කරන) ඉක්මන් වන්නයාය' (අල්කුර්ආන් 17 : 11) නියත වශයෙන්ම නබිවරයාණන් (එතුමා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදාවේවා) එතුමාණන් මෙසේ පැවසූහ

التأني من الله و العجلة من الشيطان

'සන්සුන අල්ලාහ්ගෙන්. හදිසිය ෂයිතාන්ගෙනි'. (මූලාශ්‍රය : බෙයිහකි). සමහර විට අප දෙපැත්තේ සිට සලාත් කරන්නන් لا توجد ترجمة රුකූහිහෝ සුජූද්දී හෝ තක්බීර් හි හෝ සලාතයේ අවසන් කරන සලාම් කිරීම දක්වා ඉමාම්ට පෙරටුව ක්‍රියා කිරීම අප අනන්තව දැක ඇත්තෙමු. ඒ ගැන මුහම්මද් නබි (සල්) තුමා මෙසේ තරයේ අවවාද කර ඇත.

أما يخشى الذي يرفع رأسه قبل الإمام أن يحول الله رأسه رأس حمار

'සලාහී ඉමාම්ට පෙර හිස ඔසවන්නාගේ හිස අල්ලාහ් බූරුවෙකුගේ හිසක් බවට පත් කිරීම කෙරෙහි බිය විය යුතු නොවේද? (මූලාශ්‍රය : මුස්ලිම්).

සලාතයට සහභාගිවන්නා සන්සුනේ සාවධානව ඉදිරිපත්විය යුතු බව වෙද්දී එහි ඉතා උනන්දුවෙන් සන්සුන්ව කටයුතු කළ යුතු බවද වටහා ගත යුතුය.

තවත් සමහරු සලාත්හි නිරතවන කළ කුසීතකමෙන් ඉමාම්ට මදක් ප්‍රමාධව කරති. එහෙයින් සමහර විද්වතුන්

විස්තර කර ඇත. අනුගමනය කරන්නන් ඉමාම් අල්ලාහු අක්බර් යයි පවසන විට අවසාන 'ර්' පැවසෙනවාත් සමග තක්බීරය කළ යුතු බවද, එයට පෙර හෝ ප්‍රමාධ වී හෝ නොකළ යුතු බවද මුහම්මද් තුමාගේ කලණ මිතුරන් ද සලාත්හී මුහම්මද් නබි (සල්) තුමාට පෙරටුවීම කෙරෙහි ඉතා අවධානමෙන් කටයුතු කළහ.

මුහම්මද් නබි (සල්) තුමාගේ කළණ මිතුරෙකු වන බරාඋ බින් ආසි◌් තුමා මෙසේ විස්තර කරයි.

إنهم كانوا يُصلُّون خلف رسول الله صلى الله عليه وسلم، فإذا رفع رأسَه من الركوع، لم أرَ أحدًا يحنِي ظهرَه حتى يضَعَ رسول الله صلى الله عليه وسلم جبهتَه على الأرض، ثم يخِرّ مَن وراءَه سُجَّدًا

' මුහම්මද් නබි (සල්) තුමා සලාත්හී නිරත වන සහාබාවරුන්, එතුමා රුකූ සිට හිස ඔසවා සුජූද් පිණිස නලළ පොළොවෙහි තබන තුරු සුජූද් කිරීම පිණිස තම කොන්ද නොනමති. මුහම්මද් නබි (සල්) තුමා සුජූද් පිණිස තම නලළ

පොළොවෙහි තැබුවායින් පසුව මිස ඔවුන් සුජූද් නොකරන්නෝය'.

(මූලාශ්‍රය : මුස්ලිම්)

තවද මුහම්මද් නබි (සල්) තුමා තමාගේ වයස්ගත පසු කාල වලදී තම දේහය බරවීමෙන් පසු සලාත්හි සමහර අවස්ථාවන්හී මදක් ප්‍රමාදව කිරීමේ පුරුද්දකට පත්වූහ. ඒ අවස්ථාවන්හී මා අනුගමනය කරන්නන් සලාත්හී තමාට පෙර නොකළ යුතු බව එතුමා පෙරම දැනුම් දුන්හ.

يا أيها الناس! إني قد بدنت فلا تسبقوني بالركوع والسجود

ඒ ගැන එතුමා මෙසේ විස්තර කළහ ' මිනිසුනේ, මම දැන් තරමක කරබාරු කෙනෙක් වෙමි. එහෙයින් රුකූළ සහ සුජූද්හ මට පෙරටු නොවන්න.

(මූලාශ්‍රය : බහකි). එහෙයින් අපද එතුමාගේ අවවාදානුශාසනය පිළිගෙන සලාත්හී ඉමාම්ට පෙරටු නොවී ඉමාම් අනුගමනය කරමින් සලාත්රී නිරත විය යුතුව ඇත. මුහම්මද් නබි(සල්) තුමා

කෙසේ සලාත් කළා දැයි අබූ හුරෛරා තුමා මෙසේ විස්තර කරයි එතුමා සලාත් කිරීම පිණිස නැගිට ගත් කළද, එය ආරම්භ කරන කළද, රුකූ කරන කළද, එයින් නැගිටෙන කළද, සුජූද් කරන කළද, එයින් නැගිටෙන කළද, (අල්ලාහු අක්බර් යනුවෙන්) තක්බීර පවසති. පසුව එසේම මුළු සලාතයෙහිම කරති. තවද රක්අත් දෙකක් අවසන් කළ පසු තුන්වන රක් අතයට නැගිට පටන් ගන්නා කළද තක්බීර පවසති' (මූලාශ්‍රය : බුහාරි).

එහෙයින් ඉමාම් තම තක්බීරය තම ක්‍රියාව හා යා කර කරන විට අනුගමනය කරන්නන්ද එය අවධානය කර ඒ විලසින්ම කළ යුතුව ඇත. එසේ කළා නම් ඒකාබද්ධ ජමාඅත් සලා නියම පින ලබාගත හැකි වනු ඇත

## ලූනු සහ සුදුලූණු කෑම

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

ආදම්ගේ දරුවනි, සියලු මස්ජිදයන්හී ( නැමදුම පිණිස පිරිසිදු ඇඳුම් ඇඳ) ඔබගේ ලක්ෂණය පිහිටා ගනිවව්. (අල් කුර්ආන් 7:31) ජාබිර් (රළියල්ලාහු අන්හු) දැන්වූ මර්ෆු හදීසයක්. නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහුඅලෛයිහි වසල්ලම්) මෙසේ පැවසූහ.

من أكل ثوما أو بصلا فليعتزلنا أو قال: فليعتزل مسجدنا وليقعد في بيته

කවරෙකු ලූනු සහ සුදුලූණු අනුභව කර ඇත්තෝ ඔවුන් අපගෙන් ඉවත්ව සිටිද්දෙන්. නොවන්නට අප මස්ජිදයෙන් මඳක් ඉවත්ව සිටිද්දෙන්' (මූලාශ්රය : බුහාරි). තවද මුස්ලිම් හි වාර්තාවක:

من أكل البصل والثوم والكراث فلا يقربن مسجدنا؛ فإن الملائكة تتأذَّى مما يتأذَّى منه بنو آدم

'ලූනු, සුදුලූනු සහ ලීක්ස් අනුභව කර ඇත්දෝ ඔවුන් අපගේ මස්ජිජියට ලඟා නො වෙද්දෙන්. මන්දයත් මිනිසුන් අපහසුවකට පත්වන දෙයින් සුරදූතයන්ද අපහසුවට පත්වන්නෝය'.

(මූලාශ්‍රය : මුස්ලිම්) තවද උමර් බින් කත්තාබ් තුමා ජුම්ආ දිනයක දේශනා කරන කල ' මිනිසුනේ, ඔබලා දුගඳ වහනය වන (ලූනු සහ සුදුලූනු) ගස් දෙකකින් අනුභව කරන්නන්ය. වක්තෘතුමා, එය අනුභව කළ අය දකී නම් ඔවුන් බකී නම් සුසාන භූමිය වෙන පිටත් කර හරින්නෝය. යමෙකු එය අනුභවකිරීමට කැමැති වන්නේ නම් උයා අනුභව කරද්දෙන් (මූලාශ්‍රය : මුස්ලිම්)

لا توجد ترجمة

لا توجد ترجمة

## දුරාචාරය

ඉස්ලාමීය ෂරීආ නීති මාලාව මිනිසාගේ සභ්‍යත්වය සහ පරම්පරාව ආරක්ෂා කරනු වස් දුරාචාරය විධිමත්ව තහනම් කර ඇත. ඒ ගැන අනතුරු අඟවා අල්කුර්ආනය මෙසේ විස්තර කරයි: උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

ولا تقربوا الزنى إنه كان فاحشة وساء سبيلا

කාමයෙහි වරදවා හැසිරීමට ළං නොව. ඇත්තෙන්ම එය දුෂ්කර්කයකි. (තවද එය අන් නිහීන හානිය වෙත රැගෙන යන) නරක මගකි. (අල්කුර්ආන් 17 : 32) කාන්තාවක් එවැනි දුර්මාර්ගයට පත්විය හැකි සියලු දොරටු පවා සම්පූර්ණයෙන්ම අහුරා ඇත. එසේම කාන්තාව වේල්වලින් හෝ තම හිස්ආවරණයෙන් මුහුණ වසා ගැනීම සහ තම බැල්මන් පහත හෙළා ගැනීම සහ අන් කාන්තාවක් හා නුවුවමනා අන්දමින් තනිව නොසිටීම වැනි දේ නීතිගත කර තිබීම තුලින් තවද දුරාචාරයේ හැසිරෙන විවාහකයන් හට මරණයට පත්වන තුරු ගල් ගසා ඝාතනය කිරීම මගින්ද, දුරාචාරයේ හැසිරෙන අවිවාහකයෙකුට කස පහරවල් සියයක් ගසා ඉස්ලාම් දහම නීතිගත කර එය විශ්ව දඬුවමක් ලෙස පත් කර ඇත. එසේම එසේ දඬුවම් පමුණුවන කල දැනමුතුකමක් වශයෙන්

සහ විවෘත සාක්කි වශයෙන් ඒ දඬුවම මහජනයන් සියැසෙන් දැකිය යුතු බවද ඉස්ලාම් දහම විස්තරකර සිටියි. لا توجد ترجمة අවුරුද්දක කාලයක් ගමෙන් පිටම කර තිබිය යුතුව යනුවෙන්ද එසේම දුරාචාරයේ හැසිරෙන්නාගේ මරණෙන් පසුවූ මිනි වලේ සන්තාපය සහ දඬුවම ගැන පවසන කල, යට කොටස පළල්ව ද, උඩ කොටස හීන්වුනු ලෙසද වූ විශාල හටයක දුරාචාරය කළ තැනැත්තා නිර්වස්ත්‍රව දමා එහි යටින් ගිණි මොලවා වේදනාවට පත්කරනු ලබනු ඇත. එසේ ගිනි මොලවන ලබනු කල, හෙතෙම වෙදනාවෙන් කෑගසමින් උඩට පැමිණ එයින් පිට වීමට උත්සාහ දරනු ලබනු ඇත. ඔහු උඩට පැමිණ එයින් පිටවීමට නොහැකිව පසුවෙනු ඇත. ගින්නේ රළුව මදක් මන්දවූ කල නැවත ඇතුලට යනු ඇත. ආපසුද පෙර සේම පරමාන්ත දිනය දක්වා ගිනි මොලවනු ලබමින් ඔහුට වෙදනා සහිත දඬුවම්

කරනු ලබනු ඇත. දුරාචාරයේ නියැලෙන වයෝවෘද්ධයන් හට දෙනු ලබන දඬුවම ගැන මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූ අබූ හුරෙයිරා තුමා විස්තර කරයි

ثلاثة لا يُكلِّمهم الله يوم القيامة ولا يزكيهم ولا ينظر إليهم ولهم عذاب أليم: شيخ زان وملك كذاب وعائل مستكبر

'අල්ලාහ් තිදෙනෙකු හා කතා කිරීමට හෝ ඔවුන් ගැන ප්‍රශංසා කිරීම හෝ ඔවුන් දෙස කරුණාවෙන් බැලීම හෝ නොකරන්නේය. ඔවුන්ට සදා වේදනා සහිත දඬුවම් අඛණ්ඩව ලබා දෙනු ඇත. ඔවුන් තිදෙනා දුරාචාරයේ හැසිරෙන වයෝවෘද්ධ පුද්ගලයා, නිතර බොරු කියන රජා (හෝ පාලකයා) සහ උඩඟු ලෙස කතා කරන දුප්පතා යන අය. (මූලාශ්‍රය : මුස්ලිම්). මුදල් ඉපයීමේ මාර්ග වලින් අති දුදන මාර්ගය දුරාචාරයේ හැසිරී උපයන මුදල් වේ. එය අති දුදන ඉපැයීමකි. දුප්පත්කම නිසා හෝ පතිවත විකුණා තම දුරාචාරයේ හැසිරෙන කාන්තාව පව්සමා ප්‍රාර්ථනාව පිණිස මධ්‍යම

රැයේ අහසේ දොරවල් විවෘත වන කල දුආ ප්‍රාර්ථනාවන් අනුමත කිරීමේ අවස්ථාවන් පවා අහමි වූ දුර්ග්‍යවන්ත කාන්තාවක් බව මතක තබා ගත යුතුය.

لا توجد ترجمة

අල්ලාහ් විසින් පණවන ලද සීමාවන් ඉක්මවීමට දුප්පත් කම සහ ජීවිතයේ පෞද්ගලික උවමනාවන් පිණිස දුරාචාරය දහම අනුමත කල හේතුවක් බව කිසිවෙකුට කීමට නොහැකිය. 'කාන්තාවට කුසගිනි ඇති වුවද එය නිවා ගැනීමට ඇය තම තන මඬල විවෘත කර එය අලෙවි නොකරනු ඇත' යනුවෙන් අප පැරැන්නන්ගේ ප්‍රසිද්ධ කියමනකි. දුරාචාරයේ අදුදන මෙසේ වෙද්දී කාන්තාවක් කෙසේ තම පතිවත විකුණා කුසගින්න නිවා ගන්නද? වත්මනයේ සෑම තැනකම් පාහේ පාපයේ සියලු දොරටු විවෘත වී පහසු වී ඇත. ෂයිතාන්ගේ උපායෙන් අපගෙන් සමහරෙක් දහමේ දැනුමක් නැතිව එවැනි

දුදන ක්රියාවන්හි නියළෙන නිසා දුදනන් බිහි වීමේ අවස්ථාවන් වත්මන් සමාජය තුල බහුල වී ඇත. لا توجد ترجمة එකා අනෙකා විවෘත රාගයෙන් සහ විරහ තාපයෙන් බලා ගැනීමට අවස්ථාව ලැබීම, එසේම කිසිදු සභ්යත්වයක් නැතිව ගැහැණු පිරිමි නිදහසේ එකට එකතු වී සිටීම, අසභ්ය චිත්රපට, අසභ්ය සඟරා, අසභ්ය ඡායරූප සහ ෂිර්ක් සහ අනෙකුත් දුදන ක්රියාවන් අධිකව ඇති රටවල සංචාරය කිරීම لا توجد ترجمة සහ සියදිවි නසාගැනීම් වැනි බොහෝ දුදන ක්රියාවන් බහුලව ව්යාප්ත වීමට හේතු වී ඇත. විවෘත අවස්ථාවන් නිසා අනිසි ලෙස වූ දරු උපත්, නොමේරූ දරු ගැබ් විනාශ කිරීම

එහෙයින් කරුණාබර දෙවිඳු එවැනි දුදන ක්රියාවන් වෙත නොයොමුවන අයුරු අපගේ සිත් සහ කය ආරක්ෂා කර,

හලාල් සහ හරාම් නිසි ලෙස වටහා ගෙන ඒවා අතර විශාල පරතරයක් ඇති

කර යහපත් ජීවිතයක් ලබා ගැනීමට අනුග්‍රහය දැක්වත්වා!

## සමලිංක සේවනය

පිරිමියෙකු අනෙක් පිරිමියෙකු හා එක්වී සමලිංක සේවනයෙහි යෙදීමේ මහා දුදන ක්‍රියාව වක්තෘ ලූත් තුමාගේ සමයේ සිට අඛණ්ඩව පවතින බව අල්ලාහ් අල්කුර්ආනයේ සඳහන් කරයි. ඒ ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

ولوطا إذ قال لقومه إنكم لتأتون الفاحشة ما سبقكم بها من أحد من العالمين. أئنكم لتأتون الرجال وتقطعون السبيل وتأتون في ناديكم المنكر

'තවද (අප වක්තෘ) ලූත් (තුමා) (අනතුරු අඟවනු පිණිස, ඔහුගේ සමාජ ජනයන් වෙන පිටත් කළෙමු). " සැබැවින්ම ඔබට පෙර ලෝ වැසියන් එක් කෙනෙකුවත් නොකළ (එක්තරා) දුසිරිතක් ඔබලා කරති' යි ඔහුගේ ජනතාවට කී කල්හී ( වූ සිද්ධිය මදක් සිහි කරව). බලා (ආශාවන් පිණිස ස්ත්‍රීන් අත් හැර දමා) පිරිමින් ළඟට (අනිස ලෙස ආශාවන් සන්තර්පනය කර ගැනීම

පිණිස) පැමිණෙනවාද? (මේ දුදන ක්‍රියාව නිසා ඔබලා මගීන්ගේ) මග අවහිර කර (මංපහරන්නන් සේ) යෙදෙන්නෙහුය. (ජනයන්ගෙන් පිරුණු) ඔබලාගේ සභාවන්හීද (ප්‍රසිද්ධ යේම අති) පිළිකුල් (සහගත මේ ) දැ කරන්නෙහුය' යි කීවේය. එයට ඔහුගේ සමාජයේ අයගේ පිළිතුර ' ඔබ සත්‍යවන්තයෙකු නම් අල්ලාහ්ගේ දඬුවම අප වෙත ගෙනව' යි කීම මිස (අන් දෙයක් කීවේ) නැත. (අල්කුර්ආන් 29 : 28-29) වක්තෘ ලූත් තුමාගේ සමාජයේ අය ඒ නොමනා අන්දමේ දුදන ක්‍රියාවේ යෙදුනු හෙයින් ඔවුන් සිව් ආකාරයක දඬුවමකට භාජනය කර දඬුවම් පමුණුවන ලදී. ඔවුන්ගේ ඇස් අන්ධ කර, උසස් තත්ත්වයක වැජඹුණු ඔවුන් පහත් නීච තත්ත්වය කට පත් කර, ඔවුන් මත අහසින් ගල් වරුසා පහළ කර, කන් බිහිරි කරවන දරුණු ශබ්දයක් පිට කර එවන් දුදන ක්‍රියාවෙහි යෙදෙන දෙන්නා

ඉස්ලාමීය ෂරීආ නීතිය අනුව කඩුවෙන් කොටා ඝාතනය කළ යුතු බව තීරණය කර ඇත. ඒ ගැන මුහම්මද් නබි තුමා මෙසේ දෙසූ බව ඉබ්නු අබ්බාස් තුමා විස්තර කරයි: ' වක්තෘ ලූත් තුමාගේ සමාජයේ අයගේ ක්‍රියාව වන සම ලිංගික සේවනයේ යමෙකු නිරත වූවා නම් ඒ දෙන්නා ඝාතනය කර දමන්න' (මූලාශ්‍රය : අහ්මද්).

එසේම අද සමාජය තුල බොහෝ සෙයින් ව්‍යාප්ත වී පවතින ඒ වැනි භයානක ලෙඩ රෝගය වැළඳී තිබීමද අල්ලාහ් විසින් මෙවැනි නොමනා අන්දමින් හැසිරෙන අයට ලබා දී ඇති දඬුවම නිසා විය හැකිය.

## නිදි යහනේ ස්වාමියාගේ වුවමනාවට අකීකරු වන කාන්තාව

අබූ හුරයිරා (අල්ලාහ් ඔහු ව පිළිගනිත්වා) තුමා විසින් වාර්තා කරන

ලදී මුහම්මද් නබි තුමා අනතුරු අඟවා දෙසූ බව

إذا دعا الرجل امرأته إلى فراشه فأبت فبات غضبان عليها لعنتها الملائكة حتى تصبح

'සැමියා තම (කායික උවමනාවන් පිණිස) බිරිඳ නිදන යහනට අමතන කල ඇය ඒ ඇමතුම නිසි කාරණයක් නැතිව ප්‍රතික්ෂේප කර, ඒ නිසා ඔහු මුළු රැය අමනාපයෙන් ගත කරන්නේ නම්, අළුයම වනතුරු මලාඉකාවරුන් ඇයට ශාප කරති' (මුලාශ්‍රය: බුහාරි). සුදුසු කාරණයක් නොවන්නට සැමියා අමතන කල බිරිඳ මුරණ්ඩු ලෙස නිදන කාමරයේ තම සැමියාගෙන් ඉවත් වී සිටීම අඹුසැමියන් අතර සුලු අමනාපයක් හෝ ඇති වූ කල නොහික්මුණු අන්දමින් නිදන යහනෙන් ඉවත්වී සිටින බිරිඳන් ගැන අනව අසා ඇත්තෙමු. لا توجد ترجمة එසේ නොමනා, දහම තහනම් නියැලෙන අතර සමහර විට වන කල ස්වාමියා කළ වෙනත් කටයුතුවල ඇය වෙනුවට වෙනත් ස්ත්‍රියක් විවාහ කර ගැනීමට ද ඉදිරිපත්

වනු ඇත. පිරිමියා තම කායික උවමනාවන් සපුරා ගැනීමට අමතන කල ඇය වහා ඔහුට අවනත විය යුතු බව මතු සදහන්මුහම්මද් නබි තුමාගේ වදන මනාව පැහැදිලි කරයි.

إذا دعا الرجل امرأته إلى فراشه فلتجب وإن كانت على ظهر قتب

" ස්වාමියා තම බිරිඳ අමතන විට ඇය ගමනක් පිණිස ඔටුවක් මත සිටියද වහා ඔහු වෙත යා දෙන්' (මුලාශ්රය : සහීහ් ජාමිඋ).

لا توجد ترجمة

තවද තම බිරිඳ ලෙඩ රෝග, ගැබ්බරව සහ අනෙකුත් සමහර මානසික උවදුරු වලට පත්ව ඇති අවස්ථාවක පසුවන විට ඇය තම උවමනාවන් පිණිස කැඳවීමෙන් සැමියා වැළකී සිටිය යුතුය.

## අහේතුකව ස්වාමියාගෙන් දික්කසාද ඉල්ලීම

අද බොහෝ කාන්තාවන්, තමා සහ තම සැමියා අතර සුළු ප්රශ්ණයක් හෝ

මතභේදයක් හෝ නොමනාපයක් හෝ ඇති වූ විට එයට සැමියාගෙන් දික්කසාද ඉල්ලා සිටීම සාමාන්‍ය සිදුවීමක් බවට පත්ව ඇත. لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة

لا توجد ترجمة

මෙවන් ක්ෂණික ක්‍රියාවන් සහ තීරණයන් පවුල් අතර විශාල ප්‍රශ්ණයන් මතුවී සාමදානව කෙරී ගෙන ගිය කුඩුම්ප දිවිය දෙදරා යැමට හේතු වන්නේය. لا توجد ترجمة ඒ ගැන ඉස්ලාම් දහම තරයේ අවවාද කරන අතර එය අළලා මුහම්මද් තුමාගේ දෙසුමක් සව්බාන් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. 'යම් කාන්තා වක් නිසි හේතුවක් නොවන්නට තම් ස්වාමියාගෙන් දික්කසාද අයැද සිටින්නේ නම් ස්වර්ගයේ සුගන්ධය පවා ඇයට අනුමත නොවන්නේය' (මූලාශ්‍රය : අහ්මද්). උක්බා ඉබ්නු ආමිර් -රළියල්ලාහු අන්හු- තුමා لا توجد ترجمة (මූලාශ්‍රය: තබරානි ). එසේම තම ස්වාමියා දෛනික

වන්දනාමාන නොකරන්නේ නම්, සුරාපානය වැනි මත් ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවෙකු වේ නම්, ඉස්ලාම් දහම අනුමත නොකරන අනෙකුත් හරාම්හි නියැලෙන කෙනෙකු වේ නම්, ඇයට අඛණ්ඩව වද දී හිරිහැර කරන්නෙකු නම්, ඇයට සහ ඔහුගේ ළමයින්ට අවශ්‍ය වියදම් සහ අනෙකුත් ආවශ්‍ය උවමනාවන් වැනි ඇගේ අයිතිවාසිකම් සහ යුතුකම් ඉටු කිරීමෙන් පැහැර හරින්නෙකු නම්, ඇය ඒවා ගැන ඔහුට විස්තර කර පැහැදිලි කළ යුතුය. නොවන්නට වැඩිහිටියන් ලවා මහු දැනුවත් කළ යුතුය. ඔහු ඒවා වටහා ගෙන තම වැරැදි පිළිගෙන යහමගට යොමුවීමට සූදානම් නැති නම් තමා ඔහුගෙන් ආරක්ෂා කරගැනීම පිණිස ඇයට ඔහු හා ඇති විවාහ බන්ධනයෙන් ඉවත්වීම හා පිණිස දික්කසාද අයැදීමට හැකිය.

# ළිහාර් නම් සමාන කිරීම

لا توجد ترجمة ස්වාමියා තම බිරිඳට 'ඔබ මගේ මව වගේ ‘මට මගේ නැගණිය අනුමත නොවන සේ ඔබත් මට හරාම් ' යනු වෙන් පවසා ඇගෙන් නිදහස් වීමට උත්සාහ දැරීම අනුමත නොකරන බව ඉස්ලාම් දහම තරයේ අවවාද කරයි. ඒ ගැන මතු සඳහන් අල්කුර් ආනයේ වැකිය මෙසේ විස්තර කරයි. :

الَّذِينَ يُظَاهِرُونَ مِنكُم مِّن نِّسَائِهِم مَّا هُنَّ أُمَّهَاتِهِمْ إِنْ أُمَّهَاتُهُمْ إِلَّا اللَّائِي وَلَدْنَهُمْ وَإِنَّهُمْ لَيَقُولُونَ مُنكَرًا مِّنَ الْقَوْلِ وَزُورًا وَإِنَّ اللَّهَ لَعَفُوٌّ غَفُورٌ

' ඔබගෙන්, තම බිරිඳන් (ළිහාර් නම්) මවට සමාන කර (ඔබ මගේ මව වගේ යනුවෙන්) පවසන්නන් (ද වෙති. එසේ උපමා වූ බිරිඳන් වන ඒ කාන්තාවන්) ඔවුන්ගේ මින් නොවෙති. ඔවුන් ප්රසව කළ අය නොවන්නට (අන් කිසිවෙක් ඔවුන්ගේ මව්වරුන් නොවේ). තවද සැබැවින්ම, (තම බිරිඳන් මව්වරු ලෙස පැවසුවා නම්, පවසන) ඔවුන් පිළිකුල් සහගත (අයෝග්ය) වදන් සහ රු වදන්

පවසති. තවද සැබැවින්ම අල්ලාහ් (අකුසලන්) සමාවන්නේය. අති සමාදායීය'. (58:2) لا توجد ترجمة යමෙකු එසේ පවසන්නේ නම් එයට කළ යුතු ප්‍රායශ්චිත්තය ද දැඩි කොට ඇත. ඒ ගැන අල්ලාහ් අල්කුර ආනය මෙසේ විස්තර කරයි:

وَالَّذِينَ يُظَاهِرُونَ مِن نِّسَائِهِمْ ثُمَّ يَعُودُونَ لِمَا قَالُوا فَتَحْرِيرُ رَقَبَةٍ مِّن قَبْلِ
أَن يَتَمَاسَّا ذَلِكُمْ تُوعَظُونَ بِهِ وَاللَّهُ بِمَا تَعْمَلُونَ خَبِيرٌ فَمَن لَّمْ يَجِدْ فَصِيَامُ
شَهْرَيْنِ مُتَتَابِعَيْنِ مِن قَبْلِ أَن يَتَمَاسَّا فَمَن لَّمْ يَسْتَطِعْ فَإِطْعَامُ سِتِّينَ مِسْكِينًا
ذَلِكَ لِتُؤْمِنُوا بِاللَّهِ وَرَسُولِهِ وَتِلْكَ حُدُودُ اللَّهِ وَلِلْكَافِرِينَ عَذَابٌ أَلِيمٌ

'තම බිරිදන් (තම මව්වරුන් යැයි කියා) හාර් කොට පසුව ඔවුන් කී දෙයින් පුන පැමිණ (ධම්පතී සුවය) බලාපොරොත්තු වන්නේ නම් එය (ඔවුන් දෙන්නා සංවාසය ට පෙර (ප්‍රාය ලෙස ) ඔවුන් දෙන්නා වහළෙකු මුදවා හැරිය යුතුය. (මෙය අල්ලාහ්ගේ ආඥාවකි) ඒ ගැන ඔබලාට ඔවදන් දෙනු ලැබේ.තවද අල්ලාහ් ඔබ කරන දැය ගැන හාත්පසින්ම දන්නේය'. නමුදු එසේ (වහළෙක් නිදහස් කිරීමට ඔවුන්) හැකියාවක් නොලද නම් ඔවුන්

දෙන්නා සංසර්ගයට පෙර (ප්‍රායච්ත්තය ලෙස) පිළිවෙතින් (නොකඩවා) දෙමසක් උපවාස ශීලයෙහි යෙදිය යුතුය. එසේ (උපවාස ශීලය) කිරීමට ශක්තිය නොලද්දන් දිළිඳුන් සැට දෙනෙකුට (මධ්‍යම ප්‍රමාණයේ) ආහාර දිය යුතුය. මේ (විස්තර ) ඔබ අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයා කෙරෙහි විශ්වාස කිරීම පිණිසය. තවද මේවා අල්ලාහ්ගේ (පරම ආඥා දායී) සීමාවන්ය. තවද, (මෙවන් ආඥාවන්) ප්‍රතික්ෂේප කරන්නන්ට වේදනීය දඬුවම් වේ . (58 : 3-4)

## ඔසප් සමයේ කායික සංසර්ගය

බිරිඳගේ ඔසප් සමයේ කයික සංසර්ගයෙදි යෙදීම ඉස්ලාම් තරයේ හෙළා දකී. ඒ ගැන අල්ලාහ් අල්කුර ආනය මෙසේ විස්තර කරයි :

وَيَسْأَلُونَكَ عَنِ الْمَحِيضِ قُلْ هُوَ أَذًى فَاعْتَزِلُواْ النِّسَاء فِي الْمَحِيضِ وَلاَ تَقْرَبُوهُنَّ حَتَّى يَطْهُرْنَ فَإِذَا تَطَهَّرْنَ فَأْتُوهُنَّ مِنْ حَيْثُ أَمَرَكُمُ اللّهُ إِنَّ اللّهَ يُحِبُّ التَّوَّابِينَ وَيُحِبُّ الْمُتَطَهِّرِينَ

'(මුහම්මද් තුමනි) ඔසප් ගැන ඔවුන් ඔබගෙන් විමසති. එය පිළිකුල් දෙයකැයි කියව. ඔසප් (කාලයේ) හි ස්ත්‍රීන් ගෙන් (කායික සුවය ලැබීමෙන්) වැළකෙව. ඔවුන් ( එයින්) පිරිසිදු වන තෙක් ඔවුන්ගෙන් ඉවත්ව සිටිව් (අල් කුර්ආන් 2:222) එහෙයින් කාන්තාව ඔසප් රුධිරයෙන් සම්පූර්ණයෙන්ම සුවවී නා පිරිසිදු වන තෙක් ඇය හා කායික සංසර්ගයෙහි යෙදීමට නොහැකි යැයි ඉස්ලාම් දහම තරයේ අවවාද කරමින් සිටියි. තවද අල්කුර් ආනය මෙසේ විස්තර කරයි.

فَإِذَا تَطَهَّرْنَ فَأْتُوهُنَّ مِنْ حَيْثُ أَمَرَكُمُ اللهُ

' ඔවුන් ( ඔසපයෙන්) පිරිසිදු වුවහොත් අල්ලාහ් ඔබට අණ කළ අයුරින් ඔවුන් වෙත යව' (අල් කුර්ආන් 2:222) මසප් සමයේ කායික සංසර්ගයේ යෙදීම ගැන අවවාද කරන මුහම්මද් නබි තුමාගේ දෙසුමක්ද මෙසේ වේ:

من أتى حائضا أو امرأة في دبرها أو كاهنا فقد كفر بما أنزل على محمد

' තම බිරිඳ හා මසප් සමයේද, ඇගේ ගුද මාර්ගයේ ආශ්වාදය ලබන්නාද, ශාස්ත්‍ර කරුවන් වෙත ගොස් ශාස්ත්‍ර අසන්නාද මුහම්මද් වෙත පහළ වූ අල්කුර්ආනය ප්‍රතික්ෂේප කළ අය වන්නේය' (මූලාශ්‍රය : තිර්මිදි). මෙසේ යමෙකු නොදැනුවත්ව වැරදෙහි බැදෙන්නේ නම් අල්ලාහ් ඔහුට සමා දෙන්නේය. නොවන්නට එය දුදන ක්‍රියාවක් බව දැන දැන කරන්නේ නම් විද්වතුන්ගේ මතය පරිදි ඔහු එයට දඬුවම වශයෙන් හෝ දීනාර් බාගයක් හෝ දන් දිය යුතුය. لا توجد ترجمة لا توجد ترجمة ඇගේ මසප් රුධිර අවසන් මොහොතක හෝ ඇගේ ලේ නැවති නා පිරිසිදු වන්නට පෙර සංසර්ගයේ යෙදුනේ නම් දඬුවම ලෙස දීනාර බාගයක් හෝ එයට සරිලන මුදලක් දන් දිය යුතුය. දීනාරයක් යනු රන් ග්‍රෑම් දෙසීය පනස් හතරක ප්‍රමාණයක් බව පවසති. لا توجد ترجمة

## භාර්යාවගේ ගුද මාර්ගයේ සංසරගය

අද සමාජයේ බොහෝ දෙනෙකු තමා කරන්නේ පවක් බව මනා වැටහීමකින් තොරව කායික සංසර්ගය පිණිස බිරිඳගේ ගුද මාර්ගය පාවිච්චි කරති. ඇත්තෙන්ම එය දුදන ක්රියාවක් මෙන්ම අශීලාචාර අප්රිය ක්රියාවකි. මේ ගැන අවවාද කරමින් මුහම්මද් නබි (සල්) තුමා මෙසේ දෙසූ අබූ හුරයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී

ملعون من أتى امرأة في دبرها

කාන්තාවකගේ ගුද මාර්ගයේ ආශ්වාදය ලබන්නේ කවරෙක්ද, ඔහු ශාපයට පත් වූ කෙනෙකි. (මූලාශ්රය : අහ්මද්). තවද මුහම්මද් තුමා මෙසේ දෙසූහ.

من أتى حائضا أو امرأة في دبرها أو كاهنا فقد كفر بما أنزل على محمد

'තම බිරිද හා මසප් සමයේ සහ ඇගේ ගුද මාර්ගයේ ආශ්වාදය ලබන්නාද, ශාස්ත්රකරුවන් වෙත ගොස් ශාස්ත්ර අසන්නාද වක්තෘ මුහම්මද් වෙත පහළ වූ

අල්කුර් ආනය ප්‍රතික්ෂේප කළ අය වන්නේය'

(මූලාශ්‍රය : තිර්මිදි)

සමහර බිය බැති කාන්තාවන්, තම සැමියන් මෙසේ නොමනා අන්දමින් ආශ්වාද ලැබීමට උත්සාහ කරද්දී එය වළක්වන්නට උත්සාහ දරති. එසේ උත්සාහ දරණ කල ඇය දික්කසාද කරන බවටද, නොවන්නට වෙනත් කාන්තාවක් පාවා ගන්නවා යනුවෙන්ද බිය වද්දා තම ආශාවන් සන්තර්පනය කර ගනී. لا توجد ترجمة යනුවෙන් ශුද්ධ වූ අල්කුර් ආනය පවසන වදනද තම ක්‍රියාවට සාධකයක් බවට පත් කර ගනිති.

نساؤكم حرث لكم فأتوا حرثكم أنى شئتم

තවද 'ඔබගේ ස්ත්‍රීන් ඔබට කෙතක් වැන්න. ඔබගේ කැමැති පරිදි ඔබගේ කෙත වෙත යව. (අල්කුර්ආන් 2 : 223 ) නමුදු ඒ අල්කුර් ආන් වදනට වූ නියම අරථ විවරණය අප මනාව වට හා ගෙන කටයුතු කළ යුතුව ඇත. තම බිරිඳගේ ගුද

මාර්ගයේ හෝ යෝනි මාර්ගය හෝ වේවා, යමෙකු කායික ආශ්වාදය පිණිස කාන්තාවගේ ප්‍රශව මාර්ගය උපයෝගි කර ගත යුතුය යනුවෙන් දහම පවසන බැවින් ආශ්වාදය පිණිස යොදා ගත යුත්තේ කාන්තාවගේ ගුද මාර්ගය නොවන බව වටහාගත යුතුව ඇත.

මෙසේ නුවුමනා දුදන ක්‍රියාවන්හී නියැළීමට ප්‍රධානතම සාධකයක් ලෙස

لا توجد ترجمة

අප අතර ව්‍යාප්ත වී ඇති නොමනා අසභ්‍ය චිත්‍රපට බව කිව හැක. එයට පටහැනිව කරන කායික තෘප්තියට සැමියා සහ බිරිඳ යන දෙදෙනාම වගකිව යුතුව ඇති බව තරයේ වටහා ගත යුතුය. එහෙයින් දම්පතීහු තම කායික උවමනාවන් ඉස්ලාම් දහම පවසන අයුරු සන්තර්පනය කරගැනීමට තීරණය කර ගත යුතු අතර

## لا توجد ترجمة

ترجمة توجد لا භාර්යාවන් අතර යුක්තිගරුකව හැසිරීම උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

ولن تستطيعوا أن تعدلوا بين النساء ولو حرصتم فلا تميلوا كل الميل فتذروها كالمعلقة وإن تصلحوا وتتقوا فإن الله كان غفورا رحيما

'(විශ්වාස වන්තයිනි, ඔබගේ) බිරිඳන් අතර යුක්ති ගරුකව සිටීමට ඔබ කෙතරම් උත්සාහ දැරුවද, ඔබට (බොහෝ සෙයින් එසේ කළ) නොහැකිය. (එහෙත් ඔබ වැඩියෙන් ප්‍රිය වන එකම බිරිඳ වෙත) ඔබ එක හෙළාම හැරී අනෙක් බිරිඳ (නිසි ලෙස නොසළකා) එල්ලී සිටින කෙනෙකු මෙන් අත් නොහරිව. ඔබ (අල්ලාහ්ට) බියවී සමාදානව හැසිරෙන්නේ නම් සැබැවින්ම අල්ලාහ් (වැරදීන්) සමා කරන්නාය දයාලු වන්නයාය'. (4 : 129 ) (අන් නිසා: 129) لا ترجمة توجد එකට වඩා බිරිඳන් විවාහ කරගත් බොහෝ දෙනෙකු තම බිරිඳන් අතර වෙනස්කම් කරද, නොවන්නට

ඔවුන් අතර බේද බින්නවද, කෙනෙකුට වඩා තවත් කෙනෙකුට අධිකව සැළැකිලි දක්වාද, කෙනෙකුට වඩා අනෙකාට වැඩි ආදරයක් සහ ඇල්මක් දක්වා ද, බිරිඳන් අතර සමසේ ඔවුන්ගේ උවමනාවන් නොසපුරාද කටයුතු කරති. එසේ නම බිරිඳන් අතර බේද බින්නව හැසිරී මෙන් වැළකී යුක්තිගරුකව හැසිරිය යුතු බව ඉස්ලාම් තරයේ අවවාද කරයි. එසේ එක් බිරිදක් කෙරෙහි වැඩි ඇල්මක්ද අනෙත් අය කෙරෙහි අඩු ඇල්මක්ද දක්වන සැමියන්ට මුහම්මද් තුමා අනතුරු ඇඟවූහ. මෙවන් ක්රියාවන් ඉස්ලාම් දහම කිසිවිටෙක අනුමත නොකරයි. ٧ توجد ترجمة අබූ හුරයිරා (අල්ලාහ් ඔහු ව පිළිගනිත්වා) තුමා විසින් වාර්තා කරන ලදී මුහම්මද් තුමා දෙසූ බව

من كانت له امرأتان فمال إلى إحداهما جاء يوم القيامة وشقه مائل

කවරෙකුට බිරියන් දෙදෙනෙකු වී ඔහු ඔවුන් දෙදෙනාගෙන් එකියක වෙත නැඹුරු වූයේ ද ඔහු මළවුන් කෙරෙන්

නැගිටුවනු ලබන දිනයේ ඔහුගේ එක් පැත්තක් ඇලවූ තත්ත්වයේ පැමිණෙනු ඇත. (මූලාශ්‍රය : අබූදාවූද්)

## අන්‍ය කාන්තාවන් හා තනිව සිටීම

සැමවිටම ෂයිතාන් උත්සාහ කරන්නේ මිනිසා නොමග යවා ඔහු දුදන ක්‍රියාවන්හි නියැළීමටය. ඒ ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

يا أيها الذين آمنوا لا تتبعوا خطوات الشيطان ومن يتبع خطوات الشيطان فإنه يأمر بالفحشاء والمنكر .. الآية

විශ්වාසවන්තයිනි, ඔබලා ෂයිතාන්ගේ (ඔබ නොමග යැවීමට ගන්නා) පියවර අනුගමනය නොකරව. යමෙක් ෂයිතාන්ගේ පියවර අනුගමනය කරන්නේද, ඇත්තෙන්ම ඔහු (අයතා කාන්තා සම්බන්ධ වැනි) දුර්ගුණයෙහිද පාප කර්මයෙහි ද අණවන්නේය'. (24 : 21) තවද, ෂයිතාන් මිනිසාගේ සියලු රුධිර නාලය ඔස්සේම ගමන් කරමින් මිනිසා නොමග යැවීමට අති උත්සාහයක්

දරන්නේය. එහෙයින් මිනිසා නොමඟ යවනු වස් අවස්ථාව ලද කල කාන්තාව හා තනිව පසුවීමට උනන්දු කරවන්නේය. මෙම කරුණ ගැන මුහම්මද් නබි තුමාගේ අවවාදයක් මෙසේ සඳහන් වේ:

لا يخلُونَّ رجلٌ بامرأة إلا كان ثالثهما الشيطان

'යමෙකු (තමාට නීත්‍යානුකූල නොවූ) කාන්තාවක් හා තනිවම පසුවන කල ඔවුන් දෙන්නා හා ෂයිතාන් තුන්වැන්නා ලෙස පසුවන්නේය. ( මූලාශ්‍රය : තිර්මිදි). ඉබ්නු උමර් (අල්ලාහ් ඔවුන් දෙදෙනාව පිළිගනිත්වා) තුමා විසින් වාර්තා කරන ලදී. තවද මුහම්මද් නබි තුමා දෙසූ බව

لا يدخلن رجلٌ بعد يومي هذا على مغيبةٍ إلا ومعه رجل أو اثنان

අද දින සිට කිසිදු පිරිමියෙකු තවත් කෙනෙකු හෝ දෙන්නෙකු හෝ නොවන්නට කිසිදු කාන්තාවක් තනියෙන් සිටින විට ඇතුල් නොවන්න'. (මූලාශ්‍රය : මුස්ලිම්) එහෙයින් යමෙකු නිවසෙහි හෝ තම කාමරයෙහි හෝ වාහනයක හෝ අන් කිනම් ස්ථානයක

හෝ තම සහෝදරයාගේ බිරිඳන්, තම සේවිකාවන්, අනෙකුත් කාන්තාවන් සහ වෛද්‍යවරුන් සහ එවැනි කටයුත්තෙහි නිරතවන්නන් වැනි පිට කාන්තාවන් තනිව සිටීමෙන් වැළකී හා සිටිය යුතුය. අද බොහෝ දෙනෙකු මෙ කාර්යයෙහි නොසැලකිලිමත්ව කටයුතු කරනු අප අන දැක ඇත්තෙමු. එහෙයින් මෙවන් කටයුතු බොහෝ දුදන ක්‍රියාවන් ඇති වීමට මග පැදෙන අතර, ඒ මගින් හරාම් ලෙස බිහිවන නොඅනුමන ළදරුවන්ද අපමණය.

## අන්‍ය කාන්තාවන්ට අතට අත දීම

බටහිර සංස්කෘතියට හැඩ වුනු නොවන්නට ඔවුන්ගේ සම්ප්‍රධායයන් අනුකරණය කිරීමට උත්සාහ දරණ බොහෝ දෙනෙකු තමාට එය ඉස්ලාම් දහමට පටහැනි බව ඔවුන්ට විස්තර කරන කල, ترجمة توجد لا මොහුට සංස්කෘතිය, සමාජ පිළිවෙත් දන්නේ නැතිව අප ගැන වැරදි ලෙස සිතනවා,

මොහු ගොඩයෙක් යනුවෙන් පවසනු බොහෝ විට අසා ඇත්තෙමු. لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة විවාහ වීමට සුදුසු කාන්තාවන් වන බාප්පාගේ දුව, කුඩම්මාගේ දුව, මාමගේ දුව සහ නැන්දා ගේ දුව වැනි අය හා අට අත දී පැසසුම සහ ස්තුතිය හුවමාරු කරගැනීම සාමාන්‍ය සිරිතක් බවට පත්වී ඇත. එසේ තමාට නුසුදුසු අය හා අතට අත දීමේ විපාකය සහ එහි දඬුවම ගැන විස්තර කරන කළ මුහම්මද් නබි තුමා මෙසේ අවවාද කළහ

لأن يطعن في رأس أحدكم بمخيط من حديد خير له من أن يمس امرأة لا تحل له

'තමාට නුසුදුසු කෙනෙකුගේ අත අල්ලනවාට වඩා ඔවුන්ගෙන් කෙනෙකු හිස මත කටටක් තියා ගැසීම වඩා හොදයි' (මුලාශ්‍රය : තබරානි). (මූලාශ්‍රය : අහ්මද්). මෙසේ නුසුදුසු අය හා අතට අත දීම අන් වලින් කෙරෙන දුරාචාරය බව මුහම්මද් තුමා නවත් වරෙක අනතුරු ඇඟ වූහ. ' කෙනෙකුගේ

දැසම දුරාචාරයෙහි හැසිරෙන් නේය. දැනද දුරාචාරයෙහි හැසිරෙන්නේය. ඔහුගේ රහස් අවයවයන්ද දුරාචාරයෙහි හැසිරෙන්නේය' යනුවෙන් මුහම්මද් තුමා අනතුරු ඇඟවූහ' (මූලාශ්‍රය : අහ්මද්). මුහම්මද් නබි තුමාගේ චරිතය ගැන එතුමාගේ බිරිදෙකු වන ආයිෂා තුමිය මෙසේ කියයි: ' අල්ලාහ් මත දිවරා පවසන්නම්. මුහම්මද් තුමාගේ අත (නම බිරිදන්ගේ හැර) කිසිදු කාන්තාව කගේ අතක් ස්පර්ශ කර නැත. ඔවුන් එතුමා සමඟ සම්මුතියකට පත් වනවා නම් වචන වලින් පමණක් සම්මුතියට එකඟ වෙති' (මූලාශ්‍රය: මුස්ලිම්). 'මුහම්මද් නබි තුමා වරෙක පැවසූහ

إني لا أُصافِحِ النساء

මා කිසිදු කාන්තාවකට අට අත දෙන්නේ නැත යනුවෙන්"

(මූලාශ්‍රය : අහ්මද්). තවත් වරෙක මුහම්මද් නබි තුමා පැවසූහ

إني لا أمس أيدي النساء

සෑම කෙනෙකු සමගම සුහදව ආශ්රය කරන, අපට වඩා උතුම් වූ මුහම්මද් නබි (සල්) තුමා පවා කිසිදු අවස්ථාවක කිසිදු කාන්තාවකගේ අතට අතදී සුභ පතා නැත.'මම කිසිදු කාන්තාවකගේ අතස්පර්ශ නොකරමි' යි (මූලාශ්රය: තබරානි ). لا توجد ترجمة ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී:

ولا والله ما مسَّت يدُ رسول الله صلى الله عليه وسلم يدَ امرأةٍ قطُّ، غيرَ أنه يُبايِعهن بالكلام.

"අල්ලාහ්ගේ දූතයාණන්ගේ දෑත කිසි විටෙක ස්ත්රියක් ස්පර්ශ නොකළ අතර ඔවුහු නබි තුමාණන්ට බයිඅත් හෙවත් පක්ෂපාතී බව ප්රකාශ කළේ වාචිකව දිවුරුම් දීමෙන්ය." (මූලාශ්රය: මුස්ලිම්). එහෙයින් ඉස්ලාම් දහමේ නීතින් මෙසේ වෙද්දී තම අතට අත දී සුභ නොපතන තම බිය බැති සීදේවි බිරිඳන් දික්කසාද කරන බවට අනතුරු අඟවන පිරිමින් අල්ලාහ්ට බිය බැතියෙන් කටයුතු කරපු

දෙන්. අතේ මේස් පැළඳගෙන අතට අත දිය හැකි බව වත් සමහරුන්ගේ මතය වේ.එසේ තම අත්වල මේස් පැළඳගෙන අතට අත දීමද ඉස්ලාම් දහමේ අනුමත නැති බව අප සියලු දෙනා දැන ගත යුතුය.එහෙයින් කිසිම හේතුවක් උඩ පිරිමින් තමාට අතට අත දීම නොකළ යුතුය.නුසුදුසු කාන්තාවන්ට අතට අත දීම නොකළ යුතුය.

## කාන්තාව සුවද විලවුන් තවරාගෙන නිවසින් පිටවීම

අද බොහෝ කාන්තාවන්, අනුන් මෝහනය විය හැකි තරම් වු ප්රිය විය හැකි තරම් වූ ඉස්තරම් සුවඳ විලවුන් ගෙන අන් පිරිමින් ගැවසෙන ස්ථානයන්හී ගැවසෙනු සාමාන්ය සිරිතක් බවට පත් කරගෙන සිටිති. එසේ සුවද විලවුන් තවරාගෙන හැසිරෙන කාන්තාවන් ගැන මුහම්මද් නබි (සල්) තුමා මෙසේ අනතුරු ඇඟ වූහ: ‘යම් කාන්තාවක් සුවද විලවුන් තවරාගෙන

පිරිමින් ඒ සුවද විඳිය යුතුය යන හැඟීමකින් ඔවුන් අතර ගැවසෙන්නේ නම් ඇය දුරාචාරයේ නිරත වූ කෙනෙකු වන්නාය' (මූලාශ්‍රය : අහ්මද්) මෙසේ බොහෝ කාන්තාවන් ඉස්ලාම් දහමේ සම්භාවණීය නීති උල්ලංඝනය කරමින් සුවඳ විලවුන් තවරා ගෙන තනිව තම රියදුරන් සමග පාසල් දොරටුව වෙළඳසැල්වල අය සමග සහ අනෙකුත් පිරිමින් අතර සාමාන්‍ය ලෙසින් හැසිරෙති. නමුදු සුවඳ විලවුන් තැවරූ කාන්තාවක් නිවසින් පිට වන්නේ නම් ඇය නා තමා තැවරූ සුවඳ ඉවත් කර ගෙන යායුතු බව මුහම්මද් නබි (සල්) තුමා අනතුරු ඇඟවූහ. නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් මෙසේ වදාළහ.

أيُّما امرأةٍ تطيَّبَت ثم خرَجَت إلى المسجد ليوجد ريحها لم يقبل منها صلاة حتى تغتسل اغتسالها من الجنابة

'යම් කාන්තාවක් සුවඳ විලවුන් තවරා ඉනික්බිති ඇය දේවස්ථානයට යන්නේ නම් ඇය අනිවාර්යයෙන්ම සුවඳ විලවුනේ

සුවඳෙන් පිරිසිදු වී යන තුරු ඇගේ වන්දනාමානය අනුමත වන්නේ නැත' (මූලාශ්‍රය : අහ්මද්) لا توجد ترجمة

වන්දනාමානය පිණිස දේවස්ථානයට යන කාන්තාව පවා තමා තවරා ගත් සුවඳ විලවුන ඉවත් වන අයුරු නා පිරිසිදුව යා යුතුව තියෙද්දී, මංගල උත්සවයන්හී සහ අනෙකුත් ස්ථානයන්හී උත්සව හෝ කටයුතු වලට සහ භාගි වන කල සුවඳ විලවුන් තැවරීම සහ සුවඳ දුම් වැනි දේ අල්ලා සුවඳවත් කර ගැනීම වැනි දෙයින් කාන්තාවන් තරයේ ඉවත්විය යුතුව ඇත. රමළාන් මාසයේ රෑ නැමදු මට දේවස්ථානය වෙත ගිය ද කාන්තාවන් සුවඳ විලවුන් තවරා ගන්නේ නම් වර්ණයෙන් තොර හැකි අයුරෙන් සුවඳ අඩු සුවඳ විලවුන් පාවිච්චි කිරීමට වග බලා ගත යුතු බව ඉස්ලාමීය නීතිරීති පැහැදිළි කරයි. එසේ අනුන් මෝහනය වන අයුරු සුවඳ විලවුන් තවරා දුදනෙහි

වැටීමෙන් අල්ලාහ් අප සියලු දෙනා ආරක්ෂා කරත්වා. لا توجد ترجمة لا توجد ترجمة

## කාන්තාව මහ්රම් හෙවත් පිරිමි ආරක්ෂාව නැතිව ගමන් කිරීම

නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහුඅලෙයිහි වසල්ලම්) මෙසේ පැවසූහ. ' කාන්තාව සුදුසු පිරිමියෙකුගේ ආරක්ෂාවක් නොවන්නට ගමන් නොකළ යුතුය'. (මුස්ලිම්) මුහම්මද් නබි (සල්) තුමාගේ ඒ මුදුවදන ආගමික කටයුත්තක් වන හජ් ඇතුළු සියලු ගමන් වලට වලංගු වන්නේය. කාන්තාවක් තනිව ගමන් කරන කල එය දුදනන්ට දුදන ක්රියාවන් කෙරෙහි උනන්දුවක් ඇති කරවන අතර, සමහර විට කාන්තාව නොමනා අතවර වලටද කරදර වලටද භාජනය වීමට ද හැකි වන්නේය. තවද ගුවන් ගමණක යෙදෙන කාන් තාවකට ඇය ගුවන් තොටු පොලට හැරලන්න කෙනෙ කද, ඇය සේන්දු වන ගුවන් තොටුපොලේ ඇය පිළිගෙන

කැඳවා ගෙන යන්න කෙනෙකුද සිටියා නම් ප්‍රමාණවත් යයි සමහරුන්ගේ මතය වේ. නමුදු ඇය ගුවනේ ගමන් කරන කල ඇයට අසල අසුනේ වාඩි වී ගමන් කරන්නේ කවරෙක්ද?

අහම්බෙන් හෝ ගුවන් නැව යන්ත්‍ර දෝෂයකට හෝ කාලගුණ දෝෂයකට හෝ පත් වූවා නම් ඒ ගුවන් නැව වෙනත් ගුවන් නොටු පොලකට ගොඩ බැස්ස වීමට සිදුවනු ඇත. එසේ සිදුවුවා නම් එවිට ඇයට යම් අකරතැබ්බක් ඇති නොවෙ යැයි කිව හැකිද? එහිදී දවසක් දෙකක් ගමන ප්‍රමාද වූවා නම් ඇයට ඇති ආරක්ෂාව කුමක්ද?

එසේ සිදු වූ සිදුවීම් ගැන අප බොහෝ විට අසා ඇත්තෙමු.

එහෙයින් කාන්තාවක් ගමනක් යන්නේ නම් සුදුසු පිරිමි ආරක්ෂාවක් සමඟ පිට වීමට වග බලා ගත යුතුය. කාන්තාවක් හා ගමන් කිරීමට සුදුසු පිරිමියා යනුවෙන් පවසන කල එය සිව

කොන්දේසිවලට යටත් වේ. ඔහු මුස්ලිම්වරයෙකු විය යුතුය, පරිනතවයට පත්වූ කෙනෙකු විය යුතුය, හොඳ සිහි බුද්ධියෙන් යුතු අයෙකු විය යුතුය, පිරිමියෙකු විය යුතුය. لا توجد ترجمة මෙම කරුණ විස්තර කරමින් මුහම්මද් තුමා මෙසේ දෙසූහ :

لا يحل لامرأة تؤمن بالله واليوم الآخر أن تسافر سفرا يكون ثلاثة أيام فصاعدا إلا ومعها أبوها أو ابنها أو زوجها أو أخوها أو ذو محرم منها

'(ඇගේ සැමියා හැරෙන්නට) කාන්තාවක් හා ගමන් කිරීමට සුදුසු වන්නේ ඇගේ ස්වාමියා, ඇගේ පියා, ඇගේ පුතා සහ ඇගේ සහෝ දරයා හෝ මහර්රම හෙවත් ඇය හා විවාහ බන්ධනයකට ඇතුල් නොවිය හැකි කෙනෙකු වන්නේය' (මුස්ලිම්)

## අන් කාන්තාවන් බැලීම

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්රකාශ කරයි.

قل للمؤمنين يغضوا من أبصارهم ويحفظوا فروجهم ذلك أزكى لهم إن الله خبير بما يصنعون

විශ්වාස වන්ත පුරුෂයනට තමන්ගේ බැල්මන් පහත හෙළන ලෙසද, තමන්ගේ රහස් අවයවයන් (දුදනෙන්) ආරක්ෂා කර ගන්නා ලෙසද (කියව). එය ඔවුනට ඉතා පිරිසිදු දෙයකි. ඇත්තෙන්ම ඔවුන් කරන දෙය අල්ලාහ් මනාව දන්නේමය'. ( 24 : 30) නබි (සල්) තුමාණන් වදාළහ.

... فزنا العين النظر ..

'ඇස්හී දුරාචාරය හරාම් වූ ඒවා බැලීම වේ'. නොවන්නට අල්ලාහ් හරාම් කළ ඒවා බැලීම වෙ'. (මූලාශ්රය : බුහාරි). නමුදු විවාහ වීමට බලාපොරොත්තු වන්නා තමා විවාහ වීමට බලාපොරොත්තු වන කාන්තාව බැලීම්, වෛද්ය වරයෙකු තමා වෙත පැමිණෙන රෝගියා බැලීම වැනි බැල්මන් අනුමත කළ හැකි ඒවා වේ. එසේම කාන්තාවක්ද අන්ය පිරිමින් උවමනාවෙන් හෝ රාග යෙන් බැලීම තහනම්ය. විස්තර කරනු වස් එය අල්කුර්ආනය මෙසේ පවසයි:

وقل للمؤمنات يغضضن من أبصارهن ويحفظن فروجهن

විශ්වාසවන්ත කාන්තාවන්ට තමන්ගේ බැල්මන් පහත හෙළන ලෙස ද, ඔවුන්ගේ රහස් අවයවයන් ආරක්ෂා කර ගන්නා ලෙසද කියව'. (අල්කුර්ආන් 24 : 31 ) එසේම තරුණයෙකු තවත් තරුණයෙකු දෙස ආශාවෙන් බැලීම ද, වැදගත් හේතුවක් නොවන්නට අන් අදහසකින් පිරිමියෙකු තවත් පිරිමියෙකුගේ රහස් අවයවයන් බැලීමද, එසේම කාන්තාවක් තවත් කාන්තාවකගේ සාමාන්‍ය යෙන් පිටට දර්ශනය වන අවයවයන් හැරෙන්නට අන් රහස් අවයවයන් බැලීමද, රාගාස්වාදය අරභයා ඒවා අතගෑමද ඉස්ලාම දහම තරයේ තහනම් කරයි.

لا توجد ترجمة

නමුදු සඟරාව වල, පත්‍රවල ඇති කාන්තාවන්ගේ පිංතූරු බැලිය හැකිය ඒවා තහනම් නැත යනුවෙන් කෙනෙකු තර්ක කළ හැකිය. එසේ කීවද එවැනි නොමනා අසභ්‍ය පිංතූර පවා

කෙනෙකුගේ සිත් තුල විරහතාපයක් සහ ආශාවන් ඇති කිරීමට හැකි නිසා ඒවාද තහනම් වේ. لا توجد ترجمة

## නිවස තුල අසභ්‍යත්වය ඇතුල් වීම

මුහම්මද් නබි තුමා අනතුරු ඇඟවූ බව අබ්දුල්ලාහ් බින් උමර් තුමා මෙසේ පවසයි:

ثلاثة قد حرم الله عليهم الجنة: مدمن الخمر والعاق والديوث الذي يقر في أهله الخبث

'අල්ලාහ් තුන් කොටසකට ස්වර්ගය හරාම් කර ඇත. ඔවුන්, අඛණ්ඩව මත්පැන් පානය කරන්නා, තම දෙමාපියන්ට හිංසා කරන්නා සහ නිවස තුල දුරාචාරය අනුමත කරන්නා (මූලාශ්‍රය : අහ්මද්).

වත්මනයේ අපගේ බොහෝ දෙනෙකුගේ නිවස තුල දුදන ක්‍රියාවන් ඇතුල් වීමට බොහෝ මාර්ග ඇරී ඇත. ඒවා විවිධ අදමින් වේ.ඒ මැයෙන් තම

නිවස තුල නොමනා අන්දමින් දුරාචාරය අනුමත කරන්නා.

බිරිඳ සමග හෝ තම වයසට පත් ගැහැණු ළමයින් සමග හෝ අන්‍ය පිරිමින් සමග කතා කිරීමට අවස්ථා ඇති කර දීම හෝ ඔවුන් අන්‍ය පිරිමින් හා එකට තනිව සිටීමට අවස්ථා ඇති කිරීම හෝ එසේ නොවන්නට තනි කාන්තාවක් රියදුරා සමග වාහනයේ ගමන් කිරීමට අනුමත කිරීම හෝ

එසේම උවමනාවක් පිණිස නිවසින් පිට වීමේද මුහුණ වැස්මක් නැතිව පිටවීමට අනුමත කිරීම

لا توجد ترجمة හෝ නුසුදුසු අසාභ්‍ය සිනමා, ගීත කැසට පටයන්, පත්‍ර සහ සඟරා වැනි දේ හෝ නිවසට ගෙන ඒම වැනික්‍රියා වන් නිවස තුලට දුරාචාරය අනුමත කිරීමට ඇති අවස්ථාවන් වේ. එහෙයින් තම නිවස සහ පවුලේ අය විනාශ මුඛයට ඇද දමන කටයුතු වලින් වැළකී සිටිය යුතුය.

# තමාට නොඋපන් ළමයා නම ළමයා බව කීම සහ තම පියා, පියා නොවන බව කීම

لا توجد ترجمة لا توجد ترجمة වත්මනයේ සමහර අය සුළු දෙවලට පවා ලෞකික ආදායම තකා තමාට කිසිදු අයුරකින් සම්බන්ධයක් නැති අය පියා ලෙස හෝ තම පුතා යනුවෙන් හෝ පවසනු අප අනන්තව අසා ඇත්තෙමු. තම පියා කුඩා කල සිටම තමාගේ කටයුත්තන් ඉටු නොකර නොසැලකිල්ලෙන් පසුවූ නිසා තම පියා හා උරණ වී ඔහු තම පියා නොවන බව පවසන දරුවන් ද අනන්තව දැකිය හැකිය. මේවා ඉස්ලාම් දහම අනුමත නොකරන ඉතා දුදන හැසිරීම් වෙ.

මෙසේ තම පියා, පියා නොවන බව පවසන කල

ඔහුට විවාහ වීමට හැකි අය පවා තහනම් වී තම පියා ගෙන් ලැබිය යුතු

සේසතේ උරුමක්කාර කමද නැති වී යැමට හැකිය.

මේ ගැන මුහම්මද් නබි තුමා තරයේ අවවාද කර දෙසූ බව

සඅද් බින් අබීබක්ර් තුමා මෙසේ පවසයි:

من ادعى إلى غير أبيه وهو يعلم فالجنة عليه حرام

'කෙනෙකුගේ පියා අසවලා නොවන බව දැනගෙනත් ඔහු තම පියා ලෙස යමෙක් පවසන්නේ නම් ඔහුට ස්වර්ගය හරාම් වේ

(මූලාශ්රය : බුහාරි). لا توجد ترجمة එසේම දම්පතීන් අතර සණ්ඩු දබර වැඩි වී සැමියා ඇයට බැන වැදීම පිණිස ' අසවල් ළමයා මගේ නෙවෙයි එය ඔබ වෙන කාටදෝ වැදුවා' යනුවෙන් පැවසීමද, තවත් සමහර අවස්ථාවන්හිදී දුරාචාරයෙන් තමාට ලැබුණු ළමයා තම සැමියාට දාව උපන් ළමයා යනුවෙන් පවසන කාන්තාවන් ද අප අතර දැකිය හැකිය. මෙසේ කීම ඉස්ලාම් දහම තරයේ

හෙළා දකී. සුළු හේතූන් නිසා දම්පතීන් තමන් අතර ශාප කර ගැනීම ගැන අවවාද කරමින් අල්කුර් ආනයේ වදනක් පහළ වූ අවස්ථාවක, මුහම්මද් නබි තුමා එය විස්තර කළ ආකාරය අබූ හුරෛරා තුමා මෙසේ විස්තර කරයි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්‍රකාශයට තමන් සවන් දුන්නේය

أيُّما امرأةٍ أدخلَت على قومٍ من ليس منهم فليست من الله في شيء ولن يدخلها الله جنته، وأيما رجل جحد ولده وهو ينظر إليه احتجب الله منه وفضحه على رؤوس الأولين والآخرين

"යම් කාන්තාවක් තම පවුලට අයත් නැති කෙනෙකු තම පවුලේ කෙනෙකු යැයි පවසන්නේ නම් අල්ලාහ් කෙරෙහි ඇයට කිසිදු අයිතිවාසිකමක් නැත. තවද අල්ලාහ් ඇය ස්වර්ගයට ඇතුල් කර ගන්නේද නැත. තවද, යමෙකු තම පුතා දෙස බලා 'ඔබ මගේ පුතා නොවෙයි' යනුවෙන් පවසන්නේ නම් පරමාන්ත දිනයේ අල්ලාහ් ඔහුගේ වගකීමෙන් ඉවත්

වී සියල්ල ඉදිරියෙහි ඔහු ලැජ්ජාවට පත් කරනු ඇත (මූලාශ්‍රය , අබූ දාවූද්)

## පොලිය

මිනිසාගේ දුදන ක්‍රියාවන්ගෙන් පොලියද දරුණු පාප කර්මයකි. අනෙක් පව කෙසේ වුව ද, අල්ලාහ් පොලිය ගෙන අනුභව කරන්නන් හා පමණක් යුද්ධ කිරීමට අභියෝග කරයි. ඒ ගැන අනතුරු අඟවමින් කුර්ආනය මෙසේ විස්තර කරයි:

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

يَا أَيُّهَا الَّذِينَ آمَنُواْ اتَّقُواْ اللّهَ وَذَرُواْ مَا بَقِيَ مِنَ الرِّبَا إِن كُنتُم مُّؤْمِنِينَ فَإِن لَّمْ تَفْعَلُواْ فَأْذَنُواْ بِحَرْبٍ مِّنَ اللّهِ وَرَسُولِهِ

විශ්වාසවන්තයිනි, අල්ලාහ්ට බියවව. ඔබ (සත්‍ය) විශ්වාස වන්තයින් නම් අල්ලාහ්ට බියවී ඔබට අය විය යුතු ඔබගේ මුදල හැර) පොලියෙන් (පෙර ලබා ගත් දේ හැරෙන්න, පොලියෙන් ) ඉතිරි ඒවා නොගෙන අත්හරිව්. එහෙයින් (ආඥා කළ අයුරු) ඔබලා ක්‍රියා නොකරන්නේ

නම් අල්ලාහ් වෙතින්ද ඔහුගේ වක්තෘවරයා වෙතින්ද සංග්‍රාමයකට දැනුම් (දුන් බව) ප්‍රසිද්ධකර ඇත (බව දැනගනිව). (අල් බකරා: 278,279) පොලි කරන්නන් හට අත් විය හැකි දරුණු විපාකය ගැන පැහැදිලි කිරීමට අල්කුර්ආනයේ මේ එක් වාක්‍යම සෑහේ. لا توجد ترجمة لا توجد ترجمة වත්මනයේ පොලිය නිසා දුක් විඳින දුගියන් සහ අසරණයන් අපමණය.එසේම පොලියට තමා ලබා ගත් ණය පියවා ගන්නට බැරි වෙළඳ මධ්‍යස්ථාන අඩපන වී වෙළඳ සැල්වල හිමිකරු වන් භාණ්ඩ වල මිල අධික කර, තවත් සමහර සමාගම් සහ බොහෝ ප්‍රශ්න වලට මුහුණ දී ඇති අයුරු අප සැමදින දකිනා දර්ශනයක් බවට පත්වී ඇත. لا توجد ترجمة لا توجد ترجمة මෙයද අල්ලාහ් අල්කුර ආනයේ පෙර සදහන් කළ සංග්‍රාමය හා සමාන සංග්‍රාමයක් වේ. තවද පොලි කිරීමේ කාර්යයෙහි නිරත වන්නන් මතු සඳහන් මුහම්මද් නබි

තුමාගේ කියමන අනුව ශාපයට පත් වූවන්ය. ජාබිර් (රළි) තුමා වාර්තා කරයි

لعَنَ رسول الله صلى الله عليه وسلم آكل الربا وموكله وكاتبه وشاهديه، وقال: هم سواء

'පොලී කන්නාද, එසේ පොලී කන්නට සළස් වන්නාද, එය ලියන්නාද, එයට සාක්කි කියන්නාද දඬුවමෙහි සමාන අය වේ' (මූලාශ්‍රය: මුස්ලිම්).

මෙලෙසින් බලන කල පොලියට මුදල් දෙන්නාද, පොලියට ගන්නාද, එය සටහන් කර ගණන් තබන්නාද, එයට සාක්කි කියන්නාද, එයට ආරක්ෂා සපයන්නාද පොලිකරණයට හවුල් අය හෙයින් පොලී සමග වූ එවන් සියලූ කටයුතු ද කිරීම තහනම් ඒවා වේ.

තවත් වරෙක මුහම්මද් නබි තුමා පොලියේ දරුණුකම ගැන මෙසේ අවවාද කළ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් තුමා මෙසේ විස්තර කරයි.

الربا ثلاثة وسبعون بابا أيسرها مثل أن ينكح الرجل أمه، وإن أربى الربا عرض الرجل المسلم

'පොලියට දොරවල් හැත්තෑ තුනකි. එයින් ඉතාම ලිහිල් දොරටුව කෙනෙකු තම මව විවාහ කර ගන්නා සේය. ඉතාම දුදන දේ තම මුස්ලිම් සහෝදරයා ගැන කේලාම් කීම වේ' (මූලාශ්‍රය හාකිම්). තවද මුහම්මද් මෙසේ විස්තර කළ බව අබ්දුල්ලාහ් බින් හන්ලලා තුමා විස්තර කරයි.'

دِرهم ربا يأكله الرجل وهو يعلم أشد من ستة وثلاثين زنية

යමෙකු දැනගෙනම පොලියෙන් එක් දිර්හමක් පමණ දේ හෝ අනුභව කිරීම තිස්හය වතාවක් දුරාචාරයේ හැසිරෙනවා හා සමාන වේ (මූලාශ්‍රය : අහ්මද්) لا توجد ترجمة لا توجد ترجمة තවද පොලිය නිසා බොහෝ දෙනෙකු අලාභයට පත්ව ඇති අතර, පොලී ගන්නන්ගේ මුදල් තත්ත්වය භාහිරව ඉහළ ගියද එහි කිසිදු අනුග්‍රහයක් හෝ සමාධියක් හෝ නැත බව අප දැක ඇත්තෙමු. මේ ගැන මුහම්මද් නබි තුමා මෙසේ අවවාද කළහ:

الربا وإن كثُر فإن عاقبته تصيرُ إلى قِلٍّ

'පොලියෙන් ලැබෙන මුදල අධික වුවද පසුව එය අඩු වී ගෙන යනු ඇත' (මූලාශ්‍රය හාකිම්). لا توجد ترجمة

لا توجد ترجمة

لا توجد ترجمة

මෙවන් දුෂ්ක්‍රියාවෙහි නිරත වූවන් තම ණය මුදල පමණක් අය කර ගැනීමට තීරණය කර පොලි ගැනීමෙන් ඉවත් වී පව සමා අයැද තමන් ආරක්ෂා කරගත යුතු බව අල්ලාහ් අල්කුර් ආනය මෙසේ විස්තර කරයි :

فإن تبتم فلكم رؤوس أموالكم لا تظلمون ولا تظلمون

" ඔබලා පවසමා අයැද (පොලි කිරීමේ පවෙන්) මිදුනේ නම් ඔබගේ මුදලේ මුල් මුදල (ඔබට අයවිය යුතු) ය. ( එසේ කළා නම්) ඔබලා (ණය කාරයන්ට) අපරාධ නොකළහුය. ඔබලාටද අපරාධ නොකරනු ලබනු ඇත. (2 : 279) පොලීගත් අයගේ අවසාන තීන්දුව මෙය බව ඉස්ලාම් නිරසාරව කියා සිටී. එහෙයින්

පොළී කිරීමේ වෘත්තියේ නිරතව සිටින්නේ කවරෙක් ද ඔවුන් එහි අනතුර වටහාගෙන වහා එයින් වැළකිය යුතුය. තවද සොර බිය සහ විනාශය වැනි අන්ත්‍රාවන් නිසා සමහරු නම් මුදල බැංකුවල තැන්පත් කරන අතර ඒවාට බැංකුවෙන් පොලියක්ද ලැබෙනු ඇත. එසේ තැන්පත් කරන්නන් අප අතර බහුලව සිටින නමුත් මැරුනු සතුන්ගේ කුණප කන බව සිතා අල්ලාහ්ගෙන් පවට සමා අයැද බැංකුවේ තැන්පත් කිරීමෙන් වැළකී තම මුදල් ආරක්ෂා කර ගැනීමට අන් මගක් සොයා ගත යුතුය. لا توجد ترجمة එසේම තම මුදලට වැඩි වී ඇති පොලි මුදල් දන් දීමට හෝ ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවසට උවමනා භාණ්ඩ මිලදී ගැනීමට හෝ ගෙවල් කුලි දීමට හෝ තම දෙමාපියන්ට හෝ තම බිරිදට සහ ළමයින්ට වියදම් කිරීමට හෝ සකාත් ලෙස හෝ අනෙකුත් රටේ නියමිත බදු ගෙවීම පිණිස හෝ පාවිච්චි නොකළ

යුතුය. එහෙයින් පොලී කෙරෙහි අල්ලාහ්ට බිය වී පොලියෙන් ලැබුණු මුදල් පිනක් බලාපොරොත්තු නොවී අන් අයුරින් වියදම් කළ යුතු අතර මින් පසු පොලියට හවුල් නොවන තරයේ අධිෂ්ඨාර ගත යුතුය.

## වෙළඳ ද්‍රව්‍යයේ පළුද්ද හංගා විකිණීම

مرَّ رسول الله صلى الله عليه وسلم على صبرة طعام، فأدخلَ يدَه فيها فنالَت أصابعه بللًا، فقال: ما هذا يا صاحب الطعام ؟ قال: أصابته السماء يا رسول الله قال أفلا جعلته فوق الطعام كي يراه الناس ؟ من غش فليس منا

වරෙක මුහම්මද් නබි තුමා ආහාර ද්‍රව්‍ය අලෙවි කරන කඩ මණ්ඩිය අසලින් ගමන් කරමින් සිටියහ. එහිදී වෙළඳාම් කරමින් සිටි තැනකට ගොඩ වී එහි අලෙවිය. සදහා තබා තිබුණු ආහාර මලු තොගයක් දැක එහි එක් මල්ලක් ඇතුලට තම අත දැමූහ. එවිට ඒ ආහාර මල්ලේ යට තෙත ගතියක් එතුමාගේ අතට දැනුණි. පසුව එතුමා එසේ තෙතමනයක් වූ හේතුව ගැන වෙළෙඳා ගෙන් විමසූහ.

එයට විකුණුම් කරුවා ඒවා වැස්සට තෙමුනු බව උත්තර දුන්නේය. එයට මුහම්මද් නබි තුමා 'එසේ නම් ඒවා මිනිසුන්ට පෙනෙන අයුරු උඩට තබා වෙළඳම් කළ යුතු නොවෙද ' යි පවසා 'අපට දෝහිකම් කරන්නේ කවරෙක්ද ඔහු අපගේ කෙනෙකු නොව' යනුවෙන් ඔහුට අනතුරු අඟවන විලසින් පැවසූහ.

(මූලාශ්‍රය : මුස්ලිම්) අපගෙන් බොහෝ දෙනෙකු තම වෙළඳ භාණ්ඩ වල යම් පළුද්දක් හෝ නුසුදුසු කමක් හෝ වූවද, ඒවා මල්ලේ හෝ පෙට්ටියේ හෝ යටට තබා හංගා එහි මතුපිට හොඳ දේ අතුරා හෝ لا توجد ترجمة لا توجد ترجمة වාහන වැනි දේ විකිණීමේදී එවා ඒ වෙලාවට පමණක් ක්‍රියා වන අයුරු තබා, ගැනුම් කරුවා පසුව එහි ඇති දොෂය හෝ නුසුදුසුකම හෝ දැක ආපසු රැගෙන ආවද මෙය ඔබ කළ දෙයක් නොවන්නට අප එසේ නොහොඳ දේ අලෙවි කළේ නැහැ යනුයෙන් ප්‍රතික්ෂේප කරනු අප

අනව අසා ඇත්තෙමු. සමහර භාණ්ඩවල අවසන් දිනය සඳහන් කර තිබුණද, ඒවා වෙනස් කර හෝ, පදවා සුදුසුදැයි පරීක්ෂා කිරීමට අවස්ථාවක් හෝ නොදී වෙළඳම් කිරීම අද සර්ව සාදාරණ බවට පත්ව ඇත. එසේ ක්රියා කිරීම ඉස්ලාම් දහම කිසිවිටෙක අනුමත නොකරන බව තරයේ සිතේ තබා ගත යුතුය. මෙවැනි වංචාවන් ගැන මුහම්මද් නබි තුමා මෙසේ අනතුරු ඇඟ වූහ:

المسلم أخو المسلم و لا يحل لمسلم باع من أخيه بيعا فيه عيب إلا بينه له

'මුස්ලිම්වරයෙකු අනෙක් මුස්ලිම්වරයෙකුගේ සහෝදරයෙකු වේ. එහෙයින් ඔහු අලෙවි කරන දේහී යම්දෝෂයක් වී නම් එය විස්තර නොකර ඔබ සහෝදරයාට විකුණන්න එපා' (මූලාශ්රය : ඉබ්නුමාජා). තවත් සමහර වෙළෙඳුන් සමහර ද්රව්යයන් පෙන්වා මෙහි හොඳ දේ ඔබලාම තොරා ගන්න යනුවෙන් පවසා ඔහු පළුදු දේ ගත් කළ එයට මා වගකියන්නේ නැහැ ඒ ගැන

තමා නොදන්නේ බවත් පවසා තම යුතුකමෙන් සහ වගකීමෙන් ඉවත් වෙති. එසේ කිරීම වෙළඳාමේ අනුග්රය සහ සමෘධිය විනාශ කරනු ඇතැයි මුහම්මද් නබි තුමා මතු සඳහන් මුදුවදනින් විස්තර කර ඇත. 'විකුණුම් කරුවා සහ ගැණුම් කරුවා ඒ ස්ථානයෙන් ඉවත් නොවී සිටින තෙක් යම් භාණ්ඩයක තෝරා ගැනීමේ (ප්රතික්ෂේප කිරීමේ) අයිතිවාසිකම් ලත් අය වේ. ඔවුන් (එහි ඇති අඩුපාඩු විස්තර කර) ඇත්ත කියා වෙළදාම් කරන්නේ නම් ඔවුන්ගේ වෙළදාමෙහි බරකත් වේ. එහි ඇති අඩු පාඩු හංගා වෙළදාම් කරන්නේ නම් එහි වන බරකත් විනාශ වනු ඇත. (මූලාශ්රය : බුහාරි).

## වෙළෙඳාම් කිරීමේ කතාබහෙහි ප්රෝඩාව

යම් භාණ්ඩයක් මිලදී ගැනීමට අදහස් නොකර භාණ්ඩයේ මිල අධික කර තමාට ලැබෙන කොමිස් මුදල වැඩිකර ගැනීමේ අදහසින් අනුන් රැවටීම උදෙසා මිල

අධිකව ඉල්ලීම ඉස්ලාම් දහම තරයේ හෙළා දකී. මෙසේ මුදල් ඉපයීමද අනුන් රැවටීමේ ක්‍රියාවකි. මේ ගැන මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ

لا تناجَشوا

'ඔබලා භාණ්ඩය මිලදී ගැනීමේ අදහසක් නැතිව එහි මිල අධික නොකරනු (මූලාශ්‍රය : බුහාරි). භාණ්ඩය ගැනීමේ අදහසින් තොරව මිල වැඩි කිරීමට ඉල්ලීම වංචා කිරීමකි. වංචා කරන්නන් ගැන

මුහම්මද් නබි තුමා මෙසේ අනතුරු ඇඟවූහ:

المكر والخديعة في النار

' වංචාව සහ රැවටීම නිරයට ගෙන යයි.

لا توجد ترجمة පරණ භාණ්ඩ සහ වාහන විකුණන අනෙකුත් වෙළඳ ස්ථානයන්හී බ්‍රෝකර වැඩෙහි යෙදෙන්නන්ගේ ඉපයුම හරාම් වේ. මන්දයත් වෙළඳ කටයුතු වල නිරත වනවා යනුවෙන් පවසමින් ඔවුන් ඉස්ලාම් දහම

නොඅනුමත බොහෝ කටයුත්තන්හී නිරත වෙති.

තවද ගැනුම් කරුවන් රැවටීම පිණිස අතර මැදියෙකු ලෙස ක්රියා කරති. ඒ භාණ්ඩවල මිල අඩු වැඩි කරන්නද ඔවුන් මැදි වී බොරු කියති.

නමුදු වෙළඳ භාණ්ඩය තමාගේ නම් එයට විරුද්ධව කටයුතු කරති. ඔවුන් අල්ලාහ්ගේ අසරණයන් රවටා ඔවුන්ට අපරාධ කිරීමට ඉදිරිපත් වන හෙයින් එය ප්රසිද්ධියේ පාප කරමයෙහි නිරත වීමක් වේ.

**ජුඅා දිනයේ දෙවැනි ඇමතුමෙන් පසු වෙළදාම .ජුම්අාඅාදිනයේ ජුම්අා සලාතය වෙනුවෙන් දේවස්ථානයේ දෙවැනි අදාන් ඇමතුමද කළ පසු එය නොනකා වෙළදාමෙහි නිරත වන්නන් ගැන**

## අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

يَا أَيُّهَا الَّذِينَ آمَنُوا إِذَا نُودِي لِلصَّلَاةِ مِن يَوْمِ الْجُمُعَةِ فَاسْعَوْا إِلَى ذِكْرِ اللَّهِ وَذَرُوا الْبَيْعَ ذَلِكُمْ خَيْرٌ لَّكُمْ إِن كُنتُمْ تَعْلَمُونَ

විශ්වාසවන්තයිනි, (සිකුරාදා) ජුම්ආ දිනයේ නැමදුමට කැඳවනු ලැබූ කළ වෙළෙඳාම් (අත්හිටුවා) තබා අල්ලාහ් ද්‍යාන කරනු වස් (දේවස්ථානයන් වෙත) වහා යමව.ඔබලා දැන සිටියා නම් එය ඔබලාට ඉතා හොඳය'. (අල් කුර්ආන් 62:9) තවද අප සමාජයේ වෙළෙඳුන්ගෙන් බොහෝ දෙනෙකු සිකුරාදා දිනයේ ජුම්ආ නැමදුමට දෙවැනි ඇමතුම කළ පසුවද තම වෙළඳ සැල්වල දොර විවෘත කරගෙන හෝ නොවන්නට දේවස්ථාන ඉදිරියෙහි වෙළදාම් කරමින් හෝ පසුවනු සාමාන්‍ය සිරිතක් බවට පත්ව ඇත. මෙය එතරම් සුදුසු ක්‍රියාවක් නොව. لا توجد ترجمة لا توجد ترجمة තවත් සමහරු

සේවාස්ථානයේ සේවයෙහි නිරත වන ලෙස තම සේවකයන්ට අණ කර ඒ නැමදුම් වෙලාවෙද බිය බැති සේවකයන්ගේ නැමදුම පාලු කර ලාභ ලබා ගැනීමට උත්සාහ කරති. නමුදු ඉස්ලාම් දහම තහනම් කරන දේහී නිරත වෙමින් ඔහු ලබන ලාබයට වඩා විශාල පාඩුවක් විදීමට සිදුවන බව ඔවුන් වටහා ගැනීමට අපොහොසත් වන්නෝය. නමුදු සේවකයන් ද තම සේවාස්ථානයේ නියමුවා කුමක් කීවද ඉස්ලාම් දහම පවසන අන්දමින් අල්ලාහ්ගේ ආඥාවන් හට කීකරු වී ක්රියා කිරීමට උත්සාහ කළ යුතුය.මුහම්මද් නබි තුමා මෙසේ අනතුරු අඟවා ඇත.

لا طاعة لبشر في معصية الله

'ඔබලා අල්ලාහ්ට විරුද්ධව (අණ) කරන දේහී මිනිසුන්ට කීකරු නොවව' (මූලාශ්රය : අහ්මද්).

## සූරාව

වත්මනයේ මුස්ලිම් සමාජය අතර සූදු කෙළිය සරව සාදාරණය ව්‍යාප්ති ඇත. සූදු කෙළිය අති දුදන ක්‍රියාවක් බව ඉස්ලාම් දහම තරයේ කියා සිටී. සූදුව විවිධ මාදිලියේ විවිධ මටටමින් මිනිසුන් අතර රජ කරයි. ඒ ගැන අල් කුර් ආනය මෙසේ විස්තර කරයි :

يَا أَيُّهَا الَّذِينَ آمَنُواْ إِنَّمَا الْخَمْرُ وَالْمَيْسِرُ وَالأَنصَابُ وَالأَزْلاَمُ رِجْسٌ مِّنْ عَمَلِ الشَّيْطَانِ فَاجْتَنِبُوهُ لَعَلَّكُمْ تُفْلِحُونَ

විශ්වාස වන්තයිනි, සැබැවින්ම මත්පැන් පානයද, දු කෙළියද, (ඇදහීම් පිණිස තබා ඇති) පිළිරුද, හී විදීම ද නිමිති බැලීමද, පිළිකුල් සහගත ෂයිතාන්ගේ වැඩ වලින් නරක දේමය. එහෙයින් ඔබලා ජයග්‍රහකයින් වනු වස් එයින් වැළකෙව්'.

(අල්කුර්ආන් 5 : 90)

لا توجد ترجمة

لا توجد ترجمة

لا توجد ترجمة

لا توجد ترجمة لا توجد ترجمة لا වත්මනයේ අපගෙන් බොහෝ දෙනෙකු දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ දුප්පත් - ධනවත් භේදයකින් තොරව විවිධාකාර සූදු කෙළියෙහි නිරත්ව සිටිනු දැකිය හැකි සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. ඒවායෙන් සමහරක් මෙසේ වේ: 1. මුදල් ගෙවා සමහර ඉලක්කම් ලබා පසුව එය ලොතරයි ඇදීමෙන් පසු

වාසනාව ලබන්නන් හට පළමු වැන්නා දෙවැන්නා යනුවෙන් පිළිවෙලින් තෑගි පිරිනැමීම.

2 لا توجد ترجمة. යම් වෙළඳ භාණ්ඩයක් අලෙවි කිරීමේදී එහි යම් ඉලක්කමක් හෝ ලාංඡනයක් හෝ රූප හෝ තබා ඒ අනුව ලොතරැයි ඇද තෑගි දීම. لا توجد ترجمة

لا توجد ترجمة

3. වෙළඳාම, මිනිස් ජීවිත, වාහන සහ වෙළඳ ද්‍රව්‍යයන් වැනි දේවල් වෙනුවෙන් රක්ෂණ කිරීම.

لا توجد ترجمة

لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة

لا توجد ترجمة

لا توجد ترجمة لا توجد ترجمة

## සොරකම

සොරකමට අයත් දඬුවම ගැන පහදමින් අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

وَالسَّارِقُ وَالسَّارِقَةُ فَاقْطَعُواْ أَيْدِيَهُمَا جَزَاء بِمَا كَسَبَا نَكَالاً مِّنَ اللّهِ وَاللّهُ عَزِيزٌ حَكِيمٌ

සොරකම් කළ පිරිමියෙක් හෝ ගැහැණියෙක් හෝ ඔවුන් දෙදෙනා උපයාගත් දෑය හේතු කොටගෙන අල්ලාහ්ගේ (ආදර්ශමත්) දඬුවමක් ඔවුන්ගේ අත් සිඳලව්.අල්ලාහ් බලසම් පන්නය. නුවණැතිය'. (5 : 38)

සොරකමෙන් දරුණුම සොරකම වේ.

හාජිවරුන්ගේ සහ කඃබා දේවස්ථානයේ පාලකයන්ගේ සහ සේවකයන්ගේ සේසත් සොරකම් කිරීම لا توجد ترجمة

මුහම්මද් නබි තුමා නම් සූරය ග්රහ නැමදුම ගැන පවසන කළ මෙසේ පැවසූහ:

لقد جِيء بالنار وذلكم حين رأيتموني تأخَّرتُ مخافةَ أن يُصيبيني من لفحها، وحتى رأيت فيها صاحب المحجن يجر قصبه [أمعاءه] في النار، كان يسرق الحاج بمحجنه [عصا معقوفة الطرف] فإن فطن له قال: إنما تعلق بمحجني، وإن غفل عنه ذهب به

' මා නැමදුමෙහි පසුවන කල මට නරකාදිය පෙන්වන ලදී. එහි ජවලින ගින්න මට විනයක් කරනු ඇතැයි බිය වූ නිසා මම එයින් මදක් පසුබට වුනෙමි. (මා පසුබට වනු ඔබලා දිටුහ). තවද සැරයටියක් හා සිටින කෙනෙකු එයින් තම බඩවැල නිරයේ ඇදගෙන යන අයුරු ද දුටුවෙමි. සැරයටියෙන් හාජිවරුන්ගේ සේසත් සොරකම් කළ තැනැත්තා ඔහුය. ඔහු එසේ සොරකම් කිරීම යමෙකු දිටී නම් එය අහම්බෙන් තම බස්තමට පැටලී ආ දෙයක් යැයි කියා තම ක්රියාව මැඩ පවත්වා ගන්නේය. කිසිවෙකු නො දුටුවා නම් ඒ දේ රැගෙන යනු ඇත.

(මූලාශ්‍රය : මුස්ලිම්) තවත් සමහරු සොරුන් මහජන සේසත් සොරකම් කරන සේ තමන්ටද රැගෙන යා හැකි යැයි පුහු වදන් දොඩමින් සොරකම් කරති. නමුදු ඔවුන් තම සහෝදර මුස්ලිම් වරුන්ගේ සේසත් සොරකම් කරන බව මතක තබා ගත යුතුය. لا توجد ترجمة තවත් සමහරු නොමුස්ලිම්වරුන්ගේ සේසත් සොරකම් කළ හැකිය යනුවෙන් පවසා එසේ ඔවුන්ගේ සේසත් සොරකම් කරති.නමුදු ඉස්ලාම් දහම සියලු මාදිලියේ සොරකම් තහනම් කර ඇති බව මතක තබා ගත යුතුය. නමුදු කෙනෙකුට ලබාගත හැකි සේසත් වන්නේ ඉස්ලාමයට විරුද්ධව සටනට සහභාගි වන සතු රන්ගේ යුද්ධයෙන් ලැබෙන සේසත් බව ඉස්ලාම් දහම පවසයි. නමුදු නොමුස්ලිම් වුවද අනුන්ගේ හෝ අහිංසකයන්ගේ හෝ සේසත් අනිසි ලෙස ලබා ගැනීමට හෝ මාකොල්ල

කැමට හෝ ඉස්ලාම් දහම කිසිවිටෙක අනුමත නොකරයි.

لا توجد ترجمة

لا توجد ترجمة තවත් සමහරු බසයේ, සෙනග වැඩියෙන් ගැවසෙන ස්ථානවල, ගෙවල් වල සහ لا توجد ترجمة වෙළඳ සැල්වල සොරකම් කරති. ඒවාට රිංගා මාකොල්ල කති. සාමාන්‍ය ලෙස බැරිවූ විට ආයුධ පෙන්වා බියගන්නා සොරකම් කරති. එසේම වෙළඳ සැල්වල භාණ්ඩ තම සාක්කුවෙ හෝ තම ඇඳුමේ හෝ හංගා ගෙන යන කාන්තාවන්ගේ ක්‍රියාවන් සාමාන්‍ය සිදුවීමක් බවට පත්ව ඇත. එසේම මිල අධික නො වූ සාමාන්‍ය දේ සොරකම් කළ හැකිය යනුවෙන්ද සමහර කාන්තාවන්ගේ අදහස වේ. ලාබ හෝ මිල අධික හෝ වේවා, මේවා සියල්ල සොරකම් බවත් ඒවා ඉස්ලාම් දහම කිසිසේත් අනුමත නොකරන බවත් එයට ලැබිය යුතු දඬුවම ගැනත් මුහම්මද් නබි

තුමාගේ මතු සඳහන් මුදුවදන පැහැදිලි කරයි :

لعن الله السارق يسرق البيضة فتقطع يده ويسرق الحبل فتقطع يده

'බිත්තරයයක් සොරකම් කරන්නාගේ අත්ද, ලනුවක් සොරකම් කරන්නාගේ අත්ද සිඳිය යුතුය' (මූලාශ්රය : බුහාරි). එහෙයින් සොරකමේ යෙදුනු අය තමා සොරකම් කළ දේ අයිතිකරුවන් වෙත කෙළින් හෝ කිසිවෙකුට නොදැනී හෝ තුන්වැන්නා මගින් හෝ ආපසු දී සොරකමට අල්ලාහ්ගෙන් පුසමා අයැදිය යුතුව ඇත. එසේ කිරීමට නොහැකි නම් ඒ සඳහා දන් දී ඒ දන සොරකමට භාජනය වූ තැනැත්තාට පින් ලෙස පැවරිය යුතුය.

## පගාව දීම සහ ගැනීම

සත්ය වසන් කිරීමටද, දුදන ක්රියාවන් වපුරන්නට ද සමහර නීතිඥයන් සහ විනිසුරුවන් හට පගාව දීම සහ දීමට උත්සාහ කිරීම මහජනයන් අතර අයුක්තිය සහ අනුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කරන්නටත් ගන්නා

වැයමකි. මෙයද ඉස්ලාම් දහම තරයේ හෙළා දකින දුදන ක්රියාවකි. ඒ ගැන අනතුරු අඟවමින් අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

وَلاَ تَأْكُلُواْ أَمْوَالَكُم بَيْنَكُم بِالْبَاطِلِ وَتُدْلُواْ بِهَا إِلَى الْحُكَّامِ لِتَأْكُلُواْ فَرِيقًا مِّنْ أَمْوَالِ النَّاسِ بِالإِثْمِ وَأَنتُمْ تَعْلَمُونَ

' තවද, ඔබ අතර එකා අනෙකාගේ සේසත් අයුතු අන්දමින් අනුභව නොකරන්න. තවද ඔබලා දැන දැනම අනුන්ගේ දේපල වලින් (කිසිදු) කොටසක් අපරාධයෙන් භුක්ති විදීමට (පගාව දීම පිණිස) විනිසුරු (නිලධාරී) න් වෙත සමීපනොවව්'. (අල්කුර්ආන් 2 : 188) අබූ හුරයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී

لعن الله الراشي والمرتشي في الحكم

විනිශ්චය වෙනුවෙන් පගාව දෙන්නා සහ පගාව ගන්නා යන දෙන්නාටම අල්ලාහ්ගේ ශාපය අත්වේ ' (මූලාශ්රය : අහ්මද්). لا توجد ترجمة වත්මන් සමාජයේ පගාව දීම සරව සාදාරණව පවතී.

සමහර සේවකයන්ගේ සහ නිළදාරීන්ගේ පඩියට වඩා ඔවුන් ලබන පගාව අති විශාල බවට පත්ව ඇත. පගාව බොහෝ සමාගම්හී අය වැයේ කොටසක් බවට පත්ව ඇති නමුදු ඒවා වෙන නමකින් එහි ක්‍රියාවෙහි පවතින්නේය. පගාවක් නැති ආරම්භයක් හෝ අවසානයක් හෝ නැති කිසිදු වෙළඳ කටයුත්තක් නැති තරමට පගාව වත්මනයේ බහුලව පවතී. එහෙයින් පගාව නිසා කිසිවක් කර ගන් නට බැරිව බොහෝ දුප්පතුන් කරදරයට පත්ව ඇති අතර බොහෝ කටයුතු ඇනහිටිමින් පවතී. සමහර කම්කරුවන්ගේ නොමනා හැසිරීම්වලට මෙය හේතුවකි. එසේම පගාව දුන් අයට නොවන්නට අන් කිසිවෙකුට යුක්ති සහගත සේවයක් බලාපොරොත්තු විය නොහැකි තත්ත්වයක වත්මන් සමාජය පත්ව ඇත.

පගාවක් දීමට කැමැති නොවන්නට තම කටයුතු ප්‍රමාද වන අතර,

සමහරවිට ඒ කාර්යය සපුරා ගැනීමට නොහැකි තත්ත්වකට හෝ අඩු ලුහුඩින් සේවය නිමවන තත්ත්වයකට හෝ ප්‍රමාද වී කෙරෙන තත්ත්වයකට හෝ පත්ව ඇත.පගාව දෙන්නා තම කටයුතු, පෙර පැමිණිය අයට වඩා ඉතා ඉක්මණින් කරගෙන යයි.

පගාව නිසා සමාගම් වලට ලැබිය යුතු බොහෝ ලාබ එහි අතරමැදියන්ට සහ කොමිස් කරුවන් හට යයි. ඒ නිසා, පගාව ගන්නා සහ එයට සියලු මාර්ගයේ සම්බන්ධ අය වැනි සියලු දෙනා අල්ලාහ් තම අනුග්‍රහයේ සිට දුරස්ථ කළ යුතු බව ترجمة توجد لا එය විස්තර කරමින් අබ්දුල්ලාහ් බින් අම්ර්තුමා මෙසේ පැහැදිලි කරයි: මුහම්මද් නබි තුමා පැවසූහ.

لعنة الله على الراشي والمرتشي

"පගාව දෙන්නා සහ පගාව ලබන්නා දෙන්නාටම අල්ලාහ්ගේ ශාපය අත්වේ" (මූලාශ්‍රය : ඉබ්නුමාජා).

# අනුන්ගේ ඉඩම් බලහත්කාරයෙන් බුක්ති විඳීම

වත්මන් සමාජයේ සිදාදියේ මෙන්ම ගම්වල පවා ව්‍යාප්ත වී ඇති තවත් විශාල පිලලයක් බවට පත්ව ඇත්තේ අනුන්ගේ ඉඩම් විවිධ අදමින් අත්පත් කර ගැනීම වේ. අල්ලාහ් කෙරෙහි බිය නැති වන්නේ කවදාද එවිට මිනිසා කුමන්ත්‍රණ සහ වංචාව වැනි දුදන මාර්ගයෙන් අයුක්ති සහගත ලෙස අනුන්ගේ සේසත් අත්පත් කර ගැනීමට උත්සාහ කරනු ඇත. තමාට අයත් නැති අනුන්ගේ ඉඩම් වංචාවෙන් අත්පත් කර ගැනීමද එවැනි දුදන ක්‍රියාවකි. එසේ තමාට කිසිදු අයිතියක් නැති අනුන්ගේ ඉඩම් ව්‍යාජ ඔප්පු ලියා හෝ බලයෙන් හෝ අයුක්ති ලෙස භුක්ති විඳීම පවන්ගෙන් බරපතලම පවක් බව මුහම්මද් නබි තුමා කළ අනතුරු ඇඟවීමක් අබ්දුල්ලාහ් බින්උමඋම තුමා මෙසේ විස්තර කරයි.

من أخذ من الأرض شيئا بغير حقه خسف به يوم القيامة إلى سبع أرضين

'තමාට අයත් නැති අනුන්ගේ ඉඩමක් අත්පත් කර ගන්නේ කවරෙක් ද, පරමාන්ත දිනයේ ඒ හා සමාන ඉඩම් හතක් ඔහුගේ කරේ පැටවෙනු ඇත (මූලාශ්රය : බුහාරි). තවද මුහම්මද් නබි තුමා දෙසූ බව යඃලා බ්න් මුර්රා තුමා මෙසේ විස්තර කරයි.

أيما رجل ظلم شبرًا من الأرض كلفه الله أن يحفره (في الطبراني: يحضره) حتى آخر سبع أرضين ثم يطوقه يوم القيامة حتى يقضى بين الناس

'කවරෙකු හෝ පොළොවෙ වියතක් පමණ හෝ අනුන්ට අයුක්තියක් කළේ නම් පරමාන්ත දිනයේ එය භාරන ලෙස බල කර වෙදනාවට පත් කරනු ඇත. තවද ඒ කියමනේ මෙසේ සඳහන් වේ. 'සත්වැනි භූමිය දක්වා හැරීමට අණ කර, පරමාන්ත විනිශ්චය දිනයේ මිනිසුන්ගේ විනිශ්චය මොහොත දක්වා එහි දමා වෙදනාවට පත්කරනු ඇත. (මූලාශ්රය: තබරානි ). එසේම ඉඩමේ මායිම් කණු වෙනස් කර එහි එල්ලේ සහ මුලු කණු මකා උගුලා, විනාශ කර ටිකෙන් ටික තම ඉඩම පුළුල්

කර අසල් වැසියාගේ ඉඩම් අයුක්ති සහගත අන්දමින් වංචා කරන්නා ගැන මුහම්මද් තුමා මෙසේ අනතුරු ඇඟවූහ:

لعن الله من غير منار الأرض

'ඉඩම් වල එල්ලේ වෙනස් කරන්නේ කවරෙක්ද, ඔහුට අල්ලාහ්ගේ ශාපය අත්වෙවා' (මුස්ලිම්)

## රෙකමදාරු පිණිස නැගී පිළිගැනීම

කෙනෙකුට සමාජය අතර ලැබී ඇති ගෞරවය, ප්‍රසිද්ධිය වැනි තත්ත්වයන් අල්ලාහ් විසින් ඔහුට පිරිනැමූ විශාල වරප්‍රසාධයක් සහ අනුග්‍රහයක් ලෙස සැලකිය හැකිය. තමා ලබා ගත් අනුග්‍රහය උදෙසා ඔහු අල්ලාහ්ට ස්තූති වන්ත වනු වස් ඒවා අන් මුස්ලිම්වරුන්ටද ප්‍රයෝජනය වන අයුරු භාවිතා කළ යුතුය. ඒ ගැන මුහම්මද් නබි තුමා මෙසේ දේශනා කළහ:

من استطاع منكم أن ينفع أخاه فليفعل

'ඔබ සහෝදරයාට උදව් කිරීමට ඔබගෙන් අවස්ථාවක් ලබන්නේ කවරෙක්ද හෙතෙම එය (සතුටෙන්) කරපු දෙන්' (මූලාශ්රය : මුස්ලිම්) එසේම යමෙකු තමා ලබා ගත් තත්ත්වය, උසස් වීම සහ ගෞරවය මගින් අනුන්ට අයුක්තියක් නොවන අයුරු හෝ නම මුස්ලිම් සහෝදරයාට අත්වූ අයුක්තිය නිරාකරණය කිරීමට හෝ ඔහුගේ අයිති වාසිකම් ලබා දීමට හෝ උත්සාහ කරන්නේ නම් ඒ මගින් අල්ලාහ් ඔහුට සුවිපාක ලබා දෙන්නේය. එසේ තමාට හැකි අයුරු අනුන්ගේ කට යුත්තන් නිරාකරණය කිරීමට රෙකමදාරු කරන ලෙස මුහම්මද් නබි තුමා මෙසේ ඔවදන් දුන්හ:

اشفعوا تؤجروا

'ඔබලා රෙකමදාරු කරන්න. එයට (මතුලොව) සුවිපාක ලබනු ඇත' (මූලාශ්රය : අබූදාවුද්) එසේම තමා ලබා ඇති තත්ත්වය, ගෞරවය යොදා යම්

අවුලක් නිරාකරණය කිරීමට රෙකමදාරු කිරීම පිණිස යම් තෑග්ගක් හෝ වෙනත් ආදායමක් හෝ බලාපොරොත්තු නොවිය යුතුය. එසේ යමෙකු යමක් බලාපොරොත්තු වන්නේ නම් එය නුසුදුසු බව මුහම්මද් තුමා නබි අනතුරු ඇඟවූ බව අබි උමාමා තුමා මෙසේ විස්තර කරයි: 'යමෙකු රෙකමදාරු කර ඒ වෙනුවෙන් දෙන යමක් ලබා ගන්නේ නම් හෙතෙම පොලියේ දොරටු වලින් එක් දොරටුවකට පිවිසී ඇත (මූලාශ්‍රය : අහ්මද්). නමුදු සමහරෙක් තම ගෞරවය සහ තත්ත්වය මගින් කෙනෙකුට රැකියාවක් ලබා දීමට හෝ එක් රැකියාවක සිට වෙනත් රැකියාවකට මාරු කර දෙන්න හෝ එක් දුෂ්කර ස්ථානයක සිට තමා පදිංචිව සිටින ස්ථානයකට ස්ථාන මාරුවක් ලබා දෙන්නට හෝ නොවන්නට බැරෑරුම් රෝගියෙකුට ප්‍රතිකාර ලබා දීමට රෙකමදාරු කිරිම පිණිස හෝ මුදල් සහ

අනෙකුත් මාර්ගවලින් ප්රතිඋපකාර බලා පොරොත්තුවෙන් කටයුතු කරති. لا توجد ترجمة මෙසේ අපේක්ෂාවෙන් කටයුතු කිරීම මුහම්මද් නබි තුමාගේ පෙර සඳහන් කළ ඔවදනට සම්පූර්ණයෙන්ම පටහැනිය. لا توجد ترجمة لا توجد ترجمة لا

කුසල් බලාපොරොත්තුවෙන් යම් කටයුත්තක නියුක්ත වන්නා ඒ වෙනුවෙන් කුලිය හෝ විපාකය මෙලොව නොව, මතු ලොවෙ බලාපොරොත්තු විය යුතුය.

වරෙක කෙනෙකු හසන් බිබ්න් සහල් තුමා වෙත පැමිණ 'ඔබට ඇති ගෞරවය සහ තත්ත්වය මගින් තම උවමනාවක් ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටියේය. සහල් තුමා ඔහුගේ උවමනාව සපුරා දුන් පසු හෙතෙම ප්රති උපකාරයක් ලෙස ඔහුට ප්රීතියෙන් ස්තුති කිරීමට සූදානම් වූ කල, සහල් තුමා ‘ඔබ ස්තුති කරන්නේ මන්ද?' යි විමසුවේය. එවිට පැමිණි තැනැත්තා '' මිනිසාගේ සේසත් වලට සකාත් නම්

බද්දක් වන සේ මිනිසාගේ ශෞචරයටද සකාත් වේ. ඒ සකාත් ඔබට පුද කරනවා ' යනුවෙන් උත්තර දුන්නේය. لا توجد ترجمة

لا توجد ترجمة

لا توجد ترجمة

## කුලී කරුවාන්ගේ වෙඨනය පමා කිරීම

තමා යටතෙහි සේවය කරන කුලි කරුවාගේ හෝ සේවකයාගේ කුලිය හෝ වෙඨනය ඔහු සේවය අවසන් කළ වහාම පිය විය යුතු බව ඉස්ලාම් දහම තරයේ අණ කර සිටී. ඒ ආඥාව ස්ථිර කරනු වස් මුහම්මද් නබි තුමාගේ ඔවදනක් මෙසේ විස්තර වේ:

أعطوا الأجير أجره قبل أن يجف عرقه

(සේවය අවසන් කර) කුලි කරුවාගේ දාඩිය වියලෙන්නට පෙර ඔහුගේ (පොරොන්දු වූ) කුලිය පියවන්න. (මූලාශ්රය : ඉබ්නුමාජා). වත්මනයේ මුස්ලිම් සමාජයේ බොහෝ දෙනෙකුගේ

සේවා ස්ථාන වල සහ කර්මාන්ත ශාලාව වැනි අනෙකුත් ස්ථානවල සේවය කරන නම සේවකයන් හට කරන අපරාධ සහ අයුක්තිය විවිධ මාදිලියෙන් වේ. ඒවායෙන් සමහරක් ගැන සළකා බලමු: 1. සේවකයාගේ අයිතිවාසිකම් සම්පුරණයෙන් ප්‍රතික්ෂේප කර අයුක්ති සහගතව ක්‍රියාකිරීම : මෙසේ යම් සේවක යෙකු අයුක්ති සහගතව හාම්පුතුන්ගෙන් සැළකිලි ලද්දද, ඒ වෙනුවෙන් හෙතෙම නිසැකවම පරමාන්ත දිනයේදී යුක්ති සහගත සුවිපාක ලබනු ඇත. මන්ද යත් මෙලොවෙ අයුක්තියට පත් වූ පුද්ගලයාට පරමාන්ත දිනයේ අයුක්ති අන්දමින් ක්‍රියා කළ තැනැත්තා ලඟ ඒ වෙනුවෙන් දීමට මුදල් නැති නිසා ඔහුගේ කුසල් රැගෙන දෙනු ලබනු ඇත. එසේ අයුක්ති අන්දමින් කටයුතු කළ පුද්ගලයාගේ කුසල් කර්මයන් අවසන් වූ විට, එයට සරිලන ප්‍රමාණයේ අයුක්තියට පත්වූ

තැනැත්තාගේ අකුසල් රැගෙන ඔහුට දෙනු ලබනු ඇත. 2. කම්කාවූ අයුරු සම්පූර්ණ කුලිය නොදී අඩුවෙන් කුලිය ගෙවීම : ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

ويل للمطففين

' කිරුම් මිනුම්හ වංචා කර අඩු කරන්නන් හට නපුරුමය'. (අල්කුර් ආන් 83:1)

لا توجد ترجمة

සේවකයන් සේවයට බදවා ගන්නා විට යම් සුදුසු පඩියකට එකග වී සේවකයන් බඳවා ගන්නා සමාගම්වල ප්රධානීන් සේවකයන් සේවයට වාර්ථා කළ පසු ඔවුන් හා කරගත් සම්මුතිය වෙනස් කර අඩු පඩියට එඟ වන ලෙස බලකර පොරොන්දු අත්සන් කර ගනී. නොවන්නට ඔවුන්ගේ පඩිය අඩුවෙන් දෙයි.

එහෙයින් සේවකයන් තම ප්රධානීන්ගේ අණට අකීකරු වීමට

නොහැකිව හෝ ඒ ගැන පැමිණිලි කිරීමට හෝ නොහැකිව තමා විසින් ඉටුවියුතු සේවය පිළිකුලෙන් නිමකර එහි විපාකය අල්ලාහ් මතම පවරති.

එසේ සේවකයන් හට අයුක්ති සහගත අන්දමින් කටයුතු කිරීම නිසා හෙතෙම ඒ විපාකය මතු ලොවේ ගෙවන්නට සිදුවනු ඇත.නමුදු සමාගමේ ප්‍රධානියා මුස්ලිම් ජාතිකයෙකු ලෙසද එහි සේවකයා මුස්ලිමෙකු ලෙසද වී මෙසේ අයුක්ති සහගතව ක්‍රියා වන කල, සේවකයන් ඉස්ලාම් දහම වටහා ගැනීමට සහ පිළිගැනීමට කළ බාධාවක් නිසා ඔහුට ඒ වෙනුවෙන්ද දඬුවම් ලැබෙනු ඇත.

සේවකයාට තම කාලය තුල කළ හැකි වැඩට වඩා අධික වැඩ පැවරීම, බැඳුම් කරයට වඩා පැය කීපයක දීර්ඝ වෙලාවක් සේවය ලබාගෙන පෙර පොරොන්දු වූ පඩිය පමණක් ගෙවීමේ අකටයුත්තක්ද අද බොහෝ සෙයින් සේවක ප්‍රධානීන් අතර සිදුවන සිදුවීමකි.

තවද සේවයේ කුලිය සේවය අවසන් වූ වහා නෙගෙවා, සේවකයාගේ පඩිය හෝ කුලිය සේවකයා කීප විටක්ම ඉල්ලා ඇවිලි කළ පසු ප්‍රමාද කර ගෙවීම හෝ සමහර විට ඒ සම්බන්ධ කම්කරු නිලධාරීන් වෙත පැමිණිලි කර හෝ කම්කරු උසාවියට ගොස් පැමිණිලි කර විශාල පරිශ්‍රමයකින් පසු එහි නීන්දුවෙන් පසු ප්‍රමාද වී ලැබීමද ඉස්ලාම් අනුමත නොකරයි. එසේම සේවකයන්ගේ පඩිය නොගෙවා ඒවා වෙනත් වෙළඳ කටයුතු වල ආයෝජනය කිරීම හෝ පොලිය පිණිස බැංකුවල තැන්පත් කිරීම හෝ නොවන්නට ඔවුන් පඩිය ඉල්ලා පෙරැත්ත කර විඩාවට පත් වූ පසු ගෙවීම හෝ වැනි අනන්ත අප්‍රමාණ කරදර නිසා لا توجد ترجمة لا توجد ترجمة سේවකයා නම ආහාර වෙනුවෙන් වියදම් කිරීමට නොහැකිව ලත වන අවස්ථාවන් අපමණය. එසේම නිසි වෙලාවට තම පඩිය නොලැබෙන නිසා තම පවුලේ අයට

සහ ළමයින්ගේ ආහාරය, පාසැල් කටයුතු වැනි උවමනාවන් පිණිස, තමා. යටතේ යැපෙන්නන්ගේ නඩත්තුව මුදල් සහ යැවීමට නොහැකිව පසුවනු සාමාණ්‍යව තත්ත්වයක් බවට පත්ව ඇත. මෙවැනි දුදන ක්‍රියාවන්හී නිරත වන්නක් හට පරමාන්ත දිනයේ අල්ලාහ්ගේ දරුණු දඬුවම් වලට ලක්වීමට සිදු වනු ඇත. අබූ හුරෙරා තුමා මෙසේ විස්තර කරයි ඒ ගැන මුහම්මද් නබි තුමාගේ අනතුරු ඇඟවීමක්.

قال الله تعالى: ثلاثة أنا خصمهم يوم القيامة رجل أعطى بي ثم غدر ورجل باع حرا وأكل ثمنه ورجل استأجر أجيرا فاستوفى منه ولم يعطه أجره

පරමාන්ත දිනයේ මම තුන් කොටසකට විරුද්ධව වාද කරමි. ඒ තුන් කොටස, යමක් අල්ලාහ් වෙනුවෙන් කරමි යනුවෙන් පවසා එය නොකරන අය, වහල්කමේ නැති කෙනෙකු විකුණා ඒ මුදල තම වියදමට ගන්නා, සේවකයන් (පත්කර ඒ අය සේවක කළ පසු) කුලිය

නොගෙවන්නා යන්නන්ය. (මූලාශ්‍රය : බුහාරි).

## ළමයින් අතර යුක්තිගරුකව ක්‍රියා කිරීම

එහෙයින් දෙමාපියන් සමහර විට නම ළයෙකුට අවශ්‍ය අවස්ථාවක උදව් උපකාර කළ සේ අනෙක් ළමයින්ටද බේද බින්න නොකර ඒ ලෙසම සැළකිය යුතුය. එසේ නොවන්නට ළමයින් අතර විවිධ අන්දමින් සැළකීම හරාම් වේ. ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි : සමහර දෙමාපියන් තමා වැඩියෙන් ප්‍රිය කරන ළමයාට පමණක් තෑගි සහ මුදල් වැනි විශේෂ සැළකිලි දක්වනු වත්මනයේ දකින්නට ලැබෙන සාමාන්‍ය සිදුවීමක් බවට පත්ව ඇත. ඒවා ලෙඩරෝග, ණය, කුර්ආන් පාසල් සහ අනෙකුත් අධ්‍යාපන කටයුතු සහ لا توجد ترجمة රැකියා විරහිත කම වැනි විශේෂ හේතූන් මත නොවන්නට එසේ සැළකිල්ලක් දැක්වීම

ඉස්ලාම් දහම තරයේ හෙළා දකී. لا توجد ترجمة

එහෙයින් දෙමාපියන් සමහර විට තම ළයෙකුට අවශ්‍ය අවස්ථාවක උදව් උපකාර කළ සේ අනෙක් ළමයින්ටද බේද බින්න නොකර ඒ ලෙසම සැළකිය යුතුය. එසේ නොවන්නට ළමයින් අතර විවිධ අන්දමින් සැළකීම හරාම් වේ.

මෙය සම්බන්ධව, අල්ලාහ් මෙසේ පවසා සිටියි.

اعدلوا هو أقرب للتقوى واتقوا الله

' යුක්තිය ඉටු කරව. එය බියබැති බවට ඉතා සමීපය. තවද, අල්ලාහ්ට බිය වව් (5 : 8) තවද මුහම්මද් නබි තුමාගේ සමයේ සිදු වූ මෙවැනි විශේෂ සිදුවීමක් නුමාන් බින් බෂීර් තුමා මෙසේ විස්තර කරයි:

أن أباه أتَى به إلى رسول الله صلى الله عليه وسلم، فقال: إني نَحَلتُ ابني هذا غلامًا - أي: وهَبتُه عبدًا كان عندي -، فقال رسول الله صلى الله عليه وسلم: أكُلَّ ولدك نحَلتَه مثله؟ فقال: لا، فقال رسول الله صلى الله عليه وسلم: فأرجِعه

'මගේ පියා මා මුහම්මද් නබිතුමා වෙත එක් කරගෙන ගොස් ' මුහම්මද් තුමනි,

මා මගේ ළඟ තිබුණු වහලා මොහුට දුන්නා' යි කීවෙය. එයට මුහම්මද් නබි තුමා 'ඔබගේ සෑම ළමයෙකුට ඔබ මෙසේ දුන්නාද ' යි විමසුහ. එවිට ' නැත වක්තෘ තුමනි ' යනුවෙන් පැවසු්. එවිට එතුමා 'එය ආපසු ලබා ගනිව් යනුවෙන් අණ කළහ. (මූලාශ්රය : බුහාරි). තවත් කියමනක මෙසේ සඳහන් වේ.

فاتقوا الله واعدِلوا بين أولادكم. قال: فرجعَ فرَدَّ عطيَّتَه.

' ඔබලා අල්ලාහ්ට බියවී ඔබගේ ළමයින් අතර යුක්තිගරුකව ක්රියා කරව යනුවෙන් අවවාද කළ පසු ඔහු තම පුතාට දුන් වහලා ආපසු ඉල්ලා ගත්තේය' (මූලාශ්රය බුහාරි) තවත් වාර්තාවක මෙසේ සඳහන්ව ඇත.

فلا تُشهِدني إذًا، فإني لا أشهَد على جَورٍ

ඒ සිද්ධිය සම්බන්ධවම තවත් කියමනක් මෙසේ සඳහන් වේ: 'ඔබ ඒ වෙනුවෙන් මා සාක්කි කරුවෙක් ලෙස පත් කර ගැනීමෙන් වළකිනු. මා කිසිවිටෙක අයුක්තියට සාක්කි කීමට සුදානම් නැත'

යනුවෙන් මුහම්මද් නබිතුමා පැවසූහ' (මූලාශ්‍රය මුස්ලිම්). තවද ළමයෙකුට යමක් දෙනවා නම් කාන්තාවක් තම ලබන කොටසට වඩා දෙගුණයක් පිරිමියෙකුට දිය යුතු බව ඉමාම් අහ්මද් බින් හන්බල් තුමා විස්තර කරයි. لا توجد ترجمة لا توجد ترجمة වත්මනයේ අල්ලාහ්ට බිය නොවන බොහෝ මුස්ලිම් දෙමාපියන් තම ළමයින් අතර යමක් දීමේදී තමා වැඩියෙන් ඇල්මක් දක්වන අයට විශේෂ සැළකිල්ලක් දක්වා ළමයින් අතර වෙනස්කම් කරති. එසේ බෙදන්නව කටයුතු කිරීමෙන් ළමයින් අතර වූ සමාදානය එකමුතුව හීන වී ඔවුන් අතර අසාධාරණය සහ ඉරිසියාව වැනි බොහෝ දුදන ගති පැවතුම් වර්ධනය වී ඔවුන් අතර සණ්ඩු දබර සහ නොමනාපයන් පවා ඇති වීමට හැකිය. සමහර විට ඒ හේතුවෙන් ජීවිත කාලය පුරාම තරහ වී එකිනෙකා කතා නොකර මිනිමැරුම් වැනි දරුණු දුදන ක්‍රියාවන්ද

ඇති විය හැකිය. لا توجد ترجمة එසේම පසු කලෙක ඒ ළමයින් තම වයෝවෘද දෙමාපියන්ට උදව් උපකාර කිරීම සැළකීම වැනි කටයුතු සහ වලදී ද නොසැළකිලිමත් වනු ඇත. මේ හේතු ගැන අනතුරු අඟවමින් මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ:

أليس يسُرُّك أن يكونوا إليك في البرِّ سواء؟

'ඔබගේ ළමයින් ඔබට යුක්ති සහගතව උපකාර කිරීම කෙරෙහි ඔබට සැකයක් ඇති කරන්නේ නැත්ද ? ' (එහෙයින් ඔබද ළමයින් අතර යුක්තිගරුකව කටයුතු කරන්නට වගබලා ගන්න).

لا توجد ترجمة

## නුවුවමනාවෙන් අනුන්ගෙන් මුදලෙන් උදව් පැතීම

සහල් බින් හන්ලලා (රියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. නියත වශයෙන්ම අල්ලාහ්ගේ

දූතයාණෝ (සල්ලල්ලාහුඅලෛයිහි වසල්ලම්) මෙසේ පැවසූහ.

من سأل وعنده ما يُغنِيه فإنما يستكثر من جمر جهنم، قالوا: وما الغنى الذي لا تنبغي معه المسألة؟ قال: قدر ما يُغدِّيه ويُعشِّيه.

වත්මනයේ බොහෝ දෙනෙකු තමාට යම් වත්පොහොසත්කමක් තිබියදී තවත් සේස රැස් කිරීමේ තණ්හාවෙන් ලැජ්ජා නොවී අනුන්ගෙන් ඉල්ලා සිටින පුරුද්දකට පත්ව සිටිති. නුවුවමනා අන්දමින් අනුන්ගේ ඉල්ලීම සහ උදාව පැතීම ගැන මුහම්මද් නබි තුමා අනතුරු අඟවනු පිණිස 'තමාගේ උවමනාවට සරිලන අයුරු (තමා සතුව) වෙද්දී තම සේසත් වැ කර ගැනීමේ අදහසින් වැඩි වැඩියෙන් අනුන්ගේ ඉල්ලන්නේ කවරෙක්ද හෙතෙම නිරයේ ගින්නෙන් කොටසක් වැඩි කර ගත්තේය' යනුවෙන් දෙසූහ එවිට, ''එසේනම් අනුන්ගෙන් නොඉල්ලා සිටීමට සැහෙන සේසත්' යනුවෙන් කලණ මිතුරන් විමසු කල, 'ඔහුට ජීවත් වන්නට උවමනා ආහාරය

ලබා ගැනීමට හැකි ප්‍රමාණය වේ' යනුවෙන් එතුමා උත්තර දුන්හ. (මූලාශ්‍රය අබූදාවුද්) අබ්දුල්ලාහ් බින් මස්ඌද් තුමා මෙසේ විස්තර කරයි. නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහුඅලෙයිහි වසල්ලම්) මෙසේ පැවසූහ.

من سألَ وله ما يُغنِيه جاءت يوم القيامة خُدوشًا أو كُدوشًا في وجهه

'තමාට ප්‍රමාණවත් වෙද්දී අනුන්ගේ වැඩිපුර අයදින්නේ කවරෙක්ද, හෙතෙම පරමාන්ත දිනයේ මුහුණේ මස් නැතිව වැහැරුණු අයෙකු ලෙස ආපසු නැගිටවනු ලබනු ඇත'

(මූලාශ්‍රය: අහ්මද්). සමහරු දේව නමස්කාර පිණිස තනා ඇති දේවස්ථානවල එහි නැමදුම අවසන් වූ වහා කඩිමිඩියේ නැගිට තම නැති බැරිකම පවසා සිඟමන් ඉල්ලති. එසේම යම් වත්කමක් ඇති අයද තම පවුලේ අය දේවස්ථාන සහ අනෙකුත් ස්ථාවලට යවා නැති බැරිකම ගැන කියා මුදල් රැස් කිරී

මට වෛර දරති. මොවුන් පවසන්නේ ඇත්තද නොවන්නට මුසාවක්ද යන්න කිසිවෙකු නොදනී. නමුදු පරමාන්ත දිනයේ ඔවුන්ගේ සියලු තොරතුරු ප්‍රසිද්ධියට පත්වනු ඇත. එසේම තවත් සමහර දුගීන් ලැජ්ජාව ආත්ම ගෞරවය උදෙසා අනුන්ගෙන් ඉල්ලීමට මැලි වෙති. එවැනි චීනය ගරුක දුප්පතුන් ගැන හරියාකාරව තෝරා බේරා වටහා ගැනීමට නොහැකිව ඔවුන් ද පොහොසතුන් යැයි සිතා ඔවුන්ට සංග්‍රහ කිරීමෙන් අප වැළකී සිටින්නෙමු. එහෙයින් ඔවුන් හරිහැටි වටහා ගෙන අවස්ථාවොචිව උදව කිරීම අප සියලු දෙනාගේ යුතුකමකි.

## ආපසු නොගෙවන අයුරින් ණය ගැනීම

මිනිස් අයිතිවාසිකම් සුරකීම අල්ලාහ් අභියස අති විශාල කටයුත්තක් වේ. මන්දයත් අල්ලාහ් වෙනුවෙන් ඉටු කළ යුතු නැමදුම, උපවාස ශීලය සහ හජ්

කටයුත්ත වැනි යම් කටයුත්තක් අන්පසු කළ විට ඒ වෙනුවෙන් අල්ලාහ්ගෙන් පවසමා අයැද ඒවා සමා කර ගත හැකිය. මන්දයත් ඒවා අතවැසියෙකු අල්ලාහ් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකමක් නිසා වේ. නමුදු යමෙකු මිනිසාගේ අයිතිවාසිකම් ඉටු කිරීම, දිනාර හෝ දිරහම් හෝ ගෙවීමට ඇත්නම් ඒ වෙනුවට පරමාන්ත දිනයේ ගෙවිය යුතු වන්නේ ඔහුගේ කුසල් කර්මයන් වේ. එදින මිහිපිට ඔහු සතුව තිබුණු සේසත් එදින ඔහු සතුව නැති නිසාය. ඒ කරුණ විස්තර කරමින් අල්කුර් ආනය මෙසේ අනතුරු අඟවයි :

إن الله يأمركم أن تؤدوا الأمانات إلى أهلها

'ඇත්තෙන්ම අමානා (හෙවත් ආරක්ෂා කිරීමට දුන් භාරකාරත්වය) එය හිමි අය වෙත පවරන ලෙස අල්ලාහ් ඔබට අන කරන්නේය' (අන් නිසා:58)

لا توجد ترجمة

අද බොහෝ දෙනෙකු යම් විශේෂ උවමනාවකින් තොරව, නම් සේසත් වැඩිකර ගැනීමේ අදහසින්, අළුත් ගෙවල් නිර්මාණය කර ගැනීම පිණිස, අළුත් වාහනයක් ගැනීම පිණිස, නිවසට නවීන පන්නයේ භාණ්ඩ මිලදී ගෘහ ගැනීම පිණිස වැනි බොහෝ කාරණයන් උදෙසා ණයට මුදල් ලබා ගනිති. لا توجد ترجمة එසේ වැදගත් නොවන අයුරු ණයට ගැනීම සහ ඒවා ආපසු ගෙවීමේදී ප්රමාද වීම සහ නොසැළිකිලිමත් වීම, එසේම තම සහෝදරයාගේ මුදල් නුවුවමනා පරිදි වියදම් කිරීමට සැළැස්වීම වැනි නොමනා අන්දමින් ක්රියා කරති. ඒ ගැන මුහම්මද් නබි තුමා මෙසේ අනතුරු ඇඟ වූහ:

من أخذ أموال الناس يريد أداءها أدى الله عنه ومن أخذ يريد إتلافها أتلفه الله

'ආපසු දීමේ අදහස මත ණය ගන්නේ යමෙක්ද අල්ලාහ් ඔහුගේ ණය පියවීමට සැළසුම් කරන්නේය. එසේම අනුන් විනාශ විය යුතු යනුවෙන් අදහස් කරමින් ණය ලබා ගන්නේ කවරෙක්ද එය ඔහු හා

බෙද්දීම අල්ලාහ් එය (මුදල අප්‍රයෝජන වන අයුරු) විනාශ කර දමන්නේය' (මූලාශ්‍රය : බුහාරි). අද බොහෝ දෙනෙකු ණය සම්බන්ධව එය පහසු කරුණක් ලෙස සිතා නොසැළකිල්ලෙන් පසුවෙති. නමුදු එය අල්ලාහ් අභියස ඉතා විශාල වගකීම් සහගත කරුණක් බව මක තබා ගත යුතුය. එයට උදාහරණයක් මෙසේ වේ: 'යමෙකු තම ප, කය සහ සේසත් ඉස්ලාමය වෙනුවෙන් පරිත්‍යාග කර අල්ලාහ්ගේ මාවතේ ෂහීද් බවට පත් වුවද, ඔහු ණය කාරයෙකු වන්නේ නම් ඒ ණය පියවන තුරු ඔහුට ඒ ණයෙන් නිදහස් විය නොහැකිය. එය විස්තර කරමින් මුහම්මද් නබි තුමාගේ කියමනක් මෙසේ වේ:

سبحان الله! ماذا أنزل الله من التشديد في الدَّين؟! والذي نفسي بيده؛ لو أن رجلًا قُتِل في سبيل الله ثم أُحيِيَ، ثم قُتِل ثم أُحيِيَ، ثم قُتِل وعليه دَين، ما دخل الجنةَ حتى يُقضَى عنه دَيْنُه

'සුබ්හානල්ලාහ් (අල්ලාහ් පිරිසිදු වන්නයාය). ණය සම්බන්ධ අල්ලාහ් ඉතා තදින් ක්‍රියා කරන්නේය. මගේ ප්‍රාණය

කාගේ අතේ වෙදෝ මහු මත දිවරා කියන්නම්, කෙනෙකු අල්ලාහ්ගේ මාවතේ ඝාතනය වී, නැවත පන පොවා නැවත ඝාතනය වී, නැවත පන පොවා නැවත ඝාතනය වුවද, ඔහු ණය වී ඇත්නම් ඒ ණය පියවන තුරු ඔහු ස්වර්ගයට නොපිවිසන්නේය' (මූලාශ්‍රය : නසඉ)

යමෙකු ඉහත සඳහන් මුහම්මද් නබි තුමාගේ මුදුවදන වටහා ගත් පසුවද ණය සම්බන්ධව සැළකිල්ලෙන් කටයුතු කරත්වා.

## අනුමත නොවූ ඒවා අනුභව කිරීම

වත්මනයේ බොහෝ දෙනෙකු තමා කුමන අන්දමින් මුදල් උපයනවාද යනුවෙන් කිසිදු බියක් සැකක් නොවී කෙසේ හෝ මුදල් ඉපයීමේ එකම පරමාර්ථයෙන් සොරකම් කර, පගාව ගෙන, අනුන්ගේ සේසත් බල යෙන් අත්පත් කරගෙන, ඉස්ලාම් අනුමත

නොකළ හරාම් කළ දේ වෙළදාම් කර, පොලි ගෙන, අනාථයන්ගේ සේසත් වංචා කර, නුසුදුසු රැකියාවන්හී නියළී, ශාස්ත්‍ර කියා, සිංදු කියා, සංගීතය සන්දර්ශන වලින්,මැජික් සන්දර්ශන වලින්, නැටුම් සන්දර්ශන වලින් සහ තවත් විවිධ අන්දමින් මුදල් උපයති. මහජන සේසත් සොරකම් කර, لا توجد ترجمة නුවුවමනා ලෙස හිගමන් ඉල්ලා, එසේ මුදල් උපයා ඒ මගින් තමාද කාබී තම පවුලේ අයද නඩත්තු කරති. එසේම එසේ හරාම් ලෙස මුදල් උපයා සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන අයද වෙති. එසේ නොමනා අන්දමින් උපයන මුදල් වලින් ජීවත්වන්නා ගැන මුහම්මද් නබි තුමා මෙසේ අනතුරු ඇඟ වූහ:

كل لحم نبت من سحت فالنار أولى به

'හරාම් මගින් පෝෂණය වන්නේ නිරයටයි'

(මූලාශ්‍රය: තබරානි ).

එහෙයින් සර්ව බල අල්ලාහ් පරමාර්ථ දිනයේ මිනිසා මෙලොව වසන කල මුදල් ඉපයුවේ කෙසේද? එවා කෙසේ වියදම් කළාද? යනුවෙන් ප්‍රශ්ණ කරනු ලබනු ඇත.

එහෙයින් අයුතු අන්දමින් ඉපයූ මුදල් කා සතුව වේද, ඔවුන්ගේ කුසල් කර්මයන් සියල්ල එයට පිළියමක් වශයෙන් අකුසල් ලෙස පරිවර්ථනය කර ඔහුට හිමි වනු ඇත. එහෙයින් තමා රැස් කළ කිසිදු මුදලක් හෝ සේසතක් හෝ ප්‍රයෝජනවත් නොවන පරමාන්ත දිනයේ කුසල් කර්මයන් අකුසල් ලෙස පත්වන්නට පෙර තමා අයුක්තියෙන් ඉපයූ සියලු දේ එහි අයිතිකරුවන් හට ආපසු භාර දීමෙන් එවැනි මහා දඬුවමෙන් මිදිය හැකිය

## සුලුවෙන් හෝ මත්ද්‍රව්‍ය පානය කිරීම ඉස්ලාම් තරයේ තහනම්

## කළු දෙයින් මත් පැනට අයත් වන්නේ අති වැදගත් ස්ථානයකි.

මත්පැන් පානයේ විපා කය ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි

إِنَّمَا الْخَمْرُ وَالْمَيْسِرُ وَالأَنصَابُ وَالأَزْلاَمُ رِجْسٌ مِّنْ عَمَلِ الشَّيْطَانِ فَاجْتَنِبُوهُ لَعَلَّكُمْ تُفْلِحُونَ

විශ්වාස වන්නයිනි, සැබැවින්ම මත්පැන් පානයද, දු කෙළියද, (ඇදහීම් පිණිස තබා ඇති) පිළිරුද, හී විදීම ද නිමිති බැලීමද, පිළිකුල් සහගත ෂයිතාන්ගේ වැඩ වලින් නරක දේමය. එහෙයින් ඔබලා ජයග්රහකයින් වනු වස් එයින් වැළකෙව්'. (අල්කුර්ආන් 5 : 90) පෙර සඳහන් අල්කුර් ආන් වැකියේ වැළකෙව යනුවෙන් සඳහන් කිරීමේ තේරුම ඒවා හරාම් කර ඇති බව යන්නට සාධක වේ.තවද එතුමා මෙසේ පැවසුහ: වැළකෙව යන්නෙහි තේරුම එයින් මදක් හෝ යන්තමින් හෝ ඉවත් වීම යනුවෙන් කිසිවෙකුට අර්ථ කථනය කළ නොහැකිය. මන්දයත් එහි තේරුම

සම්පුර්ණයෙන්ම හරාම් යන්න වේ. එසේම මත්පැන් පානය කරන අයට අනතුරු අඟවන විලසින් මුහම්මද් නබි තුමාගේ කියමනක් ජාබීර් තුමා මෙසේ විස්තර කරයි : لا توجد ترجمة

إن على الله عز وجل عهدا لمن يشرب المسكر أن يسقيه من طينة الخبال. قالوا: يا رسول الله! وما طينة الخبال ؟ قال: عرق أهل النار أو عصارة أهل النار

' මත් විය හැකි පානයන් පානය කරන්නාට මතු ලොවේදී නිරයේ වැසියන්ගේ දේහයෙන් බේරෙන සැරව බීම වශයෙන් දෙනු ලබනු ඇති බව අල්ලාහ් වදන් දී ඇත (මූලාශ්රය: මුස්ලිම්). තවත් වතාවක මුහම්මද් නබි (සල්) තුමා දෙසූ බව ඉබ්නු උමර් තුමා මෙසේ පවසයි: '' අඛණ්ඩව මත් පැන් පාවිච්චිකර එසේම මරණයට පත්වී අල්ලාහ් මුණ ගැසෙන්නේ කවරෙක්ද ඔහුගේ තත්ත්වය පිළිම වන්දනාමානය කළ කෙනෙකු සේ වන්නේය' මූලාශ්රය : තබරානි). වත්මන් යුගයේ විවිධ නාමයෙන් විවිධ වර්ගයේ මත් පැන්

වෙළෙඳ පොළේ අරක්ගෙන ඇත. لا توجد ترجمة එවා සියල්ල මත්පැන් බව මතු සඳහන් මුහම්මද් නබි තුමාගේ කියමනෙන් ඔප්පු වේ.

ليشربن ناس من أمتي الخمر يسمونها بغير اسمها

මගේ සමාජයේ සමහරුන් මත්පැන ඒ හැර අන්නාමධාරී කරගෙන පානය කරනු ඇත. (මූලාශ්‍රය : අහ්මද්). ඔවුන් ඒවාට මත්පැන් යනුවෙන් නොපවසා මිනිසුන් රවටනු වස් ධෛර්යය, වීර්ය සහ උනන්දුව ගෙන දෙන පානය යනුවෙන් ප්‍රචාරය කරති. එසේ අල්ලාහ් සහ විශ්වාස වන්තයින් රවටා ඔවුන් දුදනෙහි නියළෙන්නට උත්සාහ කරන්නන් හට අනතුරු අඟවමින් අල්කුර්ආනය මෙසේ විස්තර කරයි.

يخادعون الله والذين آمنوا وما يخدعون إلا أنفسهم وما يشعرون

ඔවුන් අල්ලාහ් ද විශ්වාස වන්තයින්ද රවට(න්නට නැත් කර) ති. නමුදු (සැබැවින්ම) ඔවුහු තමන් විනා (අන් කිසිවෙකු) නොරවටති. ඔවුන් ( මෙය)

නොහඟිති'(2 : 9) ඉස්ලාම් දහම මත්පැන තහනම් බව තරයේ නීති පනවා කරුණු පැහැදිලි කර අනතුරු අඟවයි. මුහම්මද් නබි තුමා වරෙක මෙසේ දෙසූහ:

كل مسكر خمر، وكل مسكر حرام

'මත් විය හැකි සියලු දේ මත් පැන්ය. සියලු මත්ද්‍රව්‍යයන් හරාම්ය' (මූලාශ්‍රය: මුස්ලිම්). එහෙයින් මිනිසාගේ සිහි විකල් කළ හැකි සියලු පානයන්, එය අල්ප ප්‍රමාණයක් වුවද, විශාල ප්‍රමාණයක් වුවද ඒවා විවිධ නම් වලින් ආමන්ත්‍රනය කළ ද ඒවා සියල්ල සම්පූර්ණයෙන්ම හරාම් කළ ඒවා වේ.

ما أسكر كثيره فقليله حرام

لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة මත්පැන් පානය කරන්නන්ගේ විපාකය විස්තර කරමින් මුහම්මද් නබි තුමා මෙසේ අනතුරු ඇඟවූහ:

من شرب الخمر وسكر لم تقبل له صلاة أربعين صباحا وإن مات دخل النار فإن تاب تاب الله عليه وإن عاد فشرب فسكر لم تقبل له صلاة أربعين صباحا فإن مات دخل النار فإن تاب تاب الله عليه وإن عاد فشرب فسكر لم تقبل له صلاة أربعين صباحا فإن مات دخل النار فإن تاب تاب الله عليه

وإن عاد كان حقا على الله أن يسقيه من ردغة الخبال يوم القيامة قالوا: يا رسول الله وما ردغة الخبال قال: عصارة أهل النار.

'මත්පැන් පානය කර මවන්නේ කවරෙක්ද, ඔහුගේ දින හතළිහක නැමදුම් අනුමත නොකරනු ලබනු ඇත. ඒ විලසින්ම ඔහු මරණයට පත්වී නම් නිරයට ඇතුල් වනු ඇත. මත්පැන් පානය කරන කෙනෙකු එහි දුදන වටහා ගෙන පශ්චාත්තාප වී පව සමා අයදින්නේ නම් අල්ලාහ් ඔහු සමා විය හැකිය. එසේ පව සමා අයැද නැවත වරක් මත්පැන් පානය කළේ නම් නැවතත් ඔහුගේ දින හතළිහක නැමදුම් අනුමත නොකරනු ලබනු ඇත. එසේ ඔහු මරණයට පත්වන්නේ නම් නිරයේ රළු ගින්නට ඇතුල් කරනු ලබනු ඇත. මත් පැන් පානය කරන කෙනෙකු එහි දරුණුකම වටහාගෙන බැති සිතෙන් පශ්චාත්තාප වී පව සමා අයදින්නේ නම් අල්ලාහ් ඔහු සමා විය හැකිය. එසේ පවසමා අයැද නැවත වරක් මත්පැන් පානය කළේ නම් නැවතත් ඔහුගේ දින හතළිහක නැමදුම්

අනුමත නොකරනු ලබනු ඇත. එසේ ඔහු මරණය පත් වන්නේ නම් නිරයට ඇතුල් කරනු ලබනු ඇත. එසේ පව සමා අයැදීමෙන් පසු නැවත තත් ඔහු මත්පැන් පානය කළේ නම් මතු ලොව නිරයේ වැසියන්ගේ දේහයෙන් වැගිරෙන සැරව ඔහුට පානය කරවීමට අල්ලාහ් සුදුසුසාය'. (මූලාශ්රය : ඉබ්නුමාජා).

## කෑමබීම පිණිස රන්රිදී භාජනය පරිහරනය

වත්මනයේ ගෘහ භාණ්ඩ සහ අනෙකුත් භාණ්ඩ අලෙවි වෙළඳ සැල්වල රන් රිදී ආලේප කළ භාණ්ඩ අලෙවි නොවන කිසිදු අලෙවි හලක් නැති තරම්ය. එසේම හෝටල් වලද සමහර නිවස් වල ද එවැනි භාණ්ඩ පරිහරණය අනන්ත අප්රමාණය. එසේම සාධ වලද මිනිසුන් තමනතර හුවමාරු කරගන්නා වටිනා නැගි වලද මෙවන් රන්රිදී භාණ්ඩ අරක්ගෙන ඇත. සමහරු තම නිවෙස්වල සහඑවා පරිහරණය නොකළද අනෙක්

නිවසට සහ හෝටල් වලට ගිය විට හෝ නොවන්නට එහි සමහර සාධයන් හීද ඒවා පරිහරණය කරති. මෙවන් සියලු අවස්ථාවන් හිදීම රන් රිදි භාජණය පරිහරණය කිරීම ඉස්ලාම් දහම තහනම් කර ඇත. එවැනි පාත්රවල ආහාරපානය කරන්නා තම කුසේ නිරයේ ගින්න බහා ගන්නා බව මුහම්මද් නබි තුමා අනතුරු ඇඟවූහ. මුහම්මද් නබි තුමා දෙසූ දෙසුමක් උම්මු සලම තුමිය මෙසේ විස්තර කරයි. කවරෙකු රිදී බඳුනක අහාරපාන ගන්නේ කවරෙක් ද කරන්නේ ද හෙතම කුසෙහි පුරවා ගනුයේ නිරයේ ගින්නයි. (මූලාශ්රය: මුස්ලිම්).

මේ නීතිය රන් රිදිවලින් නිර්මිත හෝ ආලේප කරන ලද සියලු පිගන්, පිහි, ගැරුප්පු සහ හටච් වැනි ආම්පන්න වලටද, ආහාර ගැනීම පිණිස භාවිතා කරන සියලු භාජන වෙනුවෙන්ද බලපායි. නවද සාදයන් හී ප්රධානය කරන තෑගිබෝග සහ මංගල සාධයන්හී වොෆි

සහ කේක් වැනි වෙනත් මිහිරි බොජුන් වැනි දේ සංග්‍රහ කිරීමට පාවිච්චි කරන භාජන සහ කුඩා පෙට්ටි වැනි සියලු දේ රනින් රිදියෙන් ◌් නම් ඒවා සියල්ල තහනම් වේ.

නමුදු වත්මනයේ සමහරෙක් 'අප ඒවා පාවිච්චි කරන්නේ නැත, නමුදු ඒවා ලස්සන පිණිස අපගේ අල්මාරිවල තබා ඇත්තෙමු' යනුවෙන් පවසති. නමුදු එයද පසුව විශේෂ සාධයක් වැනි අවස්ථාවකදී භාවිතා කිරීමට අවස්ථාව බොහෝ සෙයින් එසේ තබා තිබීමද තහනම් බව ඉස්ලාම් අනතුරු අඟවයි. මන්දයත් එසේ තබා තිබීම විශේෂ අමුත්තන් පැමිණි හදිසි අවස්ථාවන්හිදී ඒවා පරිහරණය කිරීමට හැකි අවස්ථාවක් උදාකිරීමට හැකි නිසාය.

لا توجد ترجمة

# බොරු සාක්කි කීම

බොරු සාක්කි කීම ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

فَاجْتَنِبُوا الرِّجْسَ مِنَ الْأَوْثَانِ وَاجْتَنِبُوا قَوْلَ الزُّورِ

' පිළිම (වන්දනාවෙ) හි ඇති (මිසදිටු නම්) අපිරිසිදු වෙන් වැළකෙව. මුසා බසෙන්ද වැළකෙව. අල්ලාහ්ට කිසිවක් ආදේශ නොකර ඔහුට සම්පූර්ණයෙන්ම යටත් s (වන්දනාමාන කරන්නෙකු සේ) සිව. (22 : 30 - 31) මුහම්මද් නබි තුමා වරෙක දෙසූ බව අබ්දුල් රහ්මාන් අබූ බක්රා තුමා මෙසේ විස්තර කරයි. 'අප මුහම්මද් තුමා සමග එක් සභාවක අසුන් ගෙන සිටි කල,

ألا أنبئكم بأكبر الكبائر (ثلاثًا): الإشراك بالله وعقوق الوالدين ـ وجلس وكان متكئا ـ فقال: ألا وقول الزور. قال: فما زال يكررها حتى قلنا: ليته سكت

විශාල පව ගැන ඔබට කියන්නද? යි තුන් වතාවක් විමසා මෙසේ විස්තර කළහ. අල්ලාහ්ට ආදේශ කිරීම, දෙමාපියන්ට හිරිහැර කිරීම යනුවෙන් පවසා නැවත

නැගිට වාඩි වී, බොරු සාක්කි කීම (එතුමා එය නවත්වන්නේ නැද්ද? යනුවෙන් අප සිතන තරමට) යනුවෙන් නැවත නැවතත් කියා සිටියහ. (මූලාශ්‍රය බුහාරි) වත්මනයේ මිනිසුන් අතර ඇති අමනාපය, වංචාව සහ ඉරිසියාව වැනි දුදන ක්‍රියාවන් නිසා තම සහෝදරයාට එරෙහිව පවා බොරු සාක්කි කීමට සමහරු ඉදිරිපත් වන්නේය. මිනිසා තම සහෝදරයාට විරුද්ධව පවා බොරු සාක්කි කීමට ඉදිරිපත් වන හෙයින් මුහම්මද් නබි තුමා කීප වතාවක්ම බොරු සාක්කි ගැන අනතුරු ඇඟවූවා විය හැකිය. එසේ බොරු සාක්කි කීමෙන් මිනිසුන්ට ඇතිවන කරදර සහ දුර විපාක අපමණය. තවත් සමහරුන්ගේ අයිතිවාසිකම් අහිමි වන්නේය. අයුක්තියට පත්වන දුප්පතුන් කොපමණද? යනු අප මදක් සිතා බැලිය යුතු මනාය. لا توجد ترجمة තවත් සමහරු උසාවිය පොලිසිය වැනි ස්ථානයන්හී,

ගෙවල් සහ වෙළඳ සැල් වැනි දේ තමාගේය යනුවෙන් තමාට වාසි වන අයුරු බොරු සාක්කි කියන ලෙස තවත් කෙනෙකු බල කරනු අප අනන්ත අප්‍රමාණව දැක ඇත්තෙමු. සමහර විට ඒ බොරු සාක්කි කියන්නා සහ කියන ලෙස දිරිගන්වන්නා මුල්වතාවට ඒ මොහොතේ දී මුණ ගැසුණු ආගන්තුක පුද්ගලයින් වීම ඉතා කණගාටුදායක තත්ත්වයකි. ඔහුට උදව් කිරීම පිණිස තවත් කෙනෙකු බොරු සාක්කි කීමට ඉදිරිපත් වීම කෙතරම් විශාල දුදන ක්‍රියාවක්ද? නමුදු සාක්කි දීම කෙසේද යන්න ඉස්ලාම් දහම මුහම්මද් නබි තුමාගේ ඔවදන් තුලින් මනාව පෙන්වා දී ඇති හෙයින් අපද ඒ මගම පිලිපැදිය යුතුය. ඒ ගැන අල්කුර ආනය මෙසේ පවසයි:

وما شهدنا إلا بما علمنا

' සැබැවින්ම අප දුටු දේ හැර අන් කිසිවක් නොකීවෙමු'. (අල්කුර්ආන් 12 : 81)

## සංගීතය

අබ්දුල්ලාහ් බින් මස්ඌද් තුමා පහත දහන් අල්කුර්ආන් වාක්යයේ අප්රයෝජන දොඩම්ළුව යන වචනයට තේරුම සංගීතය බව අල්ලාහ් මත දිවරා කියයි. ඒ අල්කුර්ආන් වාක්යය මෙසේය:

ومن الناس من يشتري لهو الحديث ليضل عن سبيل الله

" ඥානයෙන් තොරව අල්ලාහ්ගේ මාර්ගයෙන් නොමග යැවීම පිණිස අප්රයෝජන දොඩමළු (කතා) ව මිළයට ගන්නා වූ සමහරුන් මිනිසුන්ගෙන් වෙති'. ( 31 : 6) لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة අබූ ආමිර් සහ අබී මාලික් අල් අස්අරි යන දෙන්නා මෙසේ විස්තර කරති: තවද මුහම්මද් නබි තුමා දෙසූ බව

ليكونن من أمتي أقوام يستحلون الحر والحرير والخمر والمعازف

අනාගතයේදී දුරාචාරය, පටෙන් නිමවුනු ඇඳුම්, මත්ද්‍රව්‍ය සහ සංගීතයද සුදුසුයැයි පවසන කොටසක් මගේ සමාජයේ බිහිවනු ඇත. (මූලාශ්‍රය : තිර්මිදි). තවද මුහම්මද් නබි තුමා දෙසූ බව අනස් බින් මාලික් තුමා මෙසේ පවසයි:

ليكونن في هذه الأمة خسف وقذف ومسخ وذلك إذا شربوا الخمور واتخذوا القينات وضربوا بالمعازف

'ඒ සමාජයේ අය මත්පැන පානය කර, ගායිකාවන් ද තබාගෙන සංගීතයෙහි ද යෙදෙන්නේ නම් චන්ද්‍ර සහ සූර්ය ග්‍රහය ද, අවලාද කීමද, රුව වෙනස් කිරීමද සිදුවනු ඇත'. (තිර්මිදි) තවද බෙර සහ වීනා වාදනයද මුහම්මද් නබි තුමා තහනම් කළහ. වත්මනයේ නව නම් වලින් නිර්මාණය වී ඇති සියලු සංගීත භාණ්ඩ මුහම්මද් නබි තුමාගේ පෙර සඳහන් කියමන අනුව තහනම් ඒවා වේ. ترجمة توجد لا ඉමාම් අහ්මද් බින් හන්බල් තුමා ජනයන් අතර පරිහරනයෙහි තිබුණු සමහර සංගීත භාණ්ඩවල නම්

දහන් කර ඒවා තහනම් බව පවසා ඇත. සමහර මුහම්මද් නබි තුමාගේ විස්තර කර ඇති එදා සංගීත භාණ්ඩ වලට වඩා වත්මනයේ සංගීත භාණ්ඩ මිනිසාගේ සිත්තුල විරහ හැඟීම් වැනි බොහෝ දුදන හැඟීම් ඇති කිරීමට සමත් වන්නේය. එසේම වත්මනයේ ඇති වීනාව, සර්පිනාව, පියානෝව, සිතාරය සහ ගිටාරය වැනි සංගීත භාණ්ඩ ද මුහම්මද් නබි තුමා තහනම් කළ සංගීත භාණ්ඩ හා සමාන ඒවාය. ප්රසිද්ධ විතෙකු වන ඉමාම් ඉබ්නු කයියුම් සහ අනෙකුත් ඉමාම්වරු පවසන අයුරු සංගීතයේ මත්කම මත්පැනේ මත්කමට වඩා අති දරුණු බවය. සංගීතය සඟ මිහිරි කට හඩෙන් සමන්විත ගායිකාවන්ගේ විවිධ තාලයෙන් වූ ගායනයද එක්වන කළ එහි විපයාසය අති දරුණුය. ගීතයේ පදද කාමය සහ ස්ත්රියගේ අවයවයන් විරහව විස්තර කරන ඒවා ලෙස වන කළ එය තවත් දරුණු විපාකයන් ඇති

කරන්නට සමත් වනු ඇත. එහෙයින් ගායනය දුරාචාරයේ පණිවිඩය ලෙසත් සිතේ කුහකකම ඇති කළ හැකි දෙයක් බවත් විද්වතුන් විස්තර කරති.

සාමාන්‍යයෙන් වත්මන් සමාජයේ ව්‍යාප්ත වී ඇති සංගීතය සහ ගායනය අති විශාල භීෂණයට සහ ජනයන්ගේ සිත් කළඹා නොමඟ යැවීමට හේතු ලෙස පවතින්නේය.

لا توجد ترجمة තවද වත්මනයේ සංගීතය ඔරලෝසුව, නිවසේ සවි කරන සීනුව, ටෙලිපෝනය, පාවහන්, කොම්පියුටරය, සටහන් ලිවීමේ අත්පොත් සහ ළමුන්ගේ ක්‍රීඩා භාන්ඩ වැනි සියලු භාණ්ඩයන්හී ඇතුල් වී ඇත. එහෙයින් ඒ වැනි සංගීත අන්තගත භාණ්ඩ වලින් මදක් හෝ ඉවත්වීම අදට අපගේ වැදගත් කටයුත්තක් වී ඇත. සුමග මට අප සැමට පිටිවහල් කරන්නේ දයාන්විත අල්ලාහ් වේ.

## ඕපදූප කීම

අද සමහරුන් සාමාන්‍යයෙන් එක්වූ අවස්ථාවක නොවන්නට රංචු ගැසුණු කළ තම සහොදරයා ගැන කේලාම් කියමින් ඔහුගේ චරිතය ඝාතනය කිරීමට උත්සාහ කරන අවස්ථාවන් අපමණය. නමුදු සර්වබලධාරී අල්ලාහ් ඔවුන්ගේ එවන් දුදන ක්‍රියාවන් ගැන අල්කුර්ආනයේ මෙසේ අනතුරු අඟවමින් විස්තර කරයි ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

ولا يغتب بعضكم بعضا أيحب أحدكم أن يأكل لحم أخيه ميتا فكرهتموه

'ඔබගෙන් ඇතමෙක් ඇතමෙකුගේ කේලාම් නොකියව. ඔබගෙන් එකෙක් තම මල සහෝදරයාගේ මස් කන්නට කැමැති වන්නේද? ඔබ එය පිළිකුල් කරන්නේමය. (49: 12) لا توجد ترجمة

أتدرون ما الغيبة ؟ قالوا الله ورسوله أعلم. قال: ذكرك أخاك بما يكره، قيل: أفرأيت إن كان في أخي ما أقول؟ قال: إن كان فيه ما تقول فقد اغتَبْتَه، وإن لم يكن فيه فقد بهَتَّهُ

'ඕපදූප යනු කුමක්දැයි වරෙක මුහම්මද් නබි දූදන තුමා තම කලණ මිතුරන්ගෙන් විමසූහ. එයට ඔවුන් එය දන්නේ අල්ලාහ් සහ අල්ලාහ්ගේ වක්තෘ තුමා පමණි යනුවෙන් උත්තර දුන්හ. එයට මුහම්මද් නබි තුමා ඔබ සරයා අකැමැති දෙයක් ඔබ කීම ් නම් එය ඕපදූප වේ යනුවෙන් කීහ. මා කියන දේ මගේ සහොදරයා හා සම්බන්ධ දෙයක් වුවද? යි විමසන ලද කළ ඔබ කී දේ මහු සමග වේ නම් ඔබ ඔහු ගැන ඕපදූප කතා කර ඇත. එවැන්නක් ඔහු වෙන නැත්නම් ඔබ ඔහු ගැන කේලාම කියා යනුවෙන් එතුමා පැවසූහ' (මූලාශ්රය : මුස්ලිම්) එහෙයින් අප සහෝදරයාගේ ආගමික කටයුතු, ් ලක්ෂණ සහ ලෞකික කටයුතු වැනි දේ කුමන ලෙසින් වුවද යමෙකු ඒ ගැන කතා කිරීම ඔහු කැමැති වූයේ නැති නම් එය ඔපදූප කීමකි. ترجمة توجد لا ترجمة توجد لا අපගෙන් බොහෝ දෙනෙකු මෙසේ අනුන් ගැන කතා කිරීමේ නරක පුරුද්දෙහි

නිරතව සිටිති. එහි දුර්විපාකය ගැන මුහම්මද් නබි තුමා මෙසේ විස්තර කර ඇත.

الربا اثنان وسبعون بابا أدناها مثل إتيان الرجل أمه وإن أربى الربا استطالة الرجل في عرض أخيه

'පොලියේ දොරවල් හැත්තෑ තුනක් වේ. එහි පහසුම දොර යමෙකු මව සමග කායික සංසරගයෙහි යෙදීම හා සමාන දෙයකි. පොලියේ අති අන්තරාදායක දේ තම සහෝදරයා ගැන කේලාම් කීම වේ' (අස්-සිල්සිලතුස් සහීහා: 1871) යම් ස්ථානයක තම සහෝදරයා ගැන කේලාම් කියනු ලබන්නේ නම් අසල පසුවන්නන් එය හැකි අයුරින් වළකන්නට උත්සාහ කළ යුතුය. යනුවෙන් දෙන ඔවදනක් ගැන මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ:

من رد عن عرض أخيه رد الله عن وجهه النار يوم القيامة

" තම සහෝදරයාගේ චරිතය ආරක්ෂා කරන්නේ කවරෙක්ද, පරමාන්ත දිනයේ අල්ලාහ් නිරයේ ගින්නෙන් ඔහුගේ

මුහුණ ආරක්ෂා කරන්නේය' (මූලාශ්‍රය : අහ්මද්) (මූලාශ්‍රය : අහ්මද්).

## කේලාම්

අද සමාජයේ බොහෝ දෙනෙකු තම සහෝදරයෙකු කී පුවතක් වෙනත් කෙනෙකුට පැවසීමෙන් ඔවුන් දෙන්නා අතර බෙදීමක් ඇති කළ විට පසුව එය අමනාපයක්, තරහක් ලෙසට පත් වන්නේය.

එසේ ක්‍රියා කරන්නන් ගැන අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි : ඒ ගැන අල්කුර් ආනය මෙසේ විස්තර කරයි:

ولا تطع كل حلاف مهين هماز مشاء بنميم

වැඩියෙන් දිවුරන නීචයන් හට ඔබ කීකරු නොවව්. (ඔහු අනුන්ගේ) වැරදි කියමින්, කේලාම් කියමින් ඇවිදින්නන්ය'. (68 : 10-11) තවද කේලාම් කියමින් ඇවිදින්නා ගැන මුහම්මද් නබි තුමා අනතුරු අඟවා දෙසූ බව හුසෛෆා තුමා මෙසේ විස්තර කරයි.

ඕපදූප කියන්නා ස්වර්ගයට ඇතුල් නොවන්නේය' (මූලාශ්රය : බුහාරි). لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة තවද ඉබ්නු අබ්බාස් තුමා මෙසේ විස්තර කරයි: වක්තෘ මුහම්මද් නබි තුමා මදීනාහී සුසාන භූමියක බිත්තියක් අසලින් ගමන් කරමින් සිටින විට එහි අසල මිනිවලේ වේදනා පමුණුවන දෙන්නෙකුගේ හඬ ඇසී මෙසේ පැවසූහ.

يعذبان، وما يعذبان في كبير - ثم قال - بلى [وفي رواية: وإنه لكبير] كان أحدهما لا يستتر من بوله وكان الآخر يمشي بالنميمة

මේ මිනිවලේ පසුවන්නන් දැන් ◌්නා පමුණුවමින් පසුවෙති. ඔවුන් එසේ කරන්නට ඔවුන් කළ විශාල පවක් නැත. තවත් කියමනක විශාල පව යනුවෙන් පවසා, ඔවුන්ගෙන් කෙනෙකු මුත්රා කර නිසි ලෙස පිරිසිදු නොකළ තැනැත්තානා. අනෙක් තැනැත්තා කේලාම් කියමින් ඇවිද තැනැත්තාය' යනුවෙන් පැවසූහ.

(මුලාශ්රය : බුහාරි).

لا توجد ترجمة

එසේම නුවවමනා අන්දමින් ඔපදුප කියා පවුලේ අඹු සැමියන් අතර ප්‍රශ්න ඇති කර බෙදීම් ඇති කිරීම, සේවා ස්ථානයේ යම් සේවකයෙක් ඉහළ තැනට හෝ නොවන්නට එහි පාලකයන් හට හෝ සේවකයා තම මුදලාලිලාට හෝ තමා හා සේවය කර සහෝදරයා ගැන ඕපදුප පවසා ඔහුට කරදර ඇති කිරීමට උත්සාහ කිරීම වැනි ක්‍රියාවන් විශාල දුදන ක්‍රියාවක් වන අතර එසේ කිරීම මහා පාප කර්මයක් බව ඉස්ලාම් දහම අනතුරු අඟවයි

## අනුන්ගේ නිවෙස් වලට අනවසරයෙන් පිවිසීම පෙර දැනුම් දීමකින් තොරව අනුන්ගේ ගෙවල්වලට අනවසරයෙන් ඇතුල් නොවිය යුතු බව

අල්කුර් ආනය මෙසේ විස්තර කරයි:

يَا أَيُّهَا الَّذِينَ آمَنُوا لَا تَدْخُلُوا بُيُوتًا غَيْرَ بُيُوتِكُمْ حَتَّى تَسْتَأْنِسُوا وَتُسَلِّمُوا عَلَى أَهْلِهَا ذَلِكُمْ خَيْرٌ لَّكُمْ لَعَلَّكُمْ تَذَكَّرُونَ

විශ්වාසවන්තයිනි, ඔබ අවසරගෙන එහි නිවැසියන් (සුභ පතා) සලාම් කියලා අවසර ලැබෙන තුරු ඔබගේ ගෙවල් නොවන ඒ ගෙවල්වලට ඇතුල් නොවව් (24 : 27) යමෙකු තමාගේ නොවන අන් ගෙවල් වලට එහි හිමියාගෙන් අවසර ලබා ඇතුල් විය යුතුය යනුවෙන් අල්ලාහ් දෙව්දු විස්තර කරයි. අල්ලාහ් මෙසේ විස්තර කිරීමට හේතුව එසේ කිසිදු පෙර දැනුම් දීමකින් තොරව අනුන්ගේ ගෙවල්වලට ඇතුල් වන කල ඒ ගෙවල් වල අයගේ නොබැලිය යුතු යමක් රහසක් හෝ දකින්නට සිදු විය හැකි හෙයිනි. එසේ අනවසරයෙන් අන් ගෙවල්වලට ඇතුල් වීම ගැන මුහම්මද් නබි තුමාද අනතුරු අඟවමින් මෙසේ දෙසුහ:

إنما جعل الاستئذان من اجل البصر.

' අනුමත ලැබීමෙන් පසු තමාගේ නොවන අනුන්ගේ නිවෙස්වලට පිවිසිය යුතු යනුවෙන් නීතියට පත්වූයේ මිනිසාගේ (නොමනා) බැල්ම නිසාය'

(මුලාශ්‍රය : බුහාරි). එසේම ගෙවල් එකිනෙකට යාබදව හෝ ළඟින්මඟ හෝ පිහිටා එහි කවුළු සහ දොරවල් එක එල්ලේ තිබීම නිසා එක් නිවසක සිට අනෙක් නිවසේ වන සිදුවීම් හෝ නොබැලිය යුතු සමහර දේද බැලෙන්නට අවස්ථා එමටය. තවද සමහරු නොමනා දර්ශනයන් බැලීමෙන් තම බැල්මන් ඉවත් නොකර උවමනාවෙන්ම උඩු මහලේ සිට හෝ පහළ සිට හෝ කවුළු අතරින් හෝ දොර සිදුරු අතරින් හෝ අසල් වැසියාගේ නිවසේ සිදුවන දේ බලති. මෙසේ කිරීම තම අසල්වැසියාට කරන වංචාවක් ද්රෝහිකමක් වන අතර එය මහා පාපයකි. لا توجد ترجمة මෙසේ බැලීම ගැන මුහම්මද් නබි තුමා මෙසේ අනතුරු ඇඟවූහ:

من اطلع في بيت قوم بغير إذنهم فقد حلَّ لهم أن يفقئوا عينه

'යමෙකු වෙනත් නිවසක වන දේ ඔවුන්ගේ අනවසරයෙන් එබී බලන්නේ නම් ඔහුගේ ඇස් වලට ඇනීමට (අන්ධ

කිරීමට) අවසරයක් වේ. (මූලාශ්‍රය: මුස්ලිම්). තවත් වාර්තාවක

ففقئوا عينَه فلا دِيَة له و لا قِصَاص

ඔහුගේ ඇස් වලට අනින්න. (අන්ධ වූවා නම්) එයට කිසිදු වන්දියක් හෝ පලි ගැනීමක් හෝ (ගෙවීමට) නැත' (මූලාශ්‍රය : අහ්මද්).

## තුන්වැන්නා පසුවන කල දෙන්නෙක් අයිනකට වී රහස් දෙඩීම

ترجمة توجد لا එක්තැනක රැස්වී තිදෙනෙකු සිටින කල දෙන්නෙකු ඉවතට වී අනෙකා තනි කර රහස් තකා කර ගැනීම ඔවුන් අතර බෙදීමක් සහ දුදනක් ඇති කළ හැකි බව ඉස්ලාම් දහම තරයේ අවවාද කරයි. මෙය මුස්ලිමුන් නොමග යැවීමට ෂයිතාන් විසින් යොදන දුදන ක්‍රියාවකි. මේ ගැන මුහම්මද් නබි තුමාගේ කියමනක් මෙසේ වේ.

إذا كنتم ثلاثة فلا يتناجى رجلان دون الآخر حتى تختلطوا بالناس أجل (أي: من أجل، كما ورد في بعض الروايات) أن ذلك يُحزِنُه

' ඔබලාගෙන් තිදෙනෙකු එක් තැනක එක්ව සිටින තුරු එකෙක් අත හැර බලාගෙන් දෙන්නෙකු ඉවතට වී රහස් කතා නොකරන්න. මන්ද යත් එය තුන්වැන්නාට දුක ගෙන දෙන කරුණකි' (මූලාශ්රය : බුහාරි). එසේම සිව් දෙනෙකු සිටින සබයක එක් කෙනෙකු හැර ඉතිරි තිදෙනා තනිවම කතාවට හවුල් නොවිය යුතුය. එසේම දෙන්නෙකු තුන් වැන්නාට නොදැනෙන අයුරු වෙනත් බසකින් කතා කිරීමද, තමා ඔවුන්ට වඩා අඩු කෙනෙකු ලෙසින්ද, ඔවුන් තමා ගැන කතා කරනවා විය හැකිය යනුවෙන්ද ඔහු සැක කිරීමටද හැකි වනු ඇත.

## ඇස් වටයට පහළින් ඇඳුම් දිගට ඇඳීම

මිනිසා සාමාන්ය ලෙසය නොසැලකිල්ලෙන් පසු වූවද, අල්ලාහ් අභියස ඉතා බැරෑරුම් තවත් කරුණක්

නම් ඇඳුම කකුලේ ඇස් වටයට පහළින් දිගට ඇදීම සහ බිම ගෑවෙන අයුරු ඇදීම වේ. ඒ ගැන අවවාද කරමින් මුහම්මද් නබි තුමා මෙසේ දෙසූ බව අබූදර අල් කිෆාරි තුමා මෙසේ විස්තර කරයි :

ثلاثة لا يكلمهم الله يوم القيامة ولا ينظر إليهم ولا يزكيهم ولهم عذاب أليم: المسبل (وفي رواية: إزاره) والمنان (وفي رواية: الذي لا يعطي شيئا إلا منه) والمنفق سلعته بالحلف الكاذب

'පරමාන්ත දිනයේ අල්ලාහ් සමූහ තුනක් හා කතා කරන්නේ හෝ ප්රශංසා සහගතව ඔවුන් දෙස බලන්නේ හෝ නැත. ඔවුන් තම ඇඳුම් ඇස් වටයට පහළින් ඇඳගත් අය, තමා ප්රශංසාමුඛව කතා කරන්නට වීනා දන් නොදෙන අය, බොරුවට දිවරා තම ද්රව්යයන් අලෙවි කළ අයද වේ (මූලාශ්රය : මුස්ලිම්) සමහරුන්ට මේ වැරැද්ද ගැන පැහැදිලි කළද, තමන් එසේ ඇස් වටයෙන් පහළට ඇඳුම් අඳින්නේ ආඩම්බරයක් විදහා පාන්නට නොව යනුවෙන් පවසති. ඔවුන් කෙසේ පැවසූවද ඇස් වටයට පහළින් ඇඳුම් ඇදීම ගැන යම් ආඩම්බරයක්

බලාපොරොත්තු වූවා හෝ නොවූවා හෝ එසේ කිරීමට දහම අනුමත දී නැති බව වටහා ගත යුතුය. ඒ ගැන අනතුරු අඟවමින් මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ:

ما تحت الكعبين من الإزار ففي النار

' ඇස් වට දෙකට පහළින් පසුවන ඇඳුම් නිරයට සැපත් වනු ඇත' (මූලාශ්‍රය : අහ්මද්). තවද එසේ ආඩම්බරයෙන් හෝ උඩඟු කමෙන් හෝ යමෙකු තම ඇඳුම ඇස් වටයට පහළින් අඳින්නේ නම් පරමාන්ත දිනයේ අල්ලාහ්ගෙන් ඔහුට ලැබෙන සැළකිල්ල ගැන මුහම්මද් නබි තුමා වරෙක මෙසේ දෙසූහ:

من جرَّ ثوبه خُيَلاء لم ينظر الله إليه يوم القيامة

' ආඩම්බරයෙන් උදම්මානයෙන් තම ඇඳුම ඇස් වටයට පහළින් ඇඳ බිම දිගේ ඇදගෙන යන්නේ කවරෙක්ද අල්ලාහ් පරමාන්ත දිනයේ ඔහු දෙස දයාවෙන් කරුණාවෙන් බලන්නේ නැත'

(මූලාශ්‍රය : බුහාරී).

එසේ ක්රියා කරන්නා අල්ලාහ්ගේ කරුණාව සහ දයාව නොලැබීමට හේතුව වන්නේ ඔහුගේ අහංකාරකම සහ ඇස් වටයට පහළින් ඇඳුම් ඇඳීම යන වැරදි දෙකක් කළ වරදට ඔහු අසුවන නිසා වන්නේය. තවද මුහම්මද් නබි තුමා මේ සම්බන්ධදවම දෙසු තවත් ඔවදනක් අබ්දුල්ලාහ් බින් උමර් තුමා මෙසේ විස්තර කරයි: 'යමෙකු අහංකාරකමෙන් ඇස් වටයට පහළින් සරම, කලිසම සහ අනෙකුත් ඇඳුම් අඳින්නේ නම් පරමාන්න දිනයේ අල්ලාහ් ඔහු දයාවෙන් බලන්නේ නැත' (මූලාශ්රය : අබූදාවුද්) හුළං හමා තම ඇඳුම් ඉස්සී ඒ නිසා තම පිටට නොපෙනිය යුතු අවයවයන් පෙනෙනු ඇතැයි බියක් ඇති වන හෙයින් කාන්තාවන් මදක් දිගට ඇඳුම් ඇඳිය හැකි බව ඉස්ලාම් දහම පවසයි. නමුදු සාමාන්යයෙන් වත්මනයේ මාගල සාධයන්හී සාධයන් සහ සහ අනෙකුත් විශේෂ උත්සවයන්හී භාවිතා කරන

අයුරු කාන්තාවන් මීටර් ගණන් දිගට ඇඳුම් අඳින ලෙස ඉස්ලාම් නොපවසයි.

## පිරිමින් රත්තරන් පැළඳීම

පිරිමින් රනින් නිම වූ ආභරණ පැළඳීම ගැන මුහම්මද් නබි තුමා අනතුරු අඟවා දෙසූ බව අබූ මූසා අල් අෂ්අරි තුමා මෙසේ විස්තර කරයි:

أُحِلَّ لإناث أمتي الحرير والذهب، وحُرِّم على ذكورها

' මගේ සමාජයේ රත්තර පැළඳීම කාන්තාවන්ට පමණක් අනුමත කර, එය පිරිමින්ට තහනම් කර ඇත. (මූලාශ්රය : අහ්මද්) අද වෙළඳ පොලේ පිරිමින් පරිහරණය කරන භාණ්ඩ අතර රනින් නිමවූ උපකරණ අපමණය. ඒවා රණින් නිම කරන ලද විවිධ මාදිලියේ අත් ඔරලෝසු, ඇස් කණ්ණාඩි, බොත්තම්, පෑන්, ලයිටරය සහ මාල වැනි දේද, රන් ආලේප කරන පලඳනාවන්ද වේ. විවිධ මාදිලියේ එසේම සමහර ආගමික කටයුතු වල සූදානම් කරන ලද තරඟවල පවා පිරිමින්ට පිරිනමන තෑගි වල රණින්

නිමකරන හෝ අන් ආලේප කළ හෝ තෑගි දීමද කරනු අප බොහෝ සෙයින් දැක ඇත්තෙමු.එහෙයින් එවැනි ෘගි බෙදා දීමේ උත්සව වල ඉස්ලාම් දහම තහනම් කරන ලද එවැනි තෑගි පිරිනැමෙන්ද වැළකී සිටිය යුතුය. රනින් නිමවූ මුද්දක් පැළඳ සිටි කෙනෙකු දැක මුහම්මද් නබි තුමා අනතුරු ඇඟවූ බව ඉබ්නු අබ්බාස් තුමා මෙසේ විස්තර කරයි. 'ඔබගෙන් කෙනෙකු නිරයේ ගින්නෙන් කෑල්ලක් ගෙන තම අතේ තබා ගැනීමට කැමැති වන්නේ නම් එය පැළඳ ගනිද්දෙන්.

يعمد أحدكم إلى جمرة من نار فيجعلها في يده؟! فقيل للرجل بعدما ذهب رسول الله صلى الله عليه وسلم: خذ خاتمك انتفع به، قال: لا والله لا آخذه أبدًا، وقد طرَحَه رسول الله صلى الله عليه وسلم

එසේ අනතුරු අඟවා මුහම්මද් නබි තුමා එතැනින් ඉවත්ව ගිය පසු තවත් කෙනෙකු රත්තරන් මුද්ද පැළඳ සිටි කෙනා අමතා ඒ මුද්ද ගෙන අන් අයුරකින් ප්රයෝජනයට ගන්නා ලෙස කී කල 'මුහම්මද් තුමා විසි කිරීමට අණ කළ මුද්ද

මා කිසිවිටෙක ආපසු ගන්නේ නැහැ’ යනුවෙන් කීවේය (මූලාශ්රය: මුස්ලිම්).

## කාන්තාව තද, විනිවිදව ඇඟපසඟ පෙනෙන ඇඳුම් ඇඳීම

ඉස්ලාම් දහමට විරුද්ධව එය විනාශ කිරීමට, විකෘතියට පත් කිරීමට මාන්සරයය සිතෙන් කළ උත්සාහයන් අපමණය. කාන්තාවන් තම ඇඟපසඟ විනිවිද පෙනෙන අයුරු සිනිඳු රෙදිවලින් නිමවුනු ඇඟට හිරවුනු තද කොට ඇඳුම් හඳුන්වා දීම එයින් එක් ක්රියාවක් ලෙස හැඳින්විය හැකිය. දහමේ මනා දැණුමක් නැති අපගේ බොහෝ කාන්තාවන් ද ඒවාට ලොල් වූහ. ආශා කළහ. ඒවායෙන් සමහර ඇඳුම් නම නිවසෙහි කාන්තාවන් අතරේ ඉස්ලාම් දහමට විරුද්ධව එය විනාශ කිරීමට, විකෘතියට පත් කිරීමට මාන්සරයය සිතෙන් කළ උත්සාහයන් අපමණය. කාන්තාවන් තම ඇඟපසඟ විනිවිද පෙනෙන අයුරු සිනිඳු රෙදිවලින් නිමවුනු ඇඟට හිරවුනු තද කොට ඇඳුම්

හඳුන්වා දීම එයින් එක් ක්රියාවක් ලෙස හැඳින්වි හැකිය. දහමේ මනා දැණුමක් නැති අපගේ බොහෝ කාන්තාවන් ද ඒවාට ලොල් වූහ. ආශා කළහ. لا توجد ترجمة ඒවායෙන් සමහර ඇඳුම් නම නිවසෙහි කාන්තාවන් අතරේ කෙසේ වුවද, තම පියා, සහෝදරයා, පුතා සහ මාමා වැනි මහ්රම් අය ඉදිරියේ පවා ඇඳීමට නොහැකි අති පහළ අන්දමේ ඒවාය. මෙවැනි නොමනා අප්රිය සහගත ඇඳුම් මතු කාලයේදී මතුවනු ඇතැයි මුහම්මද් නබි තුමා එදාම අනතුරු ඇඟවූහ. මුහම්මද් නබි තුමා අනතුරු ඇඟ වූ කරුණ ගැන අබූ හුරෙරා තුමා මෙසේ විස්තර කරයි: '

صِنفان من أهل النار لم أرهما: قوم معهم سياط كأذناب البقر يضربون بها الناس، ونساء كاسيات عاريات مميلات مائلات رؤوسهن كأسنمة البخت المائلة، لا يدخلن الجنة ولا يجدن ريحها وإن ريحها ليوجد من مسيرة كذا وكذا

දෙකොටසක් නිරයේ වැසියන් වනු ඇත. මා ඔවුන් දැක නැත, යනුවෙන් මුහම්මද් තුමා පවසා, එක් සමූහයක් තමා ළඟ වූ

හරකුන්ගේ වල්ගය ලෙසින් වූ කසවලින් ඔවුන්ට පහර දෙමින් පසු වනු ඇත. තවත් සමූහයක් ඉතා සිනිඳු ඇඳුමෙන් සැරසී නිර්වස්ත්‍රව ද, පිරිමින් වශී කිරීම පිණිස තම ගමණ වෙනස් කරමින් ද, තම හිස කෙස් ඔටුවාගේ පිටේ උස්ව පිහිටි ඇති මස් පිණ්ඩය සේ උස්කර නමා සකස් කර ඇති කාන්තාවන්ය. ඔවුන් ස්වර්ගයට ඇතුල් වීමට හෝ එහි සුවඳ විඳීමට හෝ කිසිදු අවස්ථාවක් නොලබනු ඇත. ස්වර්ගයේ සුවඳ ගැන විස්තර කරන විට ස්වර්ගයේ සුවඳ මෙපමණ දුරකට සුවඳ විහිදෙනු ඇතැයි මුහම්මද් නබි තුමා ප්‍රමාණයක් විස්තර කළහ (මූලාශ්‍රය: මුස්ලිම්). لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة තවද දික් අතට සහ හරස් අතට ඉරා මසන ලද ඇඳුම් වැනි වෛවාරනික විලාසිතා ඇඳුම ඇඳීමෙන් තම දේහයේ එළිපිට නොපෙන්විය යුතු අවයවයන් ප්‍රදර්ශනය වන හෙයින් එවැනි ඇඳුම්, ගායකයින්ගේ,

නළුනිළියන්ගේ, සතුන්ගේ, මද්‍යයවල නම් සහ පෞරාණික ස්ථානයේ රූප, තමා නොදන්නා අන් භාෂාවෙන් ලියන ලද වදන් සහ කාමය, රාගය හා සම්බන්ධ විලම්භීත තේරුම් ගෙනදෙන වදන් වැනි අනේක මාදිලායේ චිත්‍ර වලින් සමන්විත විවිධ ඇඳුම් ඇඳීමෙන් වැළකී සිටිය යුතුය.

## හවරි පැළඳීම

මුහමමද් නබි තුමාගේ ඔවදක් ගැන සඳහන් කරමින් අබූ බක්ර තුමාගේ දුව අස්මා බින්ත් අබූබක්ර්තුමිය එක්තරා සිදුවීමක් ගැන මෙසේ සඳහන් කරයි: 'කාන්තාවක් වක්තෘ මුහම්මද් තුමා අභියසට පැමිණ 'මගේ දුව විවාහය පිණිස සූදානමින් සිටී. ලෙඩක් හේතුවෙන් ඇගේ කොණ්ඩ සියල්ල හැලීගොස්ය. එහෙයින් ඇගේ හිස කෘතිම කොණ්ඩයකින් (හවරියකින්) හැඩගස්වන්නද? යි විමසුවාය.

لعن الله الواصِلَة والمُستوصِلَة

එයට මුහම්මද් නබි තුමා 'බොරු කොණ්ඩ, පළඳින්නාට එයට උනන්දු කරවන්නාටද අල්ලාහ්ගේ ශාපය ඇති වෙවා' යි ශාප කළහ' (මූලාශ්‍රය: මුස්ලිම්). තවද එහි විපාක ගැන සඳහන් කරමින් ජාබිර බින් අබ්දුල්ලාහ් තුමා මෙසේ විස්තර කරයි: '

زجر النبي صلى الله عليه وسلم أن تصِلَ المرأةُ برأسها شيئًا

කාන්තාවක් තම කොණ්ඩය සමඟ කෘතිම (කොණ්ඩයක් වැනි) දෙයක් එක්කර පළඳීම වක්තෘ මුහම්මද් තුමා තහනම් කළහ'. (මූලාශ්‍රය: මුස්ලිම්). لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة

## පිරිමි කාන්තාව ලෙසද කාන්තාව පිරිමි ලෙසද ඇඳුම් ඇඳීම සහ කතාව

පිරිමියා පිරිමිකමද ගැහැණිය තම ආවේණික තත්ත්වයද ආරක්ෂා කර යහපත් ජීවිතයක් ගත කරන ලෙස ඉස්ලාම් දහම ආඥා කරයි. لا توجد ترجمة

නමුදු එයට හාත්පසින්ම විරුද්ධ පිරිමියා ගැහැණියක් ලෙසද, ගැහැණිය පිරිමියෙකු ලෙසද, ඇඳුම් ඇඳීමට සහ හැසිරීමට උත්සාහ කිරීම දුදන ක්‍රියාවට මග පෑදීම සහ විශාල සමාජ ගරා වැටීමකට භාජනය විය හැකි කරුණක් බවද ඉස්ලාම් දහම අනතුරු අඟවයි. එසේ යමෙකු ක්‍රියා කිරීමට උත්සාහ කරන්නේ නම් හෙතෙම ඉස්ලාම් දහමට පටහැනිව ක්‍රියා කරන්නෙකු ලෙස වන්නේය. එවන් ක්‍රියාව ගැන අනතුරු අඟවා මුහම්මද් නබි තුමා කළ දෙසුමක් ඉබ්නු අබ්බාස් තුමා මෙසේ විස්තර කරයි.

لعَنَ رسول الله المتشبهين من الرجال بالنساء والمتشبهات من النساء بالرجال

'කාන්තාවන් සේ වෙස්වලා ගන්නා පිරිමින්ටද, පිරිමින් සේ වෙස්වලා ගන්නා කාන්තාවන්ටද වක්තෘ මුහම්මද් තුමා ශාප කළහ (මූලාශ්‍රය : බුහාරි). ඉබ්නු අබ්බාස් තුමා තවත් කියමනක මෙසේ විස්තර කරයි:

لعن رسول الله المخنثين من الرجال والمترجلات من النساء

එසේම පිරිමින්ගෙන් නපුන්සකයන් ලෙස වෙස්වලා ගන්නන් හටද, පිරිමින් ලෙස වෙස්වලා ගන්නා කාන්තාවන් හටද මුහම්මද් තුමා ශාප කළහ (මූලාශ්‍රය : බුහාරි) වෙස්වලා ගැනීම යනුවෙන් මෙහි අර්ථවත් වන්නේ තම හැසිරීම් සහ ඇඳුම් පැළඳුම් කතා විලාශය සහ විරුද්ධ පක්ෂයේ අය සේ වෙනස් කිරීමද, තම දේහය සහ කටහඬ නපුංසකයෙකු සේ හෝ විරුද්ධ පක්ෂයේ කටහඬ සේ හෝ වෙනස් කිරීම සහ හැසිරීම, පිරිමියෙකු කාන්තාවක් සේ චලනය, ක්‍රියාවන් ලෙස ගමන සහ හැසිරීම වැනි වෙනස් කිරීමද හැඳින්විය හැකිය. එසේම කාන්තාවන්ට අයත් මාල, කරාබු සහ පාදසලම් වැනි ආභරණ පිරිමින් පැලඳීමද, පිරිමින්ට අයත් කමිස, දික් කලිසම සහ ජීන්ස් වැනි දේ කාන්තාවන් ඇඳීමද ඉස්ලාම් දහම තරයේ හෙළා දකී. ترجمة توجد لا එහි ඇති දුර්විපාකය ගැන මුහම්මද් නබි තුමා

මෙසේ අනතුරු ඇඟවූ බව අබූ හුරෛරා තුමා මෙසේ විස්තර කරයි :

لعن الله الرجل يلبس لبسة المرأة، والمرأة تلبس لبسة الرجل

'කාන්තාවගේ ඇඳුම අඳින පිරිමියාද, පිරිමියාගේ ඇඳුම අඳින කාන්තාවද අල්ලාහ්ගේ ශාපයට පත්වේවා (මූලාශ්‍රය : අබූදාවුද්)

## කෙස් කළු කිරීම

එසේම මුහම්මද් නබි තුමාගේ මතු සඳහන් මුදු වදන අනුව හිස කෙස් කළු කිරීමද තහනම් කරුණක් වේ. ඒ සම්බන්ධ මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ:

يكون قوم يخضبون في آخر الزمان بالسواد كحَوَاصِلِ الحمام، لا يَريحون رائحة الجنة

'පරෙවියන්ගේ බෙල්ලේ ඇති කළු සේ තම කොණ්ඩය කළු කරන කොටසක් අනාගතයේදී ඇති වනු ඇත. ඔවුන් ස්වර්ගයේ සුවඳ පවා නොවිඳිනු ඇත' (මූලාශ්‍රය : අබූදාවුද්) අද වයෝවෘද්ධ බොහෝ දෙනෙකු තම හිසකෙස් කළු

කිරීම සාමාන්‍ය දෙයක් බවට පත් කරගෙන ඇත. එසේ කිරීම තම ශරීර සෞඛ්‍යයටද අහිතකරය. එසේම අල්ලාහ් විසින් මැවූ ස්වභාවික තත්ත්වය වෙනස් කිරීමට ගන්නා උත්සාහයකි. لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة නමුදු මුහම්මද් නබි තුමා තම සුදු කෙස් වර්ණ කිරීම පිණිස රතු සහ කහ වැනි වර්ණ වලින් සමන්විත එක්තරා ගස්වල කොළ වලින් තනා ගන්නා යුෂ පාවිච්චි කර ඇති අතර අන් අයට එසේ කරන ලෙස දෙසූහ. ඉස්ලාමීය ඉතිහාසයේ මුල් වරට මක්කාව ජයගත් අවස්ථාවේ අබූබක්ර් සිද්දීක් තුමාගේ පියා අබූ කුහාෆා තුමා හිසකෙස් සහ රැවුල සුදුව පසුවනු දුටු මුහම්මද් නබි තුමා ඔහුට මෙසේ ඔවදන් දුන්හ.

غيِّروا هذا بشيء واجتنبوا السواد

'කළු හැර අන් ඒවායෙන් ඒවා පාට කර ගනු' (මූලාශ්‍රය: මුස්ලිම්). මේ කරුණ සම්බන්ධව ඉස්ලාම් දහම පිරිමි සහ

කාන්තා වන් දෙපිරිසටම දෙන්නේ එකම ඔවදනකි

## පන ඇති සතුන්ගේ සහ වෙනත් ඒවාගේ රූප ඇඳීම

අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් -රළියල්ලාහු අන්හු- තුමා

إن أشد الناس عذابًا عند الله يوم القيامة: المُصوِّرون

' පරමාන්ත දිනයේ විශාල දඬුවම් වලට පත්වන්නන්ගෙන් කොටසක් පන ඇති ඒවායේ රූප අඳින්නන්ය (මූලාශ්‍රය : බුහාරි). අබූ හුරයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී

قال الله تعالى: ومن أظلم ممن ذهب يخلق كخلقي، فليخلقوا حبَّة، وليخلقوا ذرَّة

'මා නිර්මාණය කළ දේ බඳු නිර්මාණය කිරීමට උත්සාහ කරන දුදනන් කවරෙක්ද? ඔවුන්ට හැකි නම් බීජයක් හෝ ඇටයක් හෝ නිර්මාණය කරද්දෙන් යනුවෙන් අල්ලාහ් පවසයි' . (මූලාශ්‍රය : බුහාරි). ඉබ්නු අබ්බාස් තුමා නවත්

කියමනක මෙසේ විස්තර කරයි: තවද මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ.' ජීවමාන රූප අඳින්නන් නියට පත්වනු ඇත. ඔවුන් නිර්මාණය කළ ඒවා පණ පොවා ජීවමාන කර ඒවා මගින් ඔවුන් නිරයේ වේදනාව පමුණුවනු ඇත. තවද මුහම්මද් නබි තුමා දෙසූ බව ඉබ්නු අබ්බාස් තුමා මෙසේ පවසයි: ' ඔබ අඳින්නට උවමනා නම් ගසක් හෝ පණ නැති (ස්වභාවික දර්ශන වැනි) දෙයක් හෝ අඳිනු' (මූලාශ්රය: මුස්ලිම්). අප ඉහත සඳහන් කල මුහම්මද් නබි තුමාගේ මුදු වදන් අනුව මිනිසා, සතුන් සහ පක්ෂීන් වැනි පණ ඇති ඒවායේ රූප ඇඳීම, නෙළීම, ඇඹීම, ලෝහවලින් වක්කිරීම සහ මුද්රණය කිරීම වැනි සියලු දේ ඉස්ලාම් දහම තරයේ නහනම් කර ඇති බව පැහැදිළිය. لا توجد ترجمة لا توجد ترجمة මෙසේ අඳින ලද, අඹන ලද, වක්කරන ලද අනෙකුත් සියලු මාදිලියේ රූපවලින් ඇති විය හැකි දුදන සහ වැරදි විපාකයන්

අපමණය. මිනිස් මනස ඇස්සිය හැකි එවැනි රූප නිසා තම සිතට වහල්වීම සහ මිනිසාගේ සිත්තුල විවිධ මාදිලියේ කැලඹිලි ඇති කිරීම, විවිධාකාර කාමාශ්රිත විරහ ආශාවන් ඇතිවීම, සිත වියාකූල් වී නොමග යැවීම වැනි බොහෝ දුර්ගුණයන් ඇති විය හැකි හෙයින් ඉස්ලාම් එය තහනම් කළ හේතුව පරිසමාප්තව වටහාගෙන ඒ ආඥාවන් හට කීකරු විය යුතුය. لا توجد ترجمة සුර දූතයන් නම නිවෙස්වලට සහභාගි වීම විහින්ම වළක්වනු වස් තම නිවෙස්වල පණ ඇති එවුන්ගේ විවිධ රූප සහ ඡායාරූප තබා ගැනීමෙන් වැළකී සිටිය යුතුය. لا توجد ترجمة

لا تدخل الملائكة بيتا فيه كلب و لا تصاوير

ජීවමාන පින්තූර තම නිවෙස් වල ගැනීම තබා මෙසේ අනතුරු කුමන ගැන මුහම්මද් නබි තුමා ඇඟ වූහ: 'සුනඛයන් සහ පින්තූරු නිවසක වෙදෝ ඒ නිවසට මලාඉකාවරුන් ඇතුල් නොවන්නෝය'

(මූලාශ්‍රය : බුහාරි) තවද සමහර නිවෙස්වල විසිත්ත කාමර වල අමුත්තන්ගේ ශාලාව වැනි ස්ථානවල නිවෙසට පැමිණෙන්නන්ගේ සිත් පිනවීම පිණිස යනුවෙන් සිතා ලස්සන, විවිධ මාදිලියේ නොමුස්ලිම්වරුන්ගේ පින්තූර ද, අනෙකුත් සතුන් පක්ෂීන් වැනි පණ ඇති ඒවායේ පින්තූරද සහ රුව තබා හෝ බිත්තියේ එල්ලා හෝ ශාලාව මැද හෝ තබා සරසා තිබීම සාමාන්‍ය සිරිතක් බවට පත්ව ඇත. لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة මේවා ඉස්ලාම් දහම තහනම් කළ දඬුවම් ලැබිය හැකි ක්‍රියාවන් වේ. එසේම තම නිවෙස්වල ශාලවෙ සහ විසිත්ත කාමරවල එල්ලා ඇති සමහරුන්ගේ පින්තූර ගැන විමසූ කළ ඒවා ඔවුන් සිහිකිරීම පිණිස නැති නම් ස්මාරකයක් පිණිස බවත්, ඔවුන් ඒවා වන්දනාමාන කරන්නේ හෝ එයට සාෂ්ඨාංග කරන්නේ හෝ ගරුබුහු මන් කරන්නේ හෝ නැති බවත් පවසති.

මෙසේ පින්තූරු තැබීමෙන් ඒ වායෙන් බිය බැත්තන්ගේ සහ ආගමික නායකයින්ගේ වැනි සමහරක් ගෞරවයට සහ සම්භාවනයට පත්වනු අප අනව දැක ඇත්තෙමු. එවැනි තවත් සමහර ඒවා පෙර සිදුවුනු සිදුවීම් ගැන සිහිකර දුකක් ඇති කරන්නේය. තවත් සමහර පින්තූර පුහු පාරම්පරික ආඩම්බරයක් සහ උදම්මානයක් ඇති කරන්නට තරම් සමාාන ඒවාය. එහෙයින් එසේ පින්තූරු නිවෙස් තුල තබා ගැනීමෙන් ඇතිවිය හැකි දුර්විපාකය ගැන වටහා ගෙන අනිවාර්යයෙන්ම එවැනි ක්රියාවලින් ඉවත් විය යුතුය. لا توجد ترجمة لا توجد ترجمة එසේම අපගේ අධ්යාපන, අනෙකුත් කියවන පොත්පත්වල සහ සඟරාවල සහ තමාට උවමනා හැඳුනුම් පත් සහ ගමන් බලපත්ර වැනි දේ හැරෙන්නට අනෙක් පින්තූරු විනාශ කර දැමිය යුතුය. මේ විස්තර අනුව අප හැකි නාක් අයුරින් අල්ලාහ් දෙවිඳුට බිය

බැතියන් ලෙස කටයුතු කිරීමට වග බලා ගත යුතුව ඇත. අල්ලාහ්ට බියවන ලෙස අල්කුර ආනය මෙසේ විස්තර කරයි : لا توجد ترجمة

فاتقوا الله ما استطعتم

ඔබට හැකි පමණින් අල්ලාහ්ට බිය බැතිමත් වන්න (අල් කුර්ආන් 64 : 16)

## නුදුටු සිහින ගැන බොරුකීම

වත්මනයේ බොහෝ දෙනෙකු මිනිසුන් අතර ප්‍රසිද්ධියට පත්වීමට හෝ මිනිසුන් තමාට අවධානයෙන් ඇහුම් කන් දීමට හෝ තවත් සමහරුන් ලෞකික උවමනාවන් සිතේ තබාගෙන හෝ නොවන්නට තම සතුරා බිය ගැන්වීමට හෝ තමා නොදුටු සිහිනයන් ගැන මවා පවසන අප අනන්තව අසා ඇත්තෙමු. لا توجد ترجمة لا توجد ترجمة නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් මෙසේ වදාළහ.

إن من أعظم الفرى أن يدعي الرجل إلى غير أبيه أو يري عينه ما لم تَرَ، ويقول على رسول الله صلى الله عليه وسلم ما لم يقل

'අවලාදයන් හී නපුරුම් අවලාදය යමෙකු, තම පියා නොවන්නා පියා යනුවෙන් පැවසීමද, තමා නුදුටු දෙයක් දුටු බව පැවසීම ද, වක්තෘ මුහම්මද් නොකී දෙයක් ගැන පැවසීමද ූ' (බුහාරි). නබි (සල්) තුමාණන් වදාළහ.

من تحلَّم بحلمٍ لم يرَه كُلِّف أن يعقد بين شعيرتين ولن يفعل .. الحديث

තවත් වරෙක මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ: ' තමා නුදුටු සිහිනයක් ගැන බොරුවට පවසන්නේ කවරෙක්ද, ඔහුට ධාන්‍ය ඇට දෙකක් දී ඒ දෙක එකට අමුනා ගැට ගසන්නට අණ කරනු ඇත. නමුදු එය ඔහු කිසිවිටෙක කළ නොහැකිය'. (මූලාශ්රය බුහාරි) මෙසේ සම්බන්ධ නැති දෙයක් සහ නොදුටු තමා ගැන සිහිනයක් වනු ලබනු ඇත. පවසන්නාට නිසැකවම දඬුවම් පමුණුවනු ලබනු ඇත.

# සොහොන් පිටිවල මල පහ කිරීම මිනි වල මත වාඩිවීම සහ පෑගීම

අබූ හුරයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහුඅලෛයිහි වසල්ලම්) මෙසේ පැවසූහ.

لأن يجلس أحدكم على جمرة فتحرق ثيابه فتخلص إلى جلده خير له من أن يجلس على قبر

සුසාන භූමි වලට ගරු කළ යුතු ආකාරය ගැන වක්තෘ මුහම්මද් නබි තුමා‘ඔබගෙන් කෙනෙකු කබ්ර (මිනිවල) මත වාඩි වීමට වඩා ගිනි අඟුරක් මත වාඩිවී එය ඔහුගේ ඇඳුම දවා ඔහුගේ හමට දැනීම අගයනේය' (මුස්ලිම්) අද විනයහීන බොහෝ දෙනෙකු දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ මිනිවල පාගති. සමහරුන් ඔවුන්ගේ නෑයන්ගේ මිනි භූමදානය කරන විට හෝ වෙනත් උවමනාවක් පිණිස හෝ සමහර විට පාවහන් නැතිවද සමහරවිට පාවහන්

ඇතිවද අසල වන මිනී වල වල්ට ගෞරවය නොකර ඒවා පාගනු හෝ ඒවා මත පසුවනු හෝ ඒවා උඩින් පැනගෙන යෑම හෝ අප බොහෝ විට දැක ඇත්තෙමු. එහි විපාකය ගැන මුහම්මද් නබි තුමා අනතුරු ඇඟවූ ආකාරය ගැන උක්බා බින් ආමීර තුමා මෙසේ විස්තර කරති:

لأن أمشي على جمرة أو سيف أو أخصف نعلي برجلي أحب إلي من أن أمشي على قبر مسلم

'මුස්ලිම්වරයෙකුගේ මිනීවල මත ඇවිදීම, ගිනි අඟුරක් මත හෝ නොවන්නට කඩුවක මුවන් පැත්ත මත ඇවිදීම හෝ පාවහනක් පය හා තබා මැසීම හෝ මට ප්‍රිය ගෙනදෙන්නේය' (මූලාශ්‍රය : ඉබ්නුමාජා). සිද්ධිය මෙසේ දරුණු ලෙස වෙද්දී සුසාන භූමියෙහි වෙළඳ කටයුතු සඳහා ගොඩනැගිලි සහ වැසිකිළි කැසිකිළි සහසුකම් සහිත නිවාස ඉදිකිරීම වැනි අනෙකුත් දේවල භාර ගෙන කරන්නන් ඒවා කෙසේ කරන්නද? තවත් සමහරු නම් ශරීරකෘත

උවමනාවක් පිරිමසා ගැනීමට උවමනා වූ කළ අසල මිනි පිට්ටනයකට ගොස් මිනිවල මත හෝ එහි අසල හෝ තම උවමනාවන් සපුරා ගැනීම අප අනන්ත අප්‍රමාණව දැක ඇත්තෙ. එසේ කිරීමෙන් එහි අසුද්ධිය සහ දුගඳ නිසා මිනිවලේ පසුවන්නන්ද අපහසුවකට ක්‍රියාවන් ගැන පත් කරති. මෙවන් නුරුස්නා අවවාද කරමින් මුහමද් නබි තුමා මෙසේ දෙසු බව උක්බා බින් ආමිර් තුමා මෙසේ විස්තර කරයි :

وما أبالي أوسط القبر قضيت حاجتي أو وسط السوق

لا توجد ترجمة لا توجد ترجمة 'එසේ මිනිවල මත මලම්රනා පහ කිරීම, කඩපොල මත මිනිසුන් අතර රහස් අවයවයන් අනුන්ට පෙණෙන අයුරෙන් හෙලිකර මල පහ කිරීම හා සමාන වේ. කුණු කසල මිනි පිටටනිවල උවමනාවෙන් දමන අයද මේ අනතුරු ඇඟවීමට අතුල් වන්නන් බව තරයේ සිතේ තබා ගත යුතුය' (මුලශ්‍රය: ඉබ්නුමාජා), තවද මිනිවලේ පසුවන නම්

නැයන් බැහැදැක ගන්නට ඔවුන් වෙනුවෙන් ප්රාර්ථනා කිරීමට යෑමට උවමනා වූ කල මිනි වලවල් අතරින් යන්නට වූවා නම් අපගේ පාවහන් පලවා ගෞරවණීය අන්දමින් සැම ඉතා හෝද ක්රියාවකි.

## මුත්රා කළ පසු පිරිසිදු නොකිරීම

ඉස්ලාම් දහම මිනිසාගේ එදිනෙදා ජීවිතයට අවශ්ය සියලු කටයුතු වෙනුවෙන් වූ තනි පද්ධතිවලින් සමන්විත සම්පූර්ණ දහමකි. මිනිසා තමාගේ අපවිත්ර සහ මලමුත්රා කෙසේ පිරිසිදු කර ගත යුතුද යන්න පවා ඉස්ලාම් දහම පැහැදිලිව විස්තර කර දිමට අමතක කර නැත. නමුදු අපගෙන් බොහෝ දෙනෙකු මලමුත්රා කිරීමෙන් පසු නිසිලෙස පිරිසිදු කර ගැනීම ගැන මනා දැනුමකින් තොරව හෝ ඉක්මන් කම නිසා හෝ තම ඇඟපසඟ සහ ඇදුමක් පවා අපවිත කර ගනිති. අපවිත්රයන් නිසා නමා පිරිසිදුවෙන් කළ යුතු නැමදුමද කිසිදු

පිනක් නොවන අයුරු නිෂ්ප්‍රභා කර ගනිති. යමෙක එස් මුත්‍රා හරියාකාරව පිරිසිදු නොකරන විට මිනිවලේ සන්තාපය සහ දඬුවමද ලැබෙන බව ඉස්ලාම් දහම තරයේ අවවාද කරයි. ඒ ගැන මුහම්මද් නබි තුමා මෙසේ දෙසූ බව ඉබ්නු අබ්බාස් තුමා විස්තර කරයි: 'දවසක්ද වක්තෘ මුහමද් තුමා මදීනා නගරයේ මිනි පිටියක තාප්පයක් අසලින් ගමන් කරමින් සිටියහ.එවිට මිනිවල දෙකක වේදනාව පමුණුවනු නිසා එහි පසුවන්නන්ගේ විලාපය ඇසි,ඒ ගැන මෙසේ විස්තර කළහ.

يعذبان، وما يعذبان في كبير - ثم قال -: بلى [وفي رواية: وإنه لكبير] كان أحدهما لا يستتر من بوله، وكان الآخر يمشي بالنميمة

'ඔවුන් දෙන්නා විශාල පවක් කළ නිසා වේදනාවට පත් වූවන් නොව. තවත් කියමනක විශාල පවක් නිසා බව සදහන් කර, ඔවුන් ගෙන් කෙනෙකු මුත්‍රා කිරීමෙන් පසු නිසි ලෙස පිරිසිදු නොකළේය. අනෙකා කේලාම් කියමින්

පසුවූ තැනැත්තා වේ' යනුවෙන් මුහම්මද් නබි තුමා පැවසුහ' (මූලාශ්‍රය : බුහාරි). තවද මුහම්මද් තුමා මෙසේ

أكثر عذاب القبر في البول

'මිනිවළේ දෙන වෙදනාවන්හි විශාලම වේදනාව මුත්‍රා සම්බන්ධ වේ. (මූලාශ්‍රය : අහ්මද් ). එහෙයින් නියම ලෙස ආරක්ෂා සහිතව මුත්‍රා පහ කිරීමෙන් උදාසීනව සිටීම, මුත්‍රා කළ පසු එය නිසිලෙස පිරිසිදු නොකිරීම, لا توجد ترجمة මුත්‍රා කරන විට තම දේහයේ සහ ඇඳුමේ විසිවන අයුරු අප්‍රවේශමෙන් කටයුතු කිරීම වැනි සියල්ල විශාල දඬුවම්වලට භාජනය විය හැකි ක්‍රියාවන් වේ. لا توجد ترجمة එසේම සමහර පොදු ස්ථානවල මුත්‍රා කිරීම පිණිස නිසි ආවරණයක් නැතිව භාජනයන් බිත්තියේ සවිකර ඇති අයුරු අප බොහෝ විට දැක ඇත්තෙමු. එවැනි ස්ථානවල තමා මුස්ලිම්වරයෙකු යැයි කියා ගන්නා අපගේ සමහර සහෝදරයින්ද කිසිදු ලැජ්ජාවක්

නැතිව මග යන එන අයට පෙනෙන අයුරු තම ඇඳුම් බුරුල් කරගෙන මුත්රා කිරීම ඉතා කණගාටු දායක සිද්ධියකි. لا تتجه ترجمة තම රහස් අවයවයන් අනුන්ට ප්රදරශනය කිරීමේ වරදටද භාජනය වේ. සමහර විට එසේ තම ශරීරකෘත උවමනාවක් නිම කරද්දි තම ඇඳුම් පවා අපවිත්ර වන අතර

## නුවුවමනා ලෙස අනුන්ගේ කතාවට උනන්දුවෙන් සවන් දීම

අනුන් යමක් කතා කරන විට එය මහුට නොදැනෙන අයුරු හෝ ප්රසිද්ධියේ හෝ ඇහුම් කන් දෙන නරක පුරුද්දක් අපගෙන් බොහෝ දෙනෙකු පුරුද්දක් බවට පත්කරගෙන ඇත. එය පාපයක් බව ඉස්ලාම් දහම අනන්තරු අඟවයි.අනුන්ගේ කතාවන් හට උවමනා සවන් දෙන්නා ගැන අල්ලාහ් අනතුරු ඇඟවමින් අල්කුර ආනයේ මෙසේ විස්තර කරයි :

ولا تجسَّسوا

'ඔබලා හාරා හාරා (අනුන්ගේ) වරද නොසොයව (අල්කුර් ආන් 491 12) තවද නුවවමනා ලෙස ඔවුන්ට නොදැනෙ අන්දමින් අනුන්ගේ කතාවන් හට සවන් දෙන්නට මුහම්ද් නබි තුමා අවවාද කර බව ඔවදන් දුන් බව ඉබ්නු අබ්බාස් මා මෙසේ විස්තර කරයි

من استمع إلى حديث قوم و هم له كارهون صب في أذنيه الآنُك يوم القيامة

යම් පිරිසකගේ කතාවක් ඔවුන් ඔහුට පිළිකුල් කරමින් සිටියදී ඇහුන්කන් දෙන්නට සලස්වන්නේද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔහුගේ දෙකන් තුළට උණු කළ ඊයම් වක් කරනු ලැබේ. (මූලාශ්රය: තබරානි ).

لا توجد ترجمة

එසේම ඔවුන්ට දුදනක් සිදුකරනු පිණිස හෝ කරදරයක් කිරීම පිණිස හෝ ඔවුන් කතා වෙමින් සිටී කරුණ වෙනත් කෙනෙකු හා පවසන්නේ නම් අනුන්ගේ කතාවට සවන් දුන් පවද කේලාම් කී පවද ඔහුට අත්වන්නේය. ඒ ගැන අනතුරු

අඟවමින් මුහම්මද් නබි තුමා මෙසේ විස්තර කළ:

لا يدخل الجنة قتَّات

'කේලාම් කියන්නේ කවරෙක්ද හෙතෙම ස්වර්ගයට නොපිවිසෙන්නේය' (මූලාශ්රය : බුහාරි)

لا توجد ترجمة

## දුදන අසල්වැසියා

මිනිසා සැමටම නම අසල් වැසියා සමග සුහදව කටයුතු කළ යුතු බව ඉස්ලාම් දහම පවසයි. ඒ ගැන කුර ආනය මෙසේ විස්තර කරයි:

وَاعْبُدُواْ اللّهَ وَلاَ تُشْرِكُواْ بِهِ شَيْئًا وَبِالْوَالِدَيْنِ إِحْسَانًا وَبِذِي الْقُرْبَى وَالْيَتَامَى وَالْمَسَاكِينِ وَالْجَارِ ذِي الْقُرْبَى وَالْجَارِ الْجُنُبِ وَالصَّاحِبِ بِالجَنبِ وَابْنِ السَّبِيلِ وَمَا مَلَكَتْ أَيْمَانُكُمْ إِنَّ اللّهَ لاَ يُحِبُّ مَن كَانَ مُخْتَالاً فَخُورًا

' තවද සැබැවින්ම අල්ලාහ් පමණක් නැමදිව. ඔහුට කිසිවකින් සමානයක් නොතබ. දෙමාපියන්ටද, නෑදෑයන්ට ද, අනාථයින්ටද, දිළිඳුන්ටද, අසල්වැසි යන්ටද, අසල්වැසි නොනෑයන්ටද, තවද

මබ සමඟ පසුවන සහකාරයන්ටද, මගියන්ටද, ඔබගේ දකුණු අත් හිමි කර ගත් අයටද, (සතුටෙන් උපකාර කර) යහකම් කරව. අල්ලාහ් අහංකාර පුහුමක්කාරයන් හට ප්රිය නොවන්නේය' (අන් නිසා:36) තවද අසල් වැසියන් හා නොමනා අන්දමින් හැසිරීම ඉස්ලාම් දහම තහනම් කර ඇත. මුහමද් නබි තුමා දිව්රා කී බව අබී සරිහ් තුමා මෙසේ විස්තර කරයි.

والله لا يؤمن، والله لا يؤمن، والله لا يؤمن، قيل: ومن يا رسول الله ؟ قال: الذي لا يأمن جارُه بوائِقَه

අල්ලාහ් මත දිව්රා කියමි. ඔහු විශ්වාස වන්තයකු නොවන්නේය. 'අල්ලාහ් මත 'දිව්රා කියමි. ඔහු විශ්වාස වන්තියෙකු නොවන්නේය. 'අල්ලාහ් මත දිවරා කියමි. මහු විශ්වාස වන්තයෙකු නොවන්නේය' යනුවෙන් මුහම්මද් තුමා තුන් වරක් පැවසූහ. එවිට ' කවරෙක්ද මුහමද් තුමනි?' යනුවෙන් විමසනු ලබනු කල 'තම අසල් වැසියා කාගේ නපුරෙන් බියෙන්

ඉවත් නොවීද ඔහු වන්නේය' යනුවෙන් මුහමද් තමා උත්තර දුන්හ (මූලාශ්‍රය : බුහාරි). කෙනෙකු තම අසල්වැසියා මා ප්‍රශංසා ගැන ප්‍රශංසා කරන්නේද නොවන්නට වෛර කරන්නේද යන්න ගැන දැන ගන්නේ නම් හෙතෙම තම අසල් වැසියා හා කෙසේ සුහදව ආශ්‍රය කරනවාදැයි දැන ගත හැකිය. ඉබ්නු මස්උෆද් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරයි. කෙනෙකු වක්තෘ මුහම්මද් තුමා වෙත පැමිණ මුහම්මද් තුමනි,

يا رسول الله! كيف لي أن أعلم إذا أحسنتُ أو إذا أسأتُ، فقال النبي صلى الله عليه وسلم: إذا سمعتَ جيرانك يقولون: قد أحسنتَ فقد أحسنتَ، وإذا سمعتَهم يقولون: قد أسأتَ فقد أسأتَ

මා උපරකර ඇත්ද නොවන්නට අපකාර කර ඇත්දැයි දැන ගන්නේ කෙසේද? යි විමසුවේය. එවිට මුහම්මද් තුමා 'ඔබගේ අසල් වැසියා ඔබ කළේ උපකාරයකැයි පවසන්නේ නම් ඔබ කළේ උපකාරයකි. නොවන්නට ඔබ කළේ දුදනක් යැයි කීවානම් ඔබ කර ඇත්තේ අපකාරයකි' යි පැවසූහ. (මූලාශ්‍රය : අහ්මද්).

لا توجد ترجمة

එසේම තම අසල්වැසියාට විරුද්ධව තම ගොඩැගිල්ලේ උස්කර බැඳීම, ඔවුන්ට අපහසු වන අයුරු ඉර එළිය සහ හුළං ඔවුන්ගේ අනුමැතියෙන් තොර ඔවුන්ට යැමෙන් වළකීම, කැත අදහසින් තම නිවසේ කවුළුව තුළින් අසල්වැසියාගේ බිරිද සහ අනෙකුත් කාන්තාවන් බැලීම, لا توجد ترجمة විශේෂයෙන්ම ඔවුන් නින්දට යන අවස්ථාවේ ඔවුන්ට හිරිහැර වන අයුරු උස් හඬින් කෑ ගැසීම් لا توجد ترجمة කුණු රොඩු වැනි නොමනා දේ ඔවුන්ගේ මිදුලට හෝ ඔවුන් ගමන් කරන පාරට දැමීම වැනි සියලු ක්රියාවන් තම් අසල්වැසියාට කරන විශාල හිරිහැරයන්ය. නබි තුමාණෝ (එතුමා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදා වේවා!) මෙසේ පැවසූහ.

لأن يزني الرجل بعشر نسوة أيسر عليه من أن يزني بامرأة جاره، لأن يسرق الرجل من عشرة أبيات أيسر عليه من أن يسرق من بيت جاره

'කෙනෙකු තම අසල් වැසියාගේ බිරිද හා දුරාචාරයහි හැසිරෙනවාට වඩා කාන්තාවන් දස දෙනෙකු හා දුරාචාරයෙහි හැසිරීම පහසු දෙයකි.තවද කෙනෙකු තම අසල්වැසියාගේ නිවසේ සොරකම් කරනවාට වටා අනෙක් ගෙවල් දහයක සොරකම් කිරීම පහසුය (මූලාශ්රය : බුහාරි) තවත් සමහරු තම අසල්වැසියන් නිවසින් පිටවන ඔවුන් පිටවුන පසු ඒ නියවස්වලට රිංගා එහි වසන්නන් හට කරදර ඇති වන අයුරු කටයුතු කරති. එහි ඇති දේ ගැන හැකි නම් අවුස්සා විපරම් කර සමහර විට ඒවා සොරකම් කිරීමට ද පසුබට නොවෙති. මෙසේ නොමනා අන්දමින් හැසිරෙන්නන් හට මතු ලොව අල්ලාහ්ගේ ශාපය සහ විශාල දඬුවම්ද සූදානම් කර ඇති බව තරයේ සිතේ තබා ගත යුතුය.

## සේසතේ උරුමක්කාරයින් හට වංචා කිරීම

لا توجد ترجمة තම සේසතෙන් අයවිය යුතු අයට ඔවුන්ගේ කොටස නොදී හෝ එසේ නොවන්නට දහම අනුමත නොකළ අයුරු දී හෝ තම මනාපය පරිදි තුනෙන් කොටසකට වැඩියෙන් දී හෝ අසාධාරණව ක්‍රියා කරන්නාට මුහම්මද් නබි තුමා අවවාදකර මෙසේ දේශනා කළහ.

من ضارَّ أضرَّ الله به ومن شاق شق الله عليه

'මිනිසුන් අතර අයුක්ති සහගතව ක්‍රියා කරන්නේ කවරෙක්ද, අල්ලාහ් ඔහුට අයුක්තියෙන් සළකනු ඇත. මිනිසාට කරදර කරන්නේ කවරෙක්ද අල්ලාහ් ඔහුට කරදර කරනු ඇත (මූලාශ්‍රය : අහ්මද්) لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة එසේම ඉස්ලාම් අනුමත නොකළ අන් සිද්ධාන්තයන්හි සහ වෙනත් නීතීන් අනුව ක්‍රියාවන උසවියන්හි යමෙකු නම් අයිතිවාසිකම් නිසි ලෙස ලබා ගැනීමට

නොහැකිව කරදර වන අප අනන්තට දැක ඇත්තෙමු.

فويلٌ لهم مما كتبت أيديهم، وويلٌ لهم مما يكسبون

එහෙයින් එසේ නොමනා අන්දමින් නීති සම්පාදනය කළ අයට අල්ලාහ්ගේ ශාපය අත්වේවා.

**لا توجد ترجمة**

لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة (මූලාශ්රය : මුස්ලිම්) لا توجد ترجمة

من لعب بالنرد فقد عصى الله ورسوله

لا توجد ترجمة (මූලාශ්රය : අහ්මද්).

**لا توجد ترجمة**

لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة

ومن لعن مؤمنًا فهو كقَتله

لا توجد ترجمة (මූලාශ්රය : බුහාරි). لا توجد ترجمة لا توجد ترجمة لا توجد ترجمة

# අඬා විලාප නැගීම

لا توجد ترجمة සමහර කාන්තාවක් සුළුවෙන් කරදරයක් හෝ තුරුස්නා සිදුවීමක් හෝ දුකක් හෝ ඇති වූ කල විලාප නගා අඬා වැලපීම සාමාන්‍ය සිරිතක් බවට පත් කර ගෙන සිටිති. මුහුණේ ගසා ගනිමින්, ඇඳුම් ඉරා ගනිමින්, කොණ්ඩෙ කඩා ගෙන ගසා විලාප නගමින් අඬා වැලපෙයි. මෙවන් විලාප නැගිම ඉස්ලාම් දහම් තරයේ හෙලා දකී. එය දෙවිඳුන් විසින් මාට නියම විය යුතු දෛවය යනුවෙන් නොපිළිගෙන එසේ විලාප නගන්නන් හට මුහම්මද් නබි තුමා ශාප කළ බව අබූ උමාමා තුමා මෙසේ විස්තර කරයි.

أن رسول الله صلى الله عليه وسلم لعنَ الخامِشَةَ وجهها، والشاقَّة جيبها، والداعيةَ بالويل والثبور

'දුකක් ඇති වූ කල මුහුණ සූරා ගන්නාටද, ඇඳුම් ඉරා ගන්නාටද, විනාශය සහ ශාපය කෙරෙහි ප්‍රාර්ථනා කරන්නාටද වක්තෘ මුහම්මද් තුමා ශාප

කළහ. (මූලාශ්රය : ඉබ්නුමාජා). අබ්දුල්ලාහ් ඉබ්නු මස්උෆද් -රළියල්ලාහු අන්හු- තුමා

ليس منا من لطم الخدود وشق الجيوب ودعا بدعوى الجاهلية

(කෙනෙකුගේ මරණයකදී) කවරෙකු කම්මුල් වලට ගසා ගන්නේද, වස්ත්රවල සාක්කු ඉරා ගන්නේද, ඉස්ලාමයට පෙරවූ (අඥාන යුගයේ ජනයා) මෙන් ප්රාර්ථනා කරන්නේද ඔහු, අප අතර කෙනෙකු නොවේ. (මූලාශ්රය : බුහාරි). නියත වශයෙන්ම නබිවරයාණන් (එතුමා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදාවේවා) එතුමාණන් මෙසේ පැවසූහ

النائحة إذا لم تتب قبل موتها تقام يوم القيامة وعليها سربال من قطران ودرع من جرب

"තම මරණයට පෙර හෙතෙම පව් සමා අයැදුවෙ නැති නම් එලොව තාර වැනි කළුවලින් නිමවුනු ඇඳුම් වලින්ද, තුවාල වලින් වැගිරෙන සැරව මගින් නිමවුනු උඩු

ඇඳුම්වලින්ද හෙතෙම අන්දවනු ලබනු ඇත' (මූලාශ්‍රය : මුස්ලිම්)

**මුහුණේ ගැසීම සහ සළකුරිණු කිරීම - මුහුණ මිනිස් සිරුරේ වැදගත් අවයවයකි. බොහෝ සෙයින් කෙනෙකුගේ ලස්සන පිහිටා තියන්නේ ඔහුගේ මුහුණේය. එහෙයින් මුහුණේ ගැසීම හෝ මුහුණේ ලකුණු කර විරූපි කිරීම හෝ ඉස්ලාම් දහම කිසි විටෙක අනුමත නොකරයි. තරහක් හෝ කෝන්තියක් හෝ ඇති වූ විට මුහුණට ගැසීම සහ මුහුණේ සළකුණු කිරීම ගැන මුහම්මද් තුමා දෙසූ බව ජාබිර්**

## බින් අබ්දුල්ලාහ් තුමා මෙසේ විස්තර කරයි

ජාබිර් (රළියල්ලාහු අන්හු) දැන්වූ මර්ෆූ හදීසයක්.

نهى رسول الله صلى الله عليه وسلم عن الضرب في الوجه، وعن الوسم في الوجه.

මුහම්මද් තුමා, මුහුණේ ගැසීම සහ එහි සළකුණු තැබීම තහනම් කළහ' (මූලාශ්‍රය: මුස්ලිම්). අද බොහෝ දෙමාපියන් තම ළමයින්ට ද, පාසල් ගුරුවරුන් සිසුන්ට ද, හාම්පුතා සේවකයාද,සමහර විට සැමියා තම බිරිදගේ මුහුණ හරහා පහර දීම සුලභ දෙයක් බවට පත්ව ඇත. මෙසේ කිරීම අල්ලාහ් විසින් ගෞරවයට පත් කර ඇති මිනිසාගේ ප්‍රධාන අයවය වන මුහුණ අවමන් කරන ක්‍රියාවකි. තවද, මුහුණේ ස්වභාවයෙන්ම පිහිටි සමහර හැඟීම්ද මන්ද විරූපී වීමට හැකිය. තවත් සමහරු තම සතුන් පහසුවෙන් හඳුනා ගැනීම පිණිස සතාගේ මුහුණේ සළකුණු යකඩ

කුරුවලින් පුච්චා සළකුණු කරති. එසේ හේතුවක් වූවද සතාගේ මුහුණ සළකුණු කර විරූපි කිරීම ඉස්ලාම් අනුමත නොකරයි. لا توجد ترجمة එසේ සතා හඳුනා ගැනීමට මුහුණේ හැර අන් ස්ථානයක සුළුවෙන් සටහනක් තබා ගත හැකි බව ඉස්ලාම් අනුමත කරයි.

## මුස්ලිම්වරයකු සමඟ දින තුනකට වඩා තරහවීම

ෂයිතාන් විසින් කෙරෙන කුමන්ත්‍රණයක් ලෙසද කිව හැකිය. ඉස්ලාමී අනුමත නොකරන සුලු දේවල්වලට පවා ස මුස්ලිම්වරු එකා අනෙකා සමඟ දීර්ඝ කාලය තුලම හෝ ජීවිතය කාලය තුලම තරහෙන් සහ වෛරයෙන් පසුවෙති. මම උන් එක්ක ජීවිය තියන තුරු කතා කරන්නේ නැහැ, උන්ගේ මල ගමනටවත් මම නැහැ. ඕනත් නැහැ' යනු යනුවෙන් පවා දිවිරති. උන් එන්න ඕනෙත් නැහැ' لا توجد ترجمة තවත් සමහරු එසේ සුළු තරහකට අනෙකා

මග තොට මුණ ගැසුණු විටද නොදැක අයුරෙන් ඉවත බලා ගෙන යති. නැති නම් මග හරිති. තම අනෙකුත් හිතවතුන් සමග පසුවෙනවා නම් මුහු හැර අන් සියලු දෙනා හා අට අත දී සුභපතයි. සුහදව කතා කරයි. මෙය ඉස්ලාම් දහම තරයේ හෙළා දකින අර මුස්ලිම් සමාජය අතර විශාල බෙදීමක් ඇති කිරීමට මෙවන් හැසිරීම ඉස්ලාම් දහම තරයේ හෙළා දකින අතර එයට හිමිවන දඬුවමද විස්තර කරයි. අබූ හුරයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී

لا يحل لمسلم أن يهجر أخاه فوق ثلاث فمن هجر فوق ثلاث فمات دخل النار

'මුස්ලිම් වරයෙකු තම සහෝදර මුස්ලිම්වරයා සමඟ තෙදිනකට වඩා අප මනාප නොවිය යුතුය. එසේ අමනාප වී හෙතෙම මරණයට පත්වන්නේ නම් ඔහු නිරයට පත් වනු ඇත (මූලාශ්රය : අබූදාවුද්) තවද මුහම්මද් නබි තුමා මෙසේ දෙසූ බව අබි කරාස් අල් අස්ලමි තුමා මෙසේ විස්තර කරයි.'

ජීවන කාලය තුලම තම සහෝදරයා හා අමනාපයෙන් පසුවන්නේ කවරෙක්ද හෙතෙතෙමහු ඝාතය කළ තැනැත්තා හා සමාන වන්නේය' (මූලාශ්‍රය : බුහාරි). එසේම, මුස්ලිම් සහෝදරයෙකු සමඟ අමනාපයයන් පසු වන්නා අයැදින පව සමාද අල්ලාහ් අනුමත නොකරන්නේය. තවත් වරෙක මුහම්මද් නබි තුමා දෙසු බව අබී හුරයිරා තුමා මෙසේ පවසයි:

تُعرضُ أعمال الناس في كل جمعة مرتين، يوم الاثنين ويوم الخميس فيغفر لكل عبد مؤمن إلا عبدا بينه وبين أخيه شحناء فيقال: اتركوا أو أركوا (يعني: أخِّروا) هذين حتى يفِيئَا

' සතියේ සෑම කෙනෙකුගේම කටයුත්තන් සෑම සඳුදා සහ බ්‍රහස්පතින්දා ඉදිරිපත් කරනු ලබනු ඇත. තව කෙනෙකු සමග අමනාප යෙන් පසුවන්නාගේ හැර අන් අයගේ පව් සමාවනු ලබන ඇත. ඒ දෙන්නා නම් අව්යාජයන් අත්හැර සුහද වන තුරු ඔවුන් අත්හැර දමන්න යනුවෙන් පවසනු ලබනු ඇත (මූලාශ්‍රය : මුස්ලිම්) තවද

සණ්ඩු දබර කරගත් තැනැත්තා තමා වැරැදි කරු වුවද නිවැරදි කරු වුව ද නම් සතුරා සමඟ ප්‍රියමනාපයක් ඇතිකර ගැනීම පිණිස මුණ ගැසී ඔහුට සලාම් පවසා වසා සාමුහිකව සුභ පැතිය යුතුය. එසේ කිරීමෙන් තමා කිසිවිටෙක නීච තත්ත්වයකට හෝ මිදිකමකට හෝ පත්වනු ඇයි නොසිතන්න. එසේ සුභ පැතුවද ඔහුගේ සතුරා ප්‍රතිඋත්තර දීමට ප්‍රතික්ෂේෂේපරන්නේ නම් මොහුගේ යුතුකම් සම්පුර්ණ වන අතර ප්‍රතික්ෂේප කළ තැනැත්තා වැරදිකාරයා වනු ඇත. මෙයට අනතුරුව අඟවා මුහම්මද් නබි තුමා දෙසු බව අබි අයියුබ් අල් අන්සාරි තුමා මෙසේ පවසයි:

لا يحِلُّ لرجلٍ أن يهجُر أخاه فوق ثلاث ليال يلتقيان فيعرض هذا ويعرض هذا وخيرهما الذي يبدأ بالسلام

'කෙනෙකු තම සහෝදරයා හා තෙදිනකට වැඩි කාලයක් අමනාපයෙන් පසුවන කළ ඔවුන් දෙන්නා මුණ ගැසුනා නම් න මුහුණ ඔහුගෙන් ඉවත නොහැරවිය යුතුය. ඔවුන්ගෙන් මුලින්

සලාම් කියා කතාව ආරබ කරන්නේ කවරෙක්ද, උසස් තැනැත්තා ඔහු වන්නේය' (මූලාශ්‍රය : බුහාරි). නමුදු ආගමික කටයුතු වන නැමදුම් නොකිරීම සහ අනෙක් අකුසල්හි මුරණ්ඩු ලෙස නිරත වී සිටින්නන් හා අමනාපයන් පසුවන්නේ නම්, ඔහු එයින් ඉවත්වී යහමගට පත්වනු ඇතැයි බලාපොරොත්තු වී ඔහු සමග අමනාප විය හැකිය. නොවන්නට ඔහු කිසි දිනෙක යහමග නොපත්වනු ඇත, එසේ අමනාප වීමෙන් හෙතෙම තවතවත් මුරණ්ඩු වනු ඇතැයි දකී නම් ඔහු සමඟ අමනාප නොවිය යුතුය. එසේ ඔහුගේ පාඩුවෙ ඔහුව අත් හැර දැමීමෙන් ඔහු පසු දිනක සුමඟට පත්විය හැකිය. නමුදු එහි විපාකය පහදා දී ඔහු යහමඟට පත්කිරීමට වෙර දැරිය යුතුය. අවසාන වශයෙන් لا توجد ترجمة لا توجد ترجمة තවද අපගේ පව් සමාව කරුණාබර අල්ලාහ් විසින් සකස් කර ඇති උසස් ස්වර්ගයට පිවිසීමට ඒ සර්ව බලධාරි

අල්ලාහ් අප සියලු දෙනාට වරම් ලබා දෙත්වා. කරුණාන්විත අල්ලාහ් දෙව්දු අප ඉවත් විය යුතුය යනුවෙන් දැනුම් දුන් දේවලින් ඉවත් වී, සමහර දේවල්වල සීමාවල්වල සීමාව ඉක්මවීමෙන් වැළකී, අල්ලාහ් දෙවිඳු විසින් පෙන්වා දී ඇති හරාම් හලාල් නිසියාකාර හඳුනාගෙන අල්ලාහ්ට මුළුමනින්ම කීකරුව ක්රියා කිරීමට අධිෂ්ඨාන කර ගත යුතුය. لا توجد ترجمة لا توجد ترجمة ශාන්තිය සහ සමාදානය මුහම්මද් තුමාටත් එතුමාගේ උතු් වූ පවුලේ අයට ු මග ගිය එතුමාගේ කලණ මිතුරන්ටත් සදා අත් වේවා ! සියළු ප්රශංසා ලෝකයන්හි පරමාධිපති වූ අල්ලාහ්ටමය

# පටුන

මිනිසුනේ! මේවායින් ඉවත් වන්න ........................................ 2
පෙරවදන ........................................................................................ 2
වන්දනාමානයන් අනුන්ට පෙනෙන්න නිච්චාවට කිරීම. 44
නිමිති බැලීම අද බොහෝ දෙනෙකු ම කටයුත්තක් වෙනුවෙන්ම නිමිත බලා කටයුතු කිරීමේ පුරුද්දකට පත්ව ඇත. ඇත්තෙන්ම එය ඉස්ලාම් අනුමත නොකළ දෙයකි. ........................................................................................ 47
අල්ලාහ් හැර අන් දේ මත දිවරීම ........................................ 51
කුහකයන් සහ පාපතරයන් සමග වාඩි වීම සහ ඔවුන් ප්‍රිය වීම ........................................................................................ 56
උවමනාවෙන්ම සලාතයේ සන්සුන අත් හැරීම .................. 58
සලාතයේ අධික ලෙස චලනය වීම සහ නොමනා දේ කිරීම ........................................................................................ 63
සලාතයේ ඉමාම් පෙර ම:මූම් පෙරටු වීම ............................ 65
ලූනු සහ සුදුලූණු කෑම ............................................................ 69
දුරාචාරය ........................................................................................ 71
සමලිංක සේවනය ........................................................................ 77
නිදි යහනේ ස්වාමියාගේ වුවමනාවට අකීකරු වන කාන්තාව ........................................................................................ 79
අහේතුකව ස්වාමියාගෙන් දික්කසාද ඉල්ලීම ........................ 81
ළිහාර් නම් සමාන කිරීම ............................................................ 84
ඔසප් සමයේ කායික සංසර්ගය .............................................. 86
භාර්යාවගේ ගුද මාර්ගයේ සංසරගය ...................................... 89
لا توجد ترجمة ........................................................................................ 92
අන්‍ය කාන්තාවන් හා තනිව සිටීම .......................................... 94

අන්‍ය කාන්තාවන්ට අතට අත දීම............................................96
කාන්තාව සුවද විලවුන් තවරාගෙන නිවසින් පිටවීම... 100
කාන්තාව මහ්රම් හෙවත් පිරිමි ආරක්ෂාව නැතිව ගමන් කිරීම ............................................................................... 103
අන් කාන්තාවන් බැලීම ............................................................ 105
නිවස තුල අසභ්‍යත්වය ඇතුල් වීම....................................... 108
තමාට නොඋපන් ළමයා තම ළමයා බව කීම සහ තම පියා, පියා නොවන බව කීම ..................................................................... 110
පොලිය ............................................................................................ 113
වෙළඳ ද්‍රව්‍යයේ පළුද්ද හංගා විකිණීම ............................... 119
වෙළෙඳාම් කිරීමේ කතාබහෙහි ප්‍රෝඩාව ...................... 122
ජුමුආ දිනයේ දෙවැනි ඇමතුමෙන් පසු වෙළදාම .ජුම්ආආදිනයේ ජුම්ආ සලාතය වෙනුවෙන් දේවස්ථානයේ දෙවැනි අදාන් ඇමතුමද කළ පසු එය නොනකා වෙළදාමෙහි නිරත වන්නන් ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :....................................................................... 124
සූරාව .............................................................................................. 127
සොරකම.......................................................................................... 129
පගාව දීම සහ ගැනීම.................................................................. 133
අනුන්ගේ ඉඩම් බලහත්කාරයෙන් බුක්ති විදීම .............. 137
රෙකමදාරු පිණිස නැගි පිළිගැනීම ....................................... 139
කුලී කරුවාන්ගේ වෙථනය පමා කිරීම................................ 143
ළමයින් අතර යුක්තිගරුකව ක්‍රියා කිරීම ........................ 149
නුවුවමනාවෙන් අනුන්ගෙන් මුදලෙන් උදව් පැතීම ........ 153
ආපසු නොගෙවන අයුරින් ණය ගැනීම .............................. 156
අනුමත නොවූ ඒවා අනුභව කිරීම......................................... 160

සුලුවෙන් හෝ මත්ද්‍රව්‍ය පානය කිරීම ඉස්ලාම් තරයේ තහනම් කළ දෙයින් මත් පැනට අයත් වන්නේ අති වැදගත් ස්ථානයකි. ........................................ 162
කැමබීම පිණිස රන්රිදී භාජනය පරිහරනය .................... 168
බොරු සාක්කි කීම ........................................ 171
සංගීතය ........................................ 174
ඕපදූප කීම ........................................ 178
කේලාම් ........................................ 181
අනුන්ගේ නිවෙස් වලට අනවසරයෙන් පිවිසීම පෙර දැනුම් දීමකින් තොරව අනුන්ගේ ගෙවල්වලට අනවසරයෙන් ඇතුල් නොවිය යුතු බව ........................................ 183
තුන්වැන්නා පසුවන කල දෙන්නෙක් අයිනකට වී රහස් දෙඩීම ........................................ 186
ඇස් වටයට පහළින් ඇඳුම් දිගට ඇදීම ........................................ 187
පිරිමින් රත්තරන් පැළඳීම ........................................ 191
කාන්තාව තද, විනිවිදව ඇඟපසඟ පෙනෙන ඇඳුම් ඇදීම ........................................ 193
හවරි පැළඳීම ........................................ 196
පිරිමි කාන්තාව ලෙසද කාන්තාව පිරිමි ලෙසද ඇඳුම් ඇදීම සහ කතාව ........................................ 197
කෙස් කළු කිරීම ........................................ 200
පන ඇති සතුන්ගේ සහ වෙනත් ඒවාගේ රූප ඇදීම..... 202
නුදුටු සිහින ගැන බොරුකීම ........................................ 207
සොහොන් පිටිවල මල පහ කිරීම මිනි වල මත වාඩිවීම සහ පැගීම ........................................ 209
මුත්‍රා කළ පසු පිරිසිදු නොකිරීම ........................................ 212
නුවුවමනා ලෙස අනුන්ගේ කතාවට උනන්දුවෙන් සවන් දීම ........................................ 215

දුදන අසල්වැසියා ........................................................................ 217
සේසතේ උරුමත්කාරයින් හට වංචා කිරීම ...................... 222
لا توجد ترجمة........................................................................... 223
لا توجد ترجمة........................................................................... 223
අඬා විලාප නැගීම ...................................................................... 224
මුහුණේ ගැසිම සහ සළකරිණු කිරීම - මුහුණ මිනිස් සිරුරේ වැදගත් අවයවයකි. බොහෝ සෙයින් කෙනෙකුගේ ලස්සන පිහිටා තියන්නේ ඔහුගේ මුහුණේය. එහෙයින් මුහුණේ ගැසීම හෝ මුහුණේ ලකුණු කර විරූපි කිරීම හෝ ඉස්ලාම් දහම කිසි විටෙක අනුමත නොකරයි. තරහක් හෝ කෙන්තියක් හෝ ඇති වූ විට මුහුණට ගැසීම සහ මුහුණේ සළකුණු කිරීම ගැන මුහම්මද් තුමා දෙසු බව ජාබිර් බින් අබ්දුල්ලාහ් තුමා මෙසේ විස්තර කරයි ........ 226
මුස්ලිම්වරයකු සමඟ දින තුනකට වඩා තරහවීම ......... 228

si2v1.0 - 03/09/2026